# දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

# වාර්ෂික වාර්තාව 2023

## තිරසර සංවර්ධනයෙන් පුබුදමු ගම් දනව්



මෙය දෙහිඕවිට ප්‍රාදේශීය සභාවෙ හි තෙවන ඒකාබද්ධ වාර්ෂික වාර්තාව වන අතර, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා අපගේ කාර්ය සාධනය පිළිබඳ පුළුල් සහ සමබර දැක්මක් සකසයි.

මෙම වාර්තාව මගින් පහත කරුණු ලබා දීම අරමුණු කරයි.

පෙර නොවූ විරූ දේශපාලන, සමාජීය වසරක් සැරිසැරූ ආකාරය පිළිබඳ අවබෝධය සහ ආර්ථීක

අවිනිශ්චිතතාවයන්, අපගේ පාර්ශවකරුවන්ට වටිනාකමක් ලබා දීම සඳහා අපගේ සම්පත් උපාය මාර්ගිකව කළමනාකරණය කිරීම.

2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ කාර්යය සාධනය තක්සේරු කිරීමට අවශ්‍ය මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු වාර්තාව ආවරණය කරයි.

**දෙහිඕවිට ප්‍රාදේශීය සභාව ,**

**දෙහිඕවිට.**

**දුරකතන - 036-2222575**

**ෆැක්ස් - 036-2222575**

**ඊ මේල් - dehiowitaps@yahoo.com**

**වෙබ් අඩවිය - www.dehiowitaps.gov.lk**



# අන්තර්ගතය


| | |
|---|---|
| **සංවිධානයේ තොරතුරු** | 01 |
| ලේකම්තුමියගේ පණිවිඩය | 02 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 03 |
| දෙහිඕවිට ප්‍රාදේශීය සභාව සැකවින් | 04-09 |
| බල ප්‍රදේශය හැඳින්වීම | 10-15 |
| දැක්ම,මෙහෙවර | 16 |
| ආයතනික අගයන් | 17 |
| මහා සභාව | 18-19 |
| සභාවේ ස්ථාවර කමිටු | 20-29 |
| ආයතනික කාර්යයන් | 30-38 |
| ප්‍රතිපත්ති | 39-41 |
| ඇල්මැති පාර්ශවයන් | 42-43 |
| ආයතනික සමාජ වගකීම් | 44-45 |
| පළාත් පාලන ආයතන සඳහා බලපාන ලබන අණ පනත් | 46-47 |
| **ප්‍රගතිය හා අනාගත අපේක්ෂාවන්** | 48 |
| ආයතනික කාර්යයසාධනය | 49-70 |
| සම්බුදු තෙමගුල, පොසොන් කලාපය | 71-73 |
| යහපාලනය | 74-76 |
| සුවිශේෂි ව්‍යාපෘති | 77-79 |
| ශදුඅත විශ්ලේෂණය – SWOT ANALYSIS | 80-81 |
| PEST විශ්ලේෂණය | 82 |
| සුවිශේෂි මං සලකුණු | 83 |
| ප්‍රාදේශීය සභාව පසුගිය වසර කිහිපය තුල අත්පත් කර ජයග්‍රහණ | 84-85 |
| **මූල්‍ය ක්‍රියාකාරීත්වය** | 86 |
| මූල්‍ය සාරාංශය | 87-88 |
| ආදායම් විශ්ලේෂණය | 89-99 |
| වියදම් විශ්ලේෂණය | 100-105 |
| වත්කම් වගකීම් හා හිමිකම් විශ්ලේෂණය | 106-108 |
| අනුපාත විශ්ලේෂණය | 109 |
| ආදායම් අය කිරීමේ ප්‍රගතිය | 110 |
| **ප්‍රධාන කාර්යයසාධක දර්ශක** | 111-124 |
| **තිරසර සංවර්ධන අරමුණු** | 125 |
| ආයතන ව්‍යුහයේ අරමුණ හා ඉලක්ක | 126-127 |
| ආයතනයේ කාර්ය සාධන දර්ශක වල ප්‍රගතිය | 128-129 |
| තිරසර සංවර්ධන අරමුණු | 130-143 |
| තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනිමට සඳහා අපගේ කැපවීම | 144-147 |
| සැළසුම් හා උපාය මාර්ග සංවර්ධනය | 148-150 |
| අනුකූලතා වාර්තාව | 151-157 |
| **මානව සම්පත් පැතිකඩ** | 158 |
| මානව සම්පත් කළමනාකරණ අංශයේ අරමුණු | 159-161 |
| මානව සම්පත විශ්ලේශණය | 162 |
| කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය | 163 |
| **මූල්‍ය වාර්තා** | 164 |
| විගණකාධිපති වාර්තාව | 165-172 |
| මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | 173 |
| මූල්‍ය තත්ව ප්‍රකාශය | 174 |
| ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය | 175 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 176-177 |
| ප්‍රතිපත්ති හා සටහන් | 178-191 |



# සංවිධානයේ තොරතුරු



## ලේකම්තුමියගේ පණිවිඩය



ප්‍රාදේශීය සභා පනත මඟින්, මෙම සභාවට පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා, පවත්නා සම්පත් කාර්යක්ෂමව හා සඵලමත්ව යොදවමින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා, පොදු මංමාවත්, සුභ සාධක සේවා ඇතුළු පහසුකම් ජනතාවගේ සුබ විහරණය, පහසුව සහ සුභසාධනය සම්පාදනය හා ප්‍රවර්ධන කිරීම තුළින් සුවදායි පරිසරයක් සහිත තිරසර සංවර්ධිත ප්‍රදේශයක් බව පත් කිරීම අපගේ අරමුණ වේ. එම අරමුණු සඵල කර ගැනිම සඳහා කටයුතු කිරීම අප සැමගේ වගකීමක් වන අතර ඒ සඳහා අපි විවිධ ක්ෂේත්‍රයන් තුළ දියත් කිරීමට විවිධ යෝජනාවන් හඳුනාගත්තෙමු. ඒවා අතර,දෙහිඕවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ නගර සංවර්ධන සැලැස්ම යටතේ කසළින් තොර පිරිසිදු, සුවදායි පරිසරයක් සහිත සංවර්ධිත නගරයක් ලෙස දෙහිඕවිට නගරය ඔසවා තැබීමට විශේෂ ආර්ථික කටයුත්තක් ලෙස තල්දූව සතිපොළ සහ ආර්ථික මධ්‍යස්ථානය ඉදි කිරීම ,දෙහිඕවිට ජාතික පාසල අසල පිහිටි පැරණි සභා ගොඩනැගිල්ල පිහිටි භූමියේ පෙර පාසලක් හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදි කිරීම හා නැණවත්, ගුණවත්, බුද්ධිමත් ජන සමාජයක් බිහි කිරීමෙහි ලා විද්‍යුත් පුස්තකාලයක් සහ නව පරිගණක ඒකකයක් ස්ථාපිත කිරීම ආදී සංවර්ධන යෝජනාවන් මඟින් පාසල් වියේ පටන් ළමා, තරුණ, වැඩිහිටි, සියලු ජන කොටස් වෙත සෙත සැලසීමට සැලසුම් කර ඇත.දේශීය විදේශීය සංචාරකයන් වැඩි වශයෙන් ගෙන්වා ගැනීම තුලින් ආදායම් උත්පාදනයට නව මංපෙත් විවිර කිරීමේ අරමුණින් කහනාවිට ඇල්ල සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අරමුණු කර ඇත.

සංවර්ධනය උදෙසා බල ප්‍රදේශයේ ජනතාවගේ අදහස් හා දායකත්වය ලබා ගනිමින් විනිවිද භාවයෙන් යුතු පළාත් පාලන සේවයක් ඇති කිරීමත්, පවත්නා සම්පත් කාර්යක්ෂමව හා සඵලමත්ව යොදවමින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා, පොදු මංමාවත්, සුභ සාධක සේවා ඇතුළු පහසුකම් ජනතාවගේ සුබ විහරණය, පහසුව සහ සුභසාධනය සම්පාදනය හා ප්‍රවර්ධන කිරීම තුළින් සුවදායි පරිසරයක් සහිත තිරසර සංවර්ධිත ප්‍රදේශයක් බවට පත් කිරීම මාගේ ඒකායන අරමුණයි.

ලබන්නාවූ 2025 වර්ෂයේ ඔබ සැමට සහ සියළු ලාංකික පුරවැසියන්ට නිදුක් නිරෝගී වාසනාවන්ත නව වසරක් වේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

ඩබ්.ඩී.එස්.පී.වල්පොල
ලේකම් හා
බලතල ,කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ
නිලධාරී,
දෙහිඕවිට ප්‍රාදේශීයසභාව.

## සභාපතිතුමාගේ පණිවිඩය



2023 වසර සඳහා ප්‍රාදේශීය සභා මාර්ග, මංමාවත්, පදික වේදිකා, කාණු පද්ධති ඉදිකිරීම, වැඩි දියුණු කිරීම හා නඩත්තු කිරීම. විශේෂ ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස තල්දුව සතිපොළ සංවර්ධනය කිරීම හා වෙළඳුන්ට සහ ජනතාවට පහසුව සැලසීම.

ප්‍රධාන හා අතුරු මාර්ග වීථි ආලෝකකරණය හා නඩත්තුව.ජනතාවගේ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම හා පානීය ජල යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.සෞඛ්‍ය සම්පන්න ජනතාවක් උදෙසා බෝවන හා බෝ නොවන රෝග වැලැක්වීම සඳහා රෝග නිවාරණ වැඩසටහන් සහ ආයුර්වේද සායන බල ප්‍රදේශය පුරා ක්‍රියාත්මක කිරීම.මාර්ගෝපදේශ පිළිබඳ ජනතාව දැනුවත් කිරීම හා එන්නත්කරණය.

පරිසරය පවිත්‍රතාවය සඳහා වු ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම හා සක්‍රීයව පවත්වාගෙන යාම.කාබනික

පොහොර භාවිතයට හුරුකරවීම හා කාබනික වගාවට යොමුකරවීම.

පෙර පාසල්, පුස්තකාල, විද්‍යුත් පුස්තකාල දියුණු කර පවත්වාගෙන යාමෙන් ගුණ නුවණ වර්ධනයෙන් යුතු යහපත් ළමා පරපුරක් බිහිකිරීමට අත හිත දීම.

දිළිඳු බව පිටු දැකීම සඳහා ස්වයං රැකියා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, කාන්තා අභිවෘද්ධිය සඳහා විවිධ වැඩසටහන් ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම.ආපදා කළමනාකරණ වැඩසටහන් මඟින් බල ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතාවයන් හඳුනාගෙන ඉදිරි කටයුතු සැලසුම් කිරීම.

නගර සංවර්ධන සැලැස්ම යටතේ දෙහිඕවිට පැරණි ප්‍රාදේශීය සභා භූමියේ වෙළඳ සංකීර්ණය ඉදිකිරීම, ළමා උද්‍යානය ඉදිකිරීම, ගුරු ගෙදර දිවා සුරැකුම් මධ්‍යස්ථානය ඇති කිරීම.ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ඇගයීම, සංස්කෘතික උරුමයන් සුරැකීම, හෙළ කලා ශිල්ප ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් දියත් කිරීම සහ කොරෝනා ව්‍යාප්තිය පාලනයට දායක වූ සුවවිරුවන් සහ ප්‍රජාව ඇගයීම ආදිය ඉන් කිහිපයක් වේ.

ලබන්නාවූ 2025 වර්ෂයේ ඔබ සැමට සහ සියළු ලාංකික පුරවැසියන්ට නිදුක් නිරෝගී වාසනාවන්ත නව වසරක් වේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

ඒ. ජී.දමිඳු ශ්‍යාමින්ද,
සභාපති,
දෙහිඕවිට ප්‍රාදේශීය සභාව.

# දෙහිඕවිට ප්‍රාදේශීය සභාව




කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අටුළුගම්, පනාවල්,දෙහිගම්පල් යන තුන් කෝරලයත් පනාවල් කෝරලයේ බටහිර හා නැගෙනහිරත් අටුළුගම් කෝරලයේ බටහිර සහ පහත බුලත්ගම යන ප්‍රදේශයන්ගෙන් සමන්විත වන දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ග්‍රාම සේවා වසම් 39 කින් යුක්ත වේ.

රුවන්වැල්ල හා යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් වෙන් වී රුවන්වැල්ල මැතිවරණ කොට්ඨාශයෙන් ග්‍රාම සේවා වසම් 16 ක් හා දැරණියගල මැතිවරණ කොට්ඨාශයෙන් ග්‍රාම සේවා වසම් 23 ක් එකතු වී සබරගමුව පළාතට අයත් දිස්ත්‍රික්ක දෙකකින් කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අනෙකුත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ අතර විශාලත්වයෙන් හතර වන ස්ථානය ගන්නා අතර එහි මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 18,608.09 කි.මෙම බල ප්‍රදේශයේ ජනගහනය 94,529ක් වන අතර ගම්මාන 146 කින් යුක්ත වේ.

දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පරිපාලන මායිම් ලෙස උතුරින් රුවන්වැල්ල

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට හා යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට ද ,දකුණින් රත්නපුර දිස්ත්‍රික්කයට ද ,බටහිරින් බස්නාහිර පළාත් මායිම හා සබරගමුව පළාත්

මායිමට ද ,නැගෙනහිරින් දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට ද මායිම් වේ.

# දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පොදු සංඛ්‍යා ලේඛණ තොරතුරු

| | |
|---|---|
| පළාත | |
|  | සබරගමුව පළාත |
| පරිපාලන දිස්ත්‍රික්කය | |
|  | කෑගල්ල දිස්ත්‍රික්කය |
| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | |
|  | දෙහිඕවිට |
| ඡන්ද ප්‍රදේශය | |
|  | රුවන්වැල්ල / දැරණියගල |
| බල ප්‍රදේශයේ විශාලත්වය | |
|  | ව.කි 194.82 |



පවුල් සංඛාව
24,308



ස්ත්‍රී
48,982



පුරුෂ
45,547



ලි.ප ඡන්ද සංඛාව
64,862



නිවාස ගණන
23,563



මුළු ජනගහනය
94,529

# දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් සපයන සේවාවන්



**පොදු පරිපාලන කටයුතු හා කාර්ය මණ්ඩල සේවා**

ආයතනයේ සේවය කරන සියළුම නිලධාරින්ගේ වගකීම් භාරය දරමින් කාර්යක්ෂම සේවාවක් සැපයිමට අවශ්‍ය පුහුණුව ලබා දෙමින් මූල්‍ය කටයුතු කළමනාකරණය තුලින් ආයතනයේ ආදායම් ඒකරාශි කිරිම හා අභ්‍යන්තර කටයුතු පාලනය මෙමගින් සිදු වේ.

**කාර්යයන්**

පොදු පරිපාලනය

මූල්‍ය කටයුතු

තක්සේරු කිරිම් හා ආදායම් එකතු කිරිම්

අභ්‍යන්තර විගණනය

කාර්ය මණ්ඩල පුහුණු කිරිම



**සෞඛ්‍ය කටයුතු**

- ජලාපවාහනය
  - මළාපවාහනය සහ කසළ ශෝධනය
  - ආහාර ස්වස්ථතාව
  - මාතෘ දාරක අභිවෘද්ධි කටයුතු
  - ගොඩනැඟිලි, නිවෙස් ආදියෙහි අධික තදබදය හා ජනාකීර්ණ බව නැති කිරීම, අබලන් නිවාස ගොඩනැඟිලි ඉවත් කිරීම, වසංගත රෝග පැතිරීමට පවතින ඉඩකඩ වැළැක්වීම.
  - නිවෙස්වල හා ගොඩනැඟිලිවල ප්‍රමාණාත්මකව සහ නිසි පරිදි සකස් කර ඇති බවට සහ නඩත්තු කරන බවට සෑහීමකට පත්වීම.



**භෞතික සැලසුම් කිරිම,මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි කටයුතු**

- නගර නිර්මාණය ,උද්‍යාන නඩත්තුව හා පාලනය ,ගොඩනැඟිලි සැලසුම් අනුමත කිරීම් පිළිබඳ කටයුතු සිදු කරනු ලබයි.
- ප්‍රදේශීය සභාව සතු ඉඩම්,ගොඩනැඟිලි,නිවාස යෝජනා ක්‍රම,සාප්පු සංකීර්ණ,කඩකාමර,පොදු වෙළදපොළ ආදිය නඩත්තු කිරීම හා සභාව සතු ඉඩම් ,ගොඩනැඟිලි ,නිවාස යෝජනා ක්‍රම,සාප්පු සංකීර්ණ, කඩකාමර, පොදු වෙළදපොළ ආදිය නඩත්තු කිරීම හා ප්‍රාදේශීය සභාව සතු ඉඩම් පාලනය කිරීම, විධිමත් කිරීම හා බදු දීම ආදිය මෙම සේවාවේ කාර්යයන් වේ.



**පොදු උපයෝගීතා සේවා**

ආයතනයේ සේවය කරන සියළුම වීදි,පොදු ස්ථාන සහ පොදු ගොඩනැගිලි විදුලි ආලෝක කිරීම.

මහජනතාවගේ කියවීමේ රුචිය වර්ධනය කර දැනුවත් සමාජයක් බිහි කිරීමේ අරමුණ ඇතිව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පුස්තකාල පිහිටුවා පවත්වාගෙනයාම මෙමගින් සැළසේ.

බල ප්‍රදේශයේ ජනයාගේ අවමංගල්‍ය අවශ්‍යතා සපුරාලීම එනම් මෘත දේහ පුළුස්සා දැමීම සඳහා මෙම සේවාව සළසා ඇත.

ප්‍රදේශයේ ජනයාගේ මෘත දේහ අපහසුතාවයකින් තොරව මිහිදන් කර ගැනීම සඳහා අවශ්‍ය ස්ථාන සකස් කර ලබාදීම මෙමඟින් සැළසේ.



**සුභ සාධන සේවා**

- දරිද්‍රතාවය පිටුදැකීම
- නගර අලංකරණය
- ප්‍රජා සංවර්ධනය
- මාතෘ දාරක අභිවෘද්ධි කටයුතු
- ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා තම ආදායම් මට්ටම ඉහල නංවා ගැනීම සඳහා අවශ්‍ය ස්වයං රැකියා ව්‍යාපෘති ආරම්භ කර පුහුණුව හා අවශ්‍ය මඟ පෙන්වීම මෙහි අරමුණ වේ.
- බල ප්‍රදේශයේ සංවර්ධනය විය යුතු සියළුම අංශ පරමාර්ථ - 17 ඉලක්ක - 169 දර්ශක - 244 ක් තුල සපුරා ගැනීම මඟින් සංවර්ධන ක්‍රියා මාර්ග සැකසීම මෙහි අරමුණ වේ.

## භූ විෂමතාවය

දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට මහ ඔය හා අම්බලම්පිටිය ඔය අතර සීමාව වේ. මෙහි ගිණිකොන දිග ප්‍රදේශය කදුකර ප්‍රදේශයක් වශයෙන් ද හඳුනාගත හැකිය. භූ විෂමතාවය සහ උන්නතාංශය අනුව කොට්ඨාශයේ තැනිතලා ,රැළි බිම් හා කඳුකර ප්‍රදේශ වශයෙන් ප්‍රධාන කලාප තුනක් ඇත. අඩි 500 ට වඩා අඩු තැනිතලා ප්‍රදේශ උතුරු අර්ධයේ පිහිටා ඇති අතර දයිගල, කුරුපැත්ත, නාපාවල, කැළෑගම, ඇපලපිටිය, ඉහළ තල්දූව, පහළ තල්දූව, වෙලංගල්ල, බටංගල, කනංගම, එළුවාන සහ අටුළුගම යන ග්‍රාම නිලධාරී වසම් එයට අයත් වේ.

තෙත් කලාපයට අයත් වන මෙම කොට්ඨාශයේ වැඩි වශයෙන් වර්ෂාව ලැබෙන්නේ නිරිත දිග මෝසම් කාලයට ය. එය මැයි මාසයේ සක්‍රිය වන අතර ගං වතුර තත්වයක් දක්වා වර්ධනය වේ.




කොට්ඨාශයේ අඩුම උස වන්නේ කැළණි ගඟ ආශ්‍රිතව ඇති අඩි 40 ක පමණ වූ ඇපලපිටිය යි. රැළි බිම් ප්‍රදේශය කොට්ඨාශයේ තැනිතලා හා කඳුකර ප්‍රදේශ අතර තැනින් තැන ව්‍යාප්තව පවතී.

කඳුකර ප්‍රදේශය වශයෙන් හඳුනාගත හැක්කේ මහ ඔය හා අම්බලම්පිටිය ඔය අතර සීමාව වේ. මෙම කලාපයට අම්බලම්පිටිය, හිඟුරලකන්ද නැගෙනහිර , හිඟුරලකන්ද බටහිර, පන්නිල සහ එලවුල්ල යන ග්‍රාම නිලධාරී කොට්ඨාශ අයත් වේ. මෙම කොට්ඨාශයේ ඉඹුල්පිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ මුරේකන්ද ගම ආශ්‍රිතව අඩි 1500 ක් වූ ස්ථානය උසම ස්ථානය ලෙස දැක්විය හැක.

කොට්ඨාශයේ ජලවහන රටාව දෙස බැලීමේදී කුඩා ඔය, සීතාවක ඔය දකුණු දෙසින් නැගෙනහිර දෙසට ගලා බසින අතර බස්නාහිරින් උතුරු දෙසට කැළණි ගඟේ අතු ගංගාවක් වන ගැටහැති ඔය ගලා බසියි. උතුරු කොටසේ ඇති කැළණි ගඟේ අතු පද්ධතිය ජාලාකාර ජලවහන රටාවක් සහිත නිසා ගංගා ආශ්‍රිතව ගංවතුර තර්ජන වර්ෂා කාලවලදී ඇතිවන බව දක්නට ලැබේ.

# අපගේ බල ප්‍රදේශය

**බල ප්‍රදේශයට අයත් ග්‍රාම සේවා වසම්**

1.115 - වල්පොල
2 115 ඒ - කහනාවිට
3 115 බී -බොරලංකඩ
4.116 - මාගම්මන
5.116 ඒ- කුරුපැත්ත
6.116 බී- අටුලුගම
7.116 සී -කනංගම
8. 116 ඩී - දෙබෑගම
9.116 ඊ-එළුවාන
10.116 එෆ්- අටුලුගම්වෙල
11. 117-දයිගල
12. 117 ඒ - කැලෑගම
13. 117 බී- නාපාවල
14. 118 - ඇපලපිටිය
15.118 ඒ- ඉහල තල්දුව
16. 118 බී - පහල තල්දුව
17. 118 සී - උඩුවිල
18. 118 ඩී-තිඹිරිපොල
19. 119 - අල්ගොඩ
20.119 ඒ - දික්ඇල්ල
21.119 බී -දෙහිඕවිට
22.120-හිඟුරලකන්ද නැගෙනහිර
23.120ඒ-හිඟුරලකන්ද බටහිර
24.121 -ඉඹුල්පිටිය
25.121 ඒ -පන්නිල
26.121 බී -එලවුල්ල
27.121 සී - ගොඩගම්පල
28.121 ඩී -අම්බලම්පිටිය
29.122 - පනාවල
30.122 ඒ -රංගේගම
31.122 බී - මඩගම්මන
32.122 සී - පුකුණුවල
33.123 - බටංගල
34.124 - මානියම්ගම
35.124 ඒ - බෝමළුව
36.124 බී - විහාරකන්ද
37. 124 සී - ගලබලනකන්ද
38.125 - මාදොල
39.125 ඒ - වෙලංගල්ල

දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය උතුරින් රුවන්වැල්ල ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයට හා යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට ද, දකුණින් රත්නපුර දිස්ත්‍රික්කයට ද , බටහිරින් බස්නාහිර පළාත් මායිම හා සබරගමුව පළාත් මායිමට ද, නැගෙනහිරින් දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට ද මායිම්ව පිහිටා ඇත









# බල ප්‍රදේශය හැඳින්වීම

## පිහිටීම

උතුරින් රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හා යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ද

දකුණින් රත්නපුර දිස්ත්‍රික්කය ද ,

බටහිරින් බස්නාහිර පළාත් මායිම හා සබරගමුව පළාත් මායිම ද ,

නැගෙනහිරින් දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ද,

මායිම් ව දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය පිහිටා තිබේ.

## විශාලත්වය

සබරගමුව පළාතට අයත් දිස්ත්‍රික්ක දෙකකින් කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අතර විශාලත්වයෙන් හතර වන ස්ථානය ගන්නා අතර එහි මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 18,608.09 ක් වේ.

ග්‍රාම නිලධාරී වසම් 39 ක් මෙම කොට්ඨාශයට අයත් වේ.

## ආර්ථික රටාව

පසෙහි සංයුතිය අනුව රෙගෝ පස, අලුවිෂල් පස හා රතු කහ පොඩ් සොලික් යන වර්ගවලට අයත්වේ. මෙම ප්‍රදේශ වැවිලි ආර්ථිකය දක්වා රැගෙන යන්නට මෙම පසෙහි සංයුතියද හේතු වන්නට ඇත.

එමෙන්ම ගල් ශිඛරයන්ගෙන්ද සමන්විත දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මිශ්‍ර ආර්ථික රටාවක් පෙන්නුම් කරයි. වැවිලි බෝග අතර තේ, රබර්, පොල්, වී සහ සුළු අපනයන බෝග වේ. වෙළඳාම, සත්ව පාලනය සහ සුළු කර්මාන්ත වැනි වූ ස්වයං රැකියාවන් ජීවනෝපායන් ලෙස දැක්විය හැකිය.

## අධ්‍යාපනය

දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් පාසල් 62 ක් ඇති අතර එක් ජාතික පාසලක් ද අයත් වේ.

එම පාසල්වල ළමුන් 13,002 ක් ඉගෙනුම ලබන අතර ගුරුවරු 901 ක් දරුවන්ගේ නැණස පෑදීමට දායක වේ.

අනධ්‍යන කාර්යය මණ්ඩලය වශයෙන් 114 ක් සිටින අතර සංවර්ධනය විය යුතු බොහෝ පාසල් බල ප්‍රදේශය තුල දක්නට ලැබෙයි.

## පිහිටීම

උතුරින් රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හා යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ද

දකුණින් රත්නපුර දිස්ත්‍රික්කය ද ,

බටහිරින් බස්නාහිර පළාත් මායිම හා සබරගමුව පළාත් මායිම ද ,

නැගෙනහිරින් දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ද,

මායිම් ව දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය පිහිටා තිබේ.

## විශාලත්වය

සබරගමුව පළාතට අයත් දිස්ත්‍රික්ක දෙකකින් කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අතර විශාලත්වයෙන් හතර වන ස්ථානය ගන්නා අතර එහි මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 18,608.09 ක් වේ.

ග්‍රාම නිලධාරී වසම් 39 ක් මෙම කොට්ඨාශයට අයත් වේ.

## ආර්ථික රටාව

පසෙහි සංයුතිය අනුව රෙගෝ පස, අලුවිෂල් පස හා රතු කහ පොඩ් සොලික් යන වර්ගවලට අයත්වේ. මෙම ප්‍රදේශ වැවිලි ආර්ථිකය දක්වා රැගෙන යන්නට මෙම පසෙහි සංයුතියද හේතු වන්නට ඇත.

එමෙන්ම ගල් ශිඛරයන්ගෙන්ද සමන්විත දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මිශ්‍ර ආර්ථික රටාවක් පෙන්නුම් කරයි. වැවිලි බෝග අතර තේ, රබර්, පොල්, වී සහ සුළු අපනයන බෝග වේ. වෙළදාම, සත්ව පාලනය සහ සුළු කර්මාන්ත වැනි වූ ස්වයං රැකියාවන් ජීවනෝපායන් ලෙස දැක්විය හැකිය.

## අධ්‍යාපනය

දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් පාසල් 62 ක් ඇති අතර එක් ජාතික පාසලක් ද අයත් වේ.

එම පාසල්වල ළමුන් 13,002 ක් ඉගෙනුම ලබන අතර ගුරුවරු 901 ක් දරුවන්ගේ නැණස පෑදීමට දායක වේ.

අනධ්‍යන කාර්යය මණ්ඩලය වශයෙන් 114 ක් සිටින අතර සංවර්ධනය විය යුතු බොහෝ පාසල් බල ප්‍රදේශය තුල දක්නට ලැබෙයි.

## ජන වාර්ගික විවිධත්වය

දෙහිඕවිට බල ප්‍රදේශය තුළ ජීවත්වන ප්‍රජාව අතර සිංහල, ඉන්දියානු දමිළ, ලාංකික දමිළ, මරක්කලි, බර්ගර්, යුරේසියානු සම්භවයෙන් පැවත එන්නන් යන ජන කොට්ඨාශ වාසය කරන අතර ඔවුන්ට ආවේනික වූ ආගමික ඇදහිලි අනුගමනය කරනු ලබයි. ප්‍රධාන ලෙස බෞද්ධාගමික, රෝමානු කතෝලික, ක්‍රිස්තියානි, හින්දු, ඉස්ලාම් සහ අනෙකුත් ආගමික ජනයා ද සහයෝගයෙන් වෙසෙති.

## වර්ෂාපතනය

දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය වර්ෂාපතනය වැඩි අගයක් පෙන්නුම් කරන කොට්ඨාශයකි. සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මි.මී.3500 - 5000 . මධ්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙන්ටිග්‍රේට් අංශක 24 කි.වර්ෂාපතන කලාප 03 ක් හදුනාගත හැකිය. එනම් ,

මි.මී. 3500 - 4000

මි.මී. 4000 - 4500

මි.මී. 4500 - 5000

## සංචාරක කර්මාන්තය

දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල සංචාරක ආකර්ෂණීය හෝටල් සහ නිවාඩු නිකේතන පිහිටා ඇත.

ඒ අතර විශේෂයෙන් සංචාරක කර්මාන්තය හා වැදගත්වන පුරාවිද්‍යාත්මක ස්ථාන බොහොමයක් පිහිටා ඇත.

සීතාවක රජ මාළිගය, තල්දූව බැරැණ්ඩි කෝවිල, ඇපලපිටිය රාජසිංහ සොහොන, මානියංගම රජමහා විහාරය, තිඹිරිපොල රම්පතගල හා පා සළකුණු, තිඹිරිපොල රජ ලෙන, සීතාවක කණාමැදිරියන්වල, ගුරුගල්ල ගොලැබොක්ක ප්‍රදේශය, කුරුපැත්ත හකුරුගල රජ මහා විහාරය, උඩුවිල කඹුරාපොල ගනේවත්ත ලෙන් විහාරය, මානියංගම යකහටුවා කන්ද සහ කොබෝතුරා ගල වැනි ඓතිහාසික ස්ථාන උදාහරණ ලෙස දැක්විය හැකිය.



## සභාව සතු ස්ථාවර වත්කම්



සති පොළ

01



පුස්තකාල

05



වීථි ලාම්පු

2353



බස් නැවතුම් පොළ

01



පොදු ජල කරාම

03




පොදු වෙළඳපොල

02



පෙර පාසල්

01



පොදු ළිං

124



ප්‍රිමික්ස් අංගනය

01



ක්‍රීඩා භූමි

03



හෙළ බොජුන් හල්

01



පොදු වැසිකිළි

02



ආදාහනාගාර රහිත සුසාන භූමි

11



කසළ කළමනාකරණ මධ්‍යස්ථාන

01



ආර්යුවේද බෙහෙත් ශාලා

01



ආදාහනාගාර/ සුසාන භූමි

01




මස් කඩ
06



මාළු කඩ
03



ගව මස් කඩ
03



ඌරු මස් කඩ
01



කැබ් රථ
04



ටිපර් රථ
01



ට්‍රැක්ටර් රථ
04



ගලි බවුසර්
01



ලෙලන තලනය
01



බැකෝ ලෝඩර් රථ
01



යතුරු පැදි
02



ත්‍රී රෝද රථ
01



ජල බවුසර්
02



බොබ් කැට් රථ
01



ඉඩම් ප්‍රමාණය
අක්කර
533



ශ්‍රවණාගාර
01



තාර දැමූ පාරවල්
27.67 Km



කොන්ක්‍රීට් පාරවල්
192.495Km



වෙනත් පාරවල්
534.77Km

# ආයතනික සම්බන්ධතාවය

- මෙහිදී ආයතන හා සහසම්බන්ධතාවය හා ආයතන යටතේ ඇති ආයතනයන්, ආයතනය වෙත වගකීම් පවරන ආයතනයන් දක්වනු ලබයි.

## ආයතනය අයත්වන දෙපාර්තමේන්තුව හෝ අමාත්‍යාංශය

පළාත් පාලන දෙපාර්තුමේන්තුව,

සබරගමුව පළාත් සභාව

## ආයතනය වෙත වගකීම් පවරන ආසන්නතම ආයතනය

සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය, කෑගල්ල

## ආයතනය තුළ ඇති අංශ

ආයතන අංශය

ගිණුම් අංශය

ආදායම් අංශය

සංවර්ධන අංශය

## ආයතනය යටතේ ඇති ආයතන

මාගම්මන ආයුර්වේද බෙහෙත් ශාලාව

ඊරියගොල්ල ආදාහනාගාරය

පනාවල පෙර පාසල

දීගලවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානය

දෙහිඕවිට මහජන පුස්තකාලය

මාගම්මන මහජන පුස්තකාලය

තල්දූව මහජන පුස්තකාලය

පනාවල මහජන පුස්තකාලය

ඉඹුල්පිටිය මහජන පුස්තකාලය

ඊරියගොල්ල හෙලබොජුන් හල

# දැක්ම

"තිරසර සංවර්ධනයෙන් පුබුදමු ගම් දනව්"

# මෙහෙවර

පවත්නා සම්පත් කාර්යක්ෂමව හා සඵලමත්ව යොදවමින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල මහජන සෞඛ්‍ය,පොදු උපයෝගීතා සේවා,පොදු මංමාවත් ඇතුළු පහසුකම් ජනතාවගේ සුබ විහරණය,පහසුව සහ සුබසාධනය සම්පාදන හා ප්‍රවර්ධන කිරීම තුළින් සුවදායි පරිසරයක් සහිත තිරසර සංවර්ධිත ප්‍රදේශයක් බවට පත් කිරීම

# ආයතනික අගයන්

## අවංකභාවය

දෙපාර්ශවය අතර මනා අවබෝධයකින් යුක්ත වීම අවංකභාවය යි.

## සාධාරණත්වය

සැමට පොදු ගුණධර්ම මාලාවක් තුළ ක්‍රියා කිරීම සාධාරණත්වය තුලින් බලාපොරොත්තු වේ.

## වගවීම

එකිනෙකා පෞද්ගලිකව හා සමූහිකව තම ක්‍රියාවන් පිළිබඳ ව බැඳීමකින් ක්‍රියා කිරීම වගවීම තුලින් අපේක්ෂා කරනු ලබයි.

## විශ්වාසනීයත්වය

සැම පාර්ශවයක් අතරම අන්‍යෝන්‍ය වශයෙන් ගොඩනැගෙන්නා වූ අවබෝධය තුල ඇති ශක්තිය යන්නයි.

## නීතිකත්වය

වගකීමට බැදී ඇති අණපනත් ,චක්‍රලේඛ හා විධිවිධානයන්ට දක්වන අවනත බව.

## මනුෂ්‍යත්වය

සියළු දෙනාම තමන්ටම සමාන යැයි සිතීම තුළින් ගොඩනැගෙන්නා වූ බැඳීම මනුෂ්‍යත්වය නම් වේ.

## ප්‍රතිචාරාත්මක බව

වගකීම හා වගවීම තුළ දී මෙන් ම ආයතනයේ ක්‍රියාවලිය පුරාවට ගොඩනැගෙන යහපත් සන්නිවේදනය.

## මධ්‍යස්ථභාවය

එකිනෙකා කෙරෙහි උස්පහත් බවකින් තොරව එකම ආකල්පයක් තුළ පිහිටා ක්‍රියා කිරීමේ ගුණාංගය.

## නිර්මාණශීලිත්වය

එකිනෙකාට වෙනස් වූ අදහස් ඒකරාශී වීම තුළින් යම් අරමුණක් මුදුන් පමුණුවා ගැනිම සඳහා සාමුහිකව යොදාගන්නා මාධ්‍ය නොහොත් කලාවයි.

# මහා සභාව



පළාත් පාලන ආයතනයක ප්‍රධාන ස්ථානයක් ගරු සභාපති ප්‍රමුඛ මන්ත්‍රි මණ්ඩලයෙන් සැදුම්ලත් මහා සභාව වෙත හිමි වේ.වර්ෂ 1991 ට පෙර

අපගේ සභාව පැවති දෙහිඕවිට සුලු නගර සභාව අහෝසි වී 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත ඔස්සේ බිහි කරන ලද ප්‍රාදේශීය සභාව 1991 අප්‍රේල් මාසයේදී දෙහිඕවිට ප්‍රාදේශීය සභාව ලෙසින් ස්ථාපිත කර ඇත.



මුල් කාලයේදී සභිකවරු 19 දෙනෙකුගෙන් සැදුම්ලත් මෙහි මහා සභාව 2018 පළාත් පාලන මැතිවරණයෙන් පසු සභික සංඛාව 34 දක්වා වර්ධනය වී ඇත.

වසර 04 වරක් පැවැත්වෙන පළාත් පාලන ඡන්ද විමසීමෙන් දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වසම් 39 නියෝජනය කරමින් මේ සඳහා තේරී පත් වෙයි.



මාසයකට වරක් ලිත් මාසයේ පළමු සති දෙක තුළ කලින් නියම කරගත් දිනයකදී රැස් වන මහ සභාව මඟින් සංවර්ධන කාර්යන් සඳහා අවශ්‍ය යෝජනා සම්මත කරවා ගැනීම,අතුරු ව්‍යවස්ථා පැනවීම,වියදම් අනුමත කර ගැනීම ආදී කාර්යන් සඳහා අනුමැතිය ලබා දෙනු ලබයි.

# මන්ත්‍රී මණ්ඩලය

### එක්සත් ජාතික පක්ෂය

1. එන්.ජී.අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා
2. කේ.ඩී.ඒ.සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා
3. ඩී.එම්.වික්ටර් බණ්ඩාර මැතිතුමා
4. එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා
5. ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා
6. පී.කේ.නිමල් රාජපක්ෂ මැතිතුමා
7. එන්.වී.සුගත් මාධව මැතිතුමා
8. ජී.රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා
9. ආර්.පී.ශ්‍රියානි ජයකොඩි මැතිණිය

### ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ

1. ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා (ගරු සභාපති)
2. කේ.ඒ.අයි.කන්දෙආරච්චි මැතිතුමා
3. ඩබ්.අබේසේන මැතිතුමා
4. ඩී.එස්.එම්.නිමල් මැතිතුමා
5. යූ.ජී.සරත් විජේසිරි මැතිතුමා
6. එම්.ටී.ආර්.ලක්මාල් සමරරත්න මැතිතුමා
7. පී.ඊ.ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා
8. එච්.අමරාවතී මැතිණිය
9. කේ.ඒ.අතුල ජයසිරි මැතිතුමා
10. යූ.දිස්නා වීරක්කොඩි මැතිණිය
11. ජේ.ඩී.තුෂාර අමරසිරි මැතිතුමා
12. පී.වී.එන්.සඳමාලි විජේරත්න මැතිණිය
13. කේ.විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා
14. යශෝධ පද්මසිරි මැතිතුමා
15. යූ.ආර්.ඒ.සී.කරුණාරත්න

### ශ්‍රී ලංකා නිදහස් පක්ෂය

1. පී.වී.ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා
2. කේ.නිශාන් මැතිතුමා
3. යූ.සුධර්මා ලක්මාලි විජේසේකර මැතිණිය
4. කේ.ඩී.නයනා ප්‍රියන්ති මැතිණිය





### ස්වාධීන පක්ෂ

1. ආර්.ඒ. විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා (ගරු උප සභාපති)

2. ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා

### ජනතා විමුක්ති පෙරමුණ

1. එච්.ඒ.කේ. නුවන් ජයවීර මැතිතුමා

## සභාවේ ස්ථාවර කමිටු

### මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ආදායම් උත්පාදනය, වත්කම් ඇති කිරීම හා ආරක්ෂා කිරීම, මූල්‍ය පරිපාලනය විධිමත් කිරීම, ගෙවීම්වලට අදාල උපදෙස් සැපයීම හා ගෙවීම් අනුමත කිරීම සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හා රුපියල් ලක්ෂ 10 දක්වා වූ වියදම් අනුමත කිරීම.

කමිටු පැවැත්වූ වාර ගණන

04

| | |
|---|---|
| 1. | ගරු සභාපති ඒ.ජී.දමිදු ශ්‍යාමින්ද මැතිතුමා |
| 2. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා |
| 3. | ගරු උප සභාපති විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා |
| 4. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා |
| 5. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස් .අර්සකුලරත්න මැතිතුමා |
| 6. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ජී.එස්. විජේසිරි මැතිතුමා |
| 7. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.සමරරත්න මැතිතුමා |
| 8. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.එම්. ෆර්හාන් මැතිතුමා |
| 9. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා |
| 10. | ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රීනී සුධර්මා ලක්මාලි මැතිණිය |

## කාර්මික සේවා කාරක සභාව

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ඇස්තමේන්තු අනුමත කිරීම, මාර්ග ගැටළු නිරාකරණය, මාර්ග නම් කිරීම්, මාර්ග සංවර්ධන කටයුතු අධීක්ෂණය හා කොන්ත්‍රාත්කරුවන් ගේ ගැටළු නිරාකරණය කිරීම.

කමිටු පැවැත්වූ වාර ගණන

04

| | |
|---|---|
| 1. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා |
| 2. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්. නිමල් මැතිතුමා |
| 3. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා |
| 4. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා |
| 5. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තුෂාර සංජීව මැතිතුමා |
| 6. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා |
| 7. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.කේ.එන්.ජයවීර මැතිතුමා |
| 8. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී. කේ. වීරක්කොඩි මැතිණිය |
| 9. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.නිශාන් මැතිතුමා |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි වයි.ලලංග පද්මසිරි මැතිතුමා |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය |
| 12. | කළමනාකරණ සේවා නිළධාරි එච්.ඒ.රංගන තිලකරත්න මහතා |

## පරිසර හා පොදු පහසුකම් කාරක සභාව

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ මහජන සෞඛ්‍ය, ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය, ආදාහනාගාරය හා පරිසරය සම්බන්ධ කටයුතු විධිමත් කිරීම, පරිපාලනයට අදාල වන්නා වූ උපදෙස් සැපයීම, ගැටළු නිරාකරණය කිරීම, ඊට අනුශංගික කරුණු සම්බන්ධයෙන් සංවර්ධන යෝජනාවන්ට නිර්දේශ සැපයීම.

කමිටු පැවැත්වූ වාර ගණන

02

| | |
|---|---|
| 1. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ශ්‍රියානි ජයකොඩි මැතිණිය |
| 2. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා |
| 3. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.අර්සකුලරත්න මැතිතුමා |
| 4. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී. උදයකුමාර මැතිතුමා |
| 5. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. ශාන්තසිරි මැතිතුමා |
| 6. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.අමරාවතී මැතිණිය |
| 7. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ආර්.ජී.සී.කරුණාරත්න මැතිතුමා |
| 8. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.වී.එන්. සඳමාලි මැතිණිය |
| 9. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ. පියරත්න මැතිතුමා |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නීතා බාලසූරිය මැතිණිය |

## නිවාස සහ ප්‍රාජා සංවර්ධන කාරක සභාව

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ පුස්තකාල, පෙර පාසල්, නිවාස හා ප්‍රජා සංවර්ධන කාර්යන්, අනවසර ඉදි කිරීම්, වීථි ලාම්පු සවි කිරීම ආදී පොදු උපයෝගිතා සේවා සම්බන්ධ කටයුතු විධිමත් කිරීම, ගැටළු නිරාකරණය හා අධීක්ෂණ කාර්යන් ඉටු කිරීම.

කමිටු පැවැත්වූ වාර ගණන

02

| | |
|---|---|
| 1. | ගරු උප සභාපති විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා |
| 2. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා |
| 3. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඊ.එස්. පතිරණ මැතිතුමා |
| 4. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්. සමරරත්න මැතිතුමා |
| 5. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී. උදයකුමාර මැතිතුමා |
| 6. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එස්. නිල්වල මැතිතුමා |
| 7. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා |
| 8. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීන් .එච්.අමරාවතී මැතිණිය |
| 9. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. මාධව මැතිතුමා |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී නීතා බාලසූරිය මැතිණිය |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී කේ.ඩී.එන්.ප්‍රියන්ති මැතිණිය |

# ආපදා කළමනාකරණ කමිටුව

වර්ෂාවෙන්,ජල ගැල්මෙන්, ගින්නෙන්, සාගතයෙන්,හෝ වසංගතයකින් සිදු වන ආපදා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා උපදෙස් ලබා දීම, පහසුකම් සැලසීම, නිර්දේශයන් ඉදිරිපත් කිරීම හා එයට අදාල වන්නාවූ ආනුශංගික කාරණා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම.

කමිටු පැවැත්වූ වාර ගණන

02

| | |
|---|---|
| 1. | ගරු සභාපති ඒ.ජී. දමිදු ශ්‍යාමින්ද මැතිතුමා |
| 2. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා |
| 3. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඊ. ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා |
| 4. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා |
| 5. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.අමරාවතී මැතිණිය |
| 6. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී.ඩී.කේ.වීරක්කොඩි මැතිණිය |
| 7. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී.ඩී.කේ.වීරක්කොඩි මැතිණිය |
| 8. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.සී. කස්තිරගේ මැතිතුමා |
| 9. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.ජී.ඒ.කේ.සුමනදාස මැතිණිය |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.නිශාන් මැතිතුමා |

# ප්‍රසම්පාදන කමිටුව

දෙහිඔවිට ප්‍රාදේශීය සභාවේ වැඩ සැපයුම් සේවා සම්බන්ධයෙන් තීරණ ගැනීමටත්, මිල දී ගැනීම් විකිණීම්, බදු දීම් සම්බන්ධයෙන් අනුමැතිය ලබා දීමටත්, ඉදි කිරීම් සම්බන්ධයෙන් ලියවිලි අනුමත කිරීම උපදෙස් සැපයීම.

කමිටු පැවැත්වූ වාර ගණන

02

| | |
|---|---|
| 1. | ගරු සභාපති ඒ.ජී. දමිදු ශ්‍යාමින්ද මැතිතුමා |
| 2. | ගරු උප සභාපති විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා |
| 3. | ගරු ප්‍රාදේශීය මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා |
| 4. | ගරු ප්‍රාදේශීය මන්ත්‍රී බඩ්.අබේසේන මැතිතුමා |
| 5. | ගරු ප්‍රාදේශීය මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා |
| 6. | ගරු ප්‍රාදේශීය මන්ත්‍රී යූ.ජී.සරත් විජේසිරි මැතිතුමා |
| 7. | ගරු ප්‍රාදේශීය මන්ත්‍රී එම්.එම්.එම්. ෆර්හාන් මැතිතුමා |
| 8. | ගරු ප්‍රාදේශීය මන්ත්‍රී විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා |
| 9. | ගරු ප්‍රාදේශීය මන්ත්‍රිනී සුධර්මා ලක්මාලි මැතිණිය |

# පුස්තකාල උපදේශක කාරක සභාව

දෙහිඕවිට ප්‍රාදේශීය සභාව යටතේ ක්‍රියාත්මක පුස්තකාල වල ක්‍රියාකාරිත්වය අධීක්ෂණය සහ සාමාන්‍ය පරිපාලනය විධිමත් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම.

කමිටු පැවැත්වූ වාර ගණන

04

| | |
|---|---|
| 1. | ගරු සභාපති ඒ.ජී. දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා |
| 2. | ගරු උප සභාපති විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා |
| 3. | ගරු ප්‍රාදේශීය මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා |
| 4. | ගරු ප්‍රාදේශීය මන්ත්‍රී බඩ්.අබේසේන මැතිතුමා |
| 5. | ගරු ප්‍රාදේශීය මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා |
| 6. | ගරු ප්‍රාදේශීය මන්ත්‍රී යූ.ජී.සරත් විජේසිරි මැතිතුමා |
| 7. | ගරු ප්‍රාදේශීය මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා |
| 8. | ගරු ප්‍රාදේශීය මන්ත්‍රී එම්.එම්.එම්. ෆර්හාන් මැතිතුමා |
| 9. | ගරු ප්‍රාදේශීය මන්ත්‍රී විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා |
| 10. | ගරු ප්‍රාදේශීය මන්ත්‍රීනී සුධර්මා ලක්මාලි මැතිණිය |

# විගණන හා කළමනාකරණ කමිටු

ආයතනයේ කාර්යයසාධනය ඉහල නැංවීම තුලින් ආයතනික ඉලක්කගත අරමුණු කාර්යක්ෂමව සහ ඵලදායි ලෙස ඉටුකිරීමට අවශ්‍ය පසුබිම නිර්මාණය, මූල්‍ය කළමනාකරණයේ ස්ථාවරත්වය, අනාගත ආයෝජන ව්‍යාපෘති සංවර්ධනය, ආදායම් උත්පාදන කළමනාකරණය, මහජන සේවා, සුභසාධන සේවා, පොදු උපයෝගිතාව සහ මංමාවත් ඇතුළු යටිතල පහසුකම් සංවර්ධනය, මානව සහ භෞතික සම්පත් ප්‍රශස්ත ලෙස උපයෝගි කර ගැනීම සඳහා වන අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් අගය කිරීම සහ සමාලෝචනය.

කමිටු පැවැත්වූ වාර ගණන - 04

| | |
|---|---|
| 1. | ගරු සභාපති ඒ.ජී. දමිදු ශ්‍යාමින්ද මැතිතුමා |
| 2. | ලේකම් එම්.සී.ඩී.රුක්ෂානි මිය |
| 3. | ආර්.එච්.එම්.එන්.පත්මසිරි මිය |
| 4. | බී.ඩී.ටී.ටී.ප්‍රේමරත්න මිය |
| 5. | එම්.සී.පී කුමාරි මිය |
| 6. | එච්.ඒ.ආර්.එස්.තිලකරත්න මයා |
| 7. | කේ.ජී.කේ.තිලකරත්න මෙය |
| 8. | ආර්.ඒ.යූ.එන්.රණසිංහ මයා |
| 9. | ඒ.එම්.කේ.කේ.අත්තනායක මිය |

2023.03.19 දිනෙන් ගරු නගරාධිපතිවරයාගේ/සභාපතිවරයාගේ සහ නියෝජ්‍ය නගරාධිපතිවරයා/උපසභාපතිවරයා ඇතුළු ධූරධාරීන්ගේ ධූර කාලය අවසන් වූ සබරගමුව පළාතේ පළාත් පාලන ආයතනවල කටයුතු පවත්වාගෙන යාම සඳහා 2023.03.20 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත නිලධාරීන්ගෙන් සමන්විත " ප්‍රතිපත්ති හා තීරණ ගැනීමට සහායවීමේ කමිටුව" පිහිටුවන ලදී. ලේකම්වරයා විසින් මෙම කමිටු සාමාජිකයින් පත් කල යුතු අතර පළාත් පාලන කොමසාරිස්ගේ නියෝජිතයෙකු මෙම කමිටුවට නිරීක්ෂකයෙකු ලෙස සහභාගී කරවා ගත යුතුවේ.

1. එච්.ඒ.ආර්.එස්.තිලකරත්න මයා-කළමනාකරණ සේවා නිලධාරි

2. ආර්.ඒ.යූ.එන්.රණසිංහ මයා - කාර්මික නිලධාරි

3. ඊ.ඒ.යූ.එම්.එදිරිසිංහ මිය - සංවර්ධන නිලධාරි

4. ආර්.එච්.එම්.එන්.පත්මසිරි මිය -කළමනාකරණ සේවා නිලධාරි

5. කේ.ජී.කේ.තිලකරත්න මෙය- සංවර්ධන නිලධාරි

**ප්‍රතිපත්ති හා තීරණ ගැනීමට සහය වීමේ කමිටුවේ නිර්දේශය මත පමණක් සභාව විසින් ඉටුකළ යුතු යැයි නියම කර ඇති කාර්ය කර්තව්‍යය තීරණය කිරීම හා වියදම් අනුමත කිරීම ලේකම්වරයා විසින් සිදු කල යුතුය.**




## ප්‍රසම්පාදන කමිටු

ප්‍රසම්පාදනය යනු සමාගමකට තම දෛනික ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා ලබා ගැනීමට අවශ්‍ය සෑම ක්‍රියාකාරකමක්ම ඇතුළත් වන අතර, මූලාශ්‍ර ලබා ගැනීම, කොන්දේසි සාකච්ඡා කිරීම" භාණ්ඩ මිලදී ගැනීම, අවශ්‍ය පරිදි භාණ්ඩ ලබා ගැනීම සහ පරීක්ෂා කිරීම සහ ක්‍රියාවලියේ සියලුම පියවරයන් පිළිබඳ වාර්තා තබා ගැනීම ඇතුළු ක්‍රියාවල

2023.03.19 දිනෙන් ගරු නගරාධිපතිවරයාගේ/සභාපතිවරයාගේ සහ නියෝජ්‍ය නගරාධිපතිවරයා/උපසභාපතිවරයා ඇතුළු ධූරධාරින්ගේ ධුර කාලය අවසන් වූ පසු ප්‍රසම්පාදන කමිටුව පහත නිලධාරින්ගෙන් සමන්විත විය.

| | |
|---|---|
| 1. | එම්.ඩී.සී.රුක්ෂානි මිය - ලේකම් |
| 2. | එච්.ඒ.ආර්.එස්.තිලකරත්න මයා - කළමනාකරණ සේවා නිලධාරි |
| 3. | ආර්.ජී.එස්.එස්.වික්‍රමආරච්චි මිය - කාර්මික නිලධාරි |
| 4. | එස්.එන්.ඩී.එම්.කුමාරි - සංවර්ධන නිලධාරි |

## ආයතනික කාර්යයන්

### පොදු පරිපාලනය

01. චංචල හා නිශ්චල දේපළ, වත්කම් සහ බැරකම් ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීම.

02. එම ඉඩම්වල පරිපාලනය යනාදිය සතු කරනු ලබන ආකාරය පිළිබඳ කාර්යයන්.

03. ප්‍රාදේශීය සභාව සතු කරන ලද සෙසු දේපළවල පරිපාලනය පිළිබඳ කාර්යයන්.

04. මුදල් ( බදු/කඩ කුලී /ගාස්තු)

කාර්යයන් ඉටුකරලීම හා ක්‍රියාත්මක කරලීම සඳහා පනවනු ලබන ප්‍රතිපත්ති හා තීරණ නිසියාකාරව අප්‍රමාදව හා අර්ථවත්ව ඉටුකරනු ලබන බවට තහවුරු කිරීමක් අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව ,

01.මාසික සභා රැස්වීම පැවැත්වීම.

* පළාත් පාලන ආයතනයක ප්‍රධානතම කර්තව්‍ය ලෙස නීතියෙන් දක්වා ඇත්තේ සෑම පළාත් පාලන ආයතනයක්ම යටත් පිරිසෙන් මසකට එක් සාමාන්‍ය සභා රැස්වීමක් පැවැත්විය යුතු බවත්

* පළාත් පාලන ආයතනයවල සියළුම කාර්යයන් සභා තීරණයක් මත සිදු කිරීමටත්

* පළාත් පාලන ආයතනය විසින් තීරණය කරනු ලැබිය යුතු බවට ප්‍රධාන නීති මඟින් හෝ අතුරු ව්‍යවස්ථා මඟින් බලය පවරා ඇති සියලුම ප්‍රශ්න හා කරුණු සාමාන්‍ය සභා රැස්වීමකට පැමිණ සිටින සභිකයින් බහුතරයක් විසින් තීරණය කරනු ලැබිය යුතු බවත් පළාත් පාලන ආයතනයකට අවශ්‍ය ද්‍රව්‍ය, උපකරණ, සේවා ආදී සෑමදෙයක්ම සපයා ගැනීමටත් සේවා සම්පාදනයටත් සභා තීරණයක් මඟින් බලය ලබා ගැනීම අත්‍යාවශ්‍ය වේ.










## 02. පළාත් පාලන ආයතනයක දෙවන ප්‍රමුඛ කාර්යය අතුරු ව්‍යවස්ථා පැනවීමයි.

අතුරු ව්‍යවස්ථා පැනවීම මඟින් මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කරුණු විධිමත් කිරීම,අධීක්ෂණය කිරීම,පරීක්ෂා කිරීම හෝ පාලනය කිරීම කරනු ලබයි.

මේ අනුව,

01.සභා රැස්වීම් හා කාරක සභා රැස්වීම් සම්බන්ධ අතුරු ව්‍යවස්ථා

02.මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථා

03.මංමාවත්වලට අදාල ක්‍රියාකාරකම් පාලනය , නියාමනය,අධීක්ෂණය ,සීමා කිරීම හෝ වැලැක්වීමට අදාල අතුරු ව්‍යවස්ථා

04.පොදු උපයෝගිතා සේවාවලට අදාල අතුරු ව්‍යවස්ථා, ජලසම්පාදනය,, වීථි අලංකරණය, වෙළඳ පොළවල් සහ තානායම් ආදිය

05.ප්‍රධාන නීති යටතේ ජලාපවාහනය,මළාපවාහනය,කසලශෝධනය, පොදු සෞඛ්‍ය පහසුකම් පාලනය කිරීම හා කළමනාකරණ කිරීම සහ තවත් කරතව්‍ය රාශියක් සඳහා අතුරු ව්‍යවස්ථා සම්පාදනය කළ හැකිය.
















## 03.මූල්‍ය හා සේවා සම්පාදනය සම්බන්ධ පැවරී ඇති කාර්යයන්.



එහිදී,

01.වසරකට මාසික රැස්වීම් 12 ක් පැවැත්විය යුතු වීම.

02.කාර්යාලයක් පවත්වාගෙන යාම,පෙත්සම් ලබා ගැනීම සඳහා පෙට්ටියක් තැබීම,පෙත්සම් විභාගකර බලා ඒ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග ලේඛන ගත කිරීම.



03.පොදු වීථි සහ එළිමහන් භූමි පවිත්‍ර කිරීම, පෞද්ගලික වීථි නිසි පරිදි නඩත්තු කිරීමට බල කිරීම,මහජන සෞඛ්‍ය , සුභ සාධනය හා සුඛ විහරණය,ප්‍රදේශයේ දියුණුව ,සනීපාරක්ෂාව හා පහසුකම් ප්‍රවර්ධනය කිරීම.

04.පොදු කාණු, බෝක්කු සහ ජල මාර්ග පිරිසිදු කිරීම , නඩත්තු කිරීම.

05.අඩිපාරවල් සහ වීථි අතුගා කසල එකතු කර ඉවත් කිරීම.



06.සෞඛ්‍යාරක්ෂක පරිදි කසල බැහැර කිරීම.

07.කරදර නතර කිරීම.

08.පරිසර දූෂණය සම්බන්ධයෙන් නීති කෘත්‍ය හෝ විත්තිවාචක ඉදිරිපත් කිරීම.

09. ප්‍රාදේශීය සභා අරමුදලක් පිහිටුවීම.



10.සභාවට ලැබෙන සියලු මුදල් අනුමත බැංකු ගිණුමක තැන්පත් කිරීම.

11.මුදල් වර්ෂයේ අවසන් මාසයේ දී අයවැය අවසන් වරට සලකා බැලීම.

12.ටෙන්ඩර්, මිල කියුම් කැඳවීම සහ ගිවිසුම් ලිඛිතව තබා ගැනීම.

යන කාර්යයන් පළාත් පාලන ආයතනයක් විසින් සිදු කරනු ලබන මූල්‍ය හා සේවා සම්පාදනය සම්බන්ධ පැවරී ඇති කාර්යයන් අතර වේ.

## 04.තක්සේරු කිරීම හා ආදායම් එකතු කිරීම.




පළාත් පාලන නීතිමය විධිවිධාන අනුව ප්‍රාදේශීය සභා ආදායම් අප්‍රමාදව හා ක්‍රමවත්ව එකතුකර ගැනිම සඳහා ගන්නා වූ සෑම පියවරක්ම ගැනීමට ක්‍රියාකරනු ලබන අතර ඒ පිළිබඳ ලිපි ලේඛන පවත්වාගෙන යාම හා සභාවට ආදායම් වැඩි කර ගන්නා මාර්ගයන් සැකසීම සඳහා නීති සම්පාදනය කිරීම වෙනුවෙන් ක්‍රියා කිරීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.




## 05.අභ්‍යන්තර විගණනය

පළාත් පාලන ආයතනයේ අභ්‍යන්තර විගණනයේ කාර්යය නම් බදු ගෙවන්නන් සහ සභාව වෙනුවෙන් පරිපාලනයේ සෑම මසකම සෑම අංශයක්ම පිරික්සිම හා විමර්ශනයට භාජනය කිරීමයි.



## 06.කාර්ය මණ්ඩල පුහුණු කිරීම.



උසස් නිළධාරියාගේ සිට පහල කම්කරුවා දක්වා සේවය කරනු ලබන සියළුම සේවකයින් සඳහා තම රාජකාරී කටයුතු නිසියාකාරව ක්‍රමවත්ව සහ කාර්යාක්ෂමව ඉටුකිරීම සඳහා අවශ්‍ය නිසි මග පෙන්විම හා දැනුවත්වීම අත්‍යාවශ්‍ය වේ.ඒ අනුව ගුණාත්මක ,කාර්යාක්ෂම සේවාවක් සැපයීම සඳහා කාර්ය මණ්ඩල පුහුණු ඇති කිරීම මෙහි අරමුණ වේ.



## සෞඛ්‍ය සේවා

### 01.ජලාපවාහනය



කාණු ,ජලය බැස යාමේ ක්‍රම ඇති කිරීම,පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම.

### 02.වැසිකිළි



නිවෙස්වල හා ගොඩනැගිලිවල ප්‍රමාණාත්මකව සහ නිසි පරිදි සකස් කර ඇති බවට සහ නඩත්තු කරන බවට සෑහීමකට පත්වීම.

### 03.මළාපවාහනය සහ කසළ  සෝධනය



නගර පවිත්‍ර කිරීම,මංමාවත් සහ නිවෙස්වල කසල එකතු කිරීම හා බැහැරලීම,ඊට සුදුසු ස්ථාන හා වැඩපිළිවෙලවල් යෙදිම,මළ ඉවත් කිරීම හා ඒ සඳහා සෞඛ්‍යාරක්ෂක විධිවිධාන යෙදීම.

### 04.සෞඛ්‍යට අහිතකර ගොඩනැගිලි



ගොඩනැගිලි, නිවෙස් ආදියෙහි අධික තදබදය හා ජනාකීර්ණ බව නැති කිරීම, අබලන් නිවාස ගොඩනැගිලි ඉවත් කිරීම, වසංගත රෝග පැතිරීමට පවතින ඉඩකඩ වැළැක්විම,ක්‍රම ඇති කිරීම,පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම.

### 05.පීඩා නැති  කිරීම



ශබ්දය,දුම,දූවිලි,දුර්ගන්ධය නිසා ඇතිවන පීඩා වැළැක්වීම,කර්මාන්ත අපද්‍රව්‍ය මගින් ඇතිවන පරිසර දූෂණය හා පීඩා නැති කිරීම.

### 06.ආහාර ස්වස්ථතාව



ආහාරපාන නිෂ්පාදනය, ඇසුරුම් කිරීම,බෙදා හැරීම,ප්‍රදර්ශනය කිරීම, පරිභෝජනය

කරන ස්ථාන පරීක්ෂා කිරීම, ඒවායේ සෑම කටයුත්තක්ම විධිමත් කිරීම හා පාලනය කිරීම.

### 07.මාතෘ දාරක අභිවෘද්ධි කටයුතු



මාතෘ හා ළමා සෞඛ්‍ය සායන හ සෞඛ්‍ය ආරක්ෂණ කටයුතු,ප්‍රතිශක්තීකරණ

කටයුතු හා ආයුර්වේද ප්‍රතිකාර සේවා පවත්වා ගෙන යාම.

# භෞතික සැළසුම්



## 01.භෞතික සැළසුම්

නගර නිර්මාණය ,උද්‍යාන නඩත්තුව හා පාලනය ,ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම් පිළිබඳ කටයුතු සිදු කරනු ලබයි.



## 02.මංමාවත්

ප්‍රධාන මංමාවත් නොවන ප්‍රාදේශීය සභාව සතු සියලු මංමාවත් සහ මාර්ග නඩත්තු කිරීම හා වැඩි දියුණු කිරීම,නව මංමාවත් ඉදි කිරීම හා අලුත් වැඩියා කිරීම,මංමාවත් ඔස්සේ සිදු කරන ඉදිකිරීම් හා ගොඩනැගිලි විධිමත් කිරීම හා පාලනය කිරීම,ගොඩනැගිලි සීමා හා වීථි රේඛා සළකුණු කිරීම,මංමාවත්වලට ආලෝකය සැපයීම,මංමාවත්වල පීඩා වැළැක්වීම,මංමාවත්වල බාධක ඉවත් කිරීම,මංමාවත්වලට සිදුවන හානි වැළැක්වීම යන කාර්යයන් සිදු කරනු ලබයි.





## 03.ඉඩම් හා ගොඩනැගිලි

ප්‍රදේශීය සභාව සතු ඉඩම්,ගොඩනැගිලි,නිවාස යෝජනා ක්‍රම,සාප්පු සංකීර්ණ,කඩකාමර,පොදු වෙළඳපොළ ආදිය නඩත්තු කිරීම හා සභාව සතු ඉඩම් ,ගොඩනැගිලි ,නිවාස යෝජනා ක්‍රම,සාප්පු සංකීර්ණ, කඩකාමර, පොදු වෙළදපොළ ආදිය නඩත්තු කිරීම හා ප්‍රාදේශීය සභාව සතු ඉඩම් පාලනය කිරීම, විධිමත් කිරීම හා බදු දීම ආදිය මෙම සේවාවේ කාර්යයන් වේ.

## පොදු උපයෝගිතා සේවා

### 01.වීදි,පොදු ස්ථාන සහ පොදු ගොඩනැගිලි විදුලි ආලෝක කිරීම.



මෙම සේවාව මඟින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටා ඇති සෑම විදුලි කණුවකම විදුලි බුබුළු සවි කිරීම හා නිමිත වෙලාවට දැල්වීම සහ නිවා දැමීමත් ඒවා නඩත්තු කිරීමත් අවශ්‍ය නව ස්ථාන සඳහා විදුලි බුබුළු සවිකිරීම යන කාර්යයන් ඉටු කිරීම.

### 02.වෙළඳපලවල්



පාරිභෝගිකයන් හා වෙළඳ ප්‍රජාව අතර පැහැදිලි සම්බන්ධතාවයක් පවත්වාගෙන යාමෙන් පාරිභෝගිකයාට අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය පහසුවෙන් මිලදී ගැනීම හා සෞඛ්‍යාරක්ෂිතව සැපයීමට හැකිවන අයුරින් එකී සම්බන්ධතාවය ගොඩනැගීම ප්‍රධාන පරමාර්ථය වේ.තවද මෙම පොදු වෙළඳපොළවල් තුළින් ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධනයක් ඇති කිරීම හා  සභා අරමුදල් ශක්තිමත් කිරීම.



### 03.පුස්තකාල සේවා

මහජනතාවගේ කියවීමේ රුචිය වර්ධනය කර දැනුවත් සමාජයක් බිහි කිරීමේ අරමුණ ඇතිව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පුස්තකාල පිහිටුවා පවත්වාගෙනයාම මෙමගින් සැළසේ.




### 04.ආදාහනාගාර සේවා

බල ප්‍රදේශයේ ජනයාගේ අවමංගල්‍ය අවශ්‍යතා සපුරාලීම එනම් මෘත දේහ පුළුස්සා දැමීම  සඳහා මෙම සේවාව සළසා ඇත.

### 05.සුසාන භුමි හා මිනී පිටි

ප්‍රදේශයේ ජනයාගේ මෘත දේහ අපහසුතාවයකින් තොරව මිහිදන් කර ගැනීම සඳහා අවශ්‍ය ස්ථාන සකස් කර ලබාදීම මෙමගින් සැළ

## සුභ සාධක සේවා

### 01.දරිද්‍රතාවය පිටුදැකීම



බල ප්‍රදේශයේ වෙසෙන දිළිඳු පවුල් සඳහා තම ජීවිකාව උසස් මට්ටමකට ගෙන ඒම සඳහා තම ආර්ථික මට්ටම ගොඩනගා ගැනීමට අවශ්‍ය වෘත්තීය පුහුණු අවශ්‍යතා,මාර්ගෝපදේශ හා වෙළඳපොළ හඳුන්වාදීම තුලින් නැති බැරි පවුල් ඇති හැකි පවුල් බවට පත්කර දරිද්‍රතාවය පිටුදැකීම මෙමඟින් ඉටු කෙරේ.



### 02.නගර අලංකරණය

ජනාකීර්ණ ප්‍රදේශ තුල පවත්නා අපිරිසිදු වාතාශ්‍රය සමනය කිරීම,බෝවන රෝග පැතිරීම වැලැක්වීම,නගරයේ ජනනය වන කසල පාලනය කිරීම හා ක්‍රමවත් බැහැරලීමකට ජනයා යොමු කරවීම සහ අලංකාර සෞඛ්‍යාරක්ෂිත පරිසරයක් ඇති කිරීම මෙහි අරමුණ වේ.



### 3.ප්‍රාථමික අධ්‍යාපනය

පූර්ව ළමාවිය සංවර්ධනය සඳහා තම දරුවන් යොමු කර ගත නොහැකි ජනතාව සඳහා තම දරුවන්ගේ ප්‍රාථමික අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීම සඳහා පෙර පාසල් පිහිටුවා පවත්වාගෙන යනු ලබයි.

### 04.ප්‍රජා සංවර්ධනය



ප්‍රදේශයේ ජනතාවගේ ගැටළු විසඳීම හා ප්‍රජාවගේ දියුණුව ,පහසුව සඳහා ක්‍රියාත්මක වීම සඳහා පවත්වාගෙන යනු ලබන්නකි.

## 05.ආපදා කළමණාකරණය




බල ප්‍රදේශයේ ආපදා තත්වයන් හිදී ආපදා අවම කර ගැනීම හා ආපදාවන්ට ලක්වූවන් සඳහා කඩිනමින් සහන සැළසීම, මුදා ගැනීම් සහ සඳහා සේවා සැපයීම සඳහා සකස් වූවකි.



## 06.තිරසර සංවර්ධනය

බල ප්‍රදේශයේ සංවර්ධනය විය යුතු සියළුම අංශ පරමාර්ථ - 17 ඉලක්ක - 169 දර්ශක - 244ක් තුල සපුරා ගැනීම මගින් සංවර්ධන ක්‍රියා මාර්ග සැකසීම මෙහි අරමුණ වේ.

## 07.ස්වයං රැකියා ව්‍යාපෘති



ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා තම ආදායම් මට්ටම ඉහල නංවා ගැනීම සඳහා අවශ්‍ය ස්වයං රැකියා ව්‍යාපෘති ආරම්භ කර පුහුණුව හා අවශ්‍ය මග පෙන්වීම ලබාදීම මෙහි අරමුණ



# ප්‍රතිපත්ති




**ආයතනය තුල ක්‍රමානුකූල බවින් හා ප්‍රතිපත්ති ගරුක ලෙස මහජනයා වෙත සේවය සැපයීම අරමුණු කරගනිමින් බැඳෙන ප්‍රතිපත්තීන් ආයතනික ප්‍රතිපත්ති වේ.**



**ඝණ අපද්‍රව්‍ය එකතු කිරීම හා කළමනාකරණය කිරීම පරිසර හිතකාමී අයුරින් හා නියාමන අවශ්‍යතා අනුව කටයුතු කිරීම පාරිසරික ප්‍රතිපත්තිය වේ.**

## ආයතනික ප්‍රතිපත්ති

### 01. පොදු මංමාවත් නඩත්තු කිරීම



පොදු මංමාවත් සංවර්ධනය හා නඩත්තුව, අනවසර ඉදිකිරීම් සම්බන්ධව ක්‍රියාකිරීම, කාණු පද්ධති, පදික වේදිකා ඉදිකිරීම හා නඩත්තුව, මංමාවත් වලට හානි පැමිණවීම
සම්බන්ධව ක්‍රියා කිරීම, පීඩා අවම කිරීම, සහ විශේෂ කාර්යයන් සඳහා මංමාවත් යොදා ගැනීම සම්බන්ධ නීති අණපනත් රෙගුලාසි අනුව කටයුතු කිරීම.

### 02.සන අපද්‍රව්‍ය කළමනාකරණය




පරිසර පවිත්‍රතාවය සඳහා වු සන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම හා සක්‍රීයව පවත්වාගෙන යාම, කසල කළමනාකරණය, දිළිඳුකම පිටුදැකීම සඳහා වගා කටයුතු වලට යොමු කරවීම හා රසායනික පොහොර වෙනුවට හරිත සහ කාබනික පොහොර භාවිතයට හුරු කරවීම.

## 03.භෞතික සැලසුම්, පරිසර කළමනාකරණය හා ආරක්ෂණය

ඉඩම් කට්ටි කිරීම සඳහා අනුමැතිය, විථීරේඛා හා නොපවරාගැනීමේ සහතික නිකුත් කිරීම, පිඹුරු සැලසුම්, ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම, නගර සංවර්ධන සැලසුම් සකස් කිරීම, සංවර්ධන යෝජනාවන් ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමුඛතම

ආයතනය වශයෙන් කටයුතු කිරීම සහ පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, පරිසර කළමනාකරණය හා පරිසර ආරක්ෂණයට අදාළ කටයුතු සිදු කිරීම.




## 04.මහජන සෞඛ්‍ය

මහජන සෞඛ්‍ය සම්බන්ධයෙන් වන පොදු වැසිකිලි පහසුකම් නංවාලීම, මලාපවාහනය හා කසළ ශෝධනය විධිමත්ව කළමනාකරණය, මහජන සෞඛ්‍යයට අහිතකර ගොඩනැගිලි සහ පීඩාවන් පරීක්ෂා කිරීම හා පාලනය කිරීම සඳහා ක්‍රියා කිරීම,පරිසර පවිත්‍රතාව, විෂබීජහරණය, සෞඛ්‍ය අධ්‍යාපනය, ළමා හා මාතෘ සුභසාධනය,ආයුර්වේද සායන, බෝවන හා බෝනොවන රෝග නිවාරණ වැඩසටහන් මගින් මහජන හිතසුව පිණිස සුවදායි සෞඛ්‍ය සම්පන්න වටපිටාවක් ගොඩනැගිම සඳහා කටයුතු කිරීම.



## 05.පොදුඋපයෝගීතාසේවා

දෙහිඕවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල විථි ආලෝකකරණය, සුසාන භුමි නඩත්තුව, ආදාහනාගාර සේවා ආදි පොදු උපයෝගිතා සේවා නංවාලීම..



## පාරිසරික ප්‍රතිපත්ති

### 01.අඛණ්ඩ වැඩිදියුණු කිරීම




විවිධ පාර්ශවකරුවන් හා සංවිධාන සමඟ සම්බන්ධීකරණය, සහභාගීත්වය හා අධ්‍යාපනය තුළින් අංශයන් හි උත්සාහයන් වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම.

### 02.මූලෝපායික චින්තනය




අනාගත අවශ්‍යතා සහ අභියෝගයන් අපේක්ෂා කරන අතරම අපගේ වර්තමාන අවශ්‍යතා සහ අභියෝග ජය ගැනීම සඳහා තිරසාරත්වය ප්‍රවර්ධනය කරන ව්‍යාපෘති, වැඩසටහන් හා ක්‍රියාවලීන් සඳහා කැපවීම.

### 04.සාමූහික කටයුතු



දැක්ම හා ක්‍රියාකාරිත්වය සාක්ෂාත් කර ගැනීම අරමුණු කරගත් කාර්ය මණ්ඩලයට, අපගේ ප්‍රජාව, කොන්ත්‍රාත්කරුවන් හා පාර්ශවකරුවන් සමඟ ඒකාබද්ධතාව සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම.

### 05.අධ්‍යාපනය



තිරසාරත්වය, පාරිසරික වගකීම, ප්‍රතිචක්‍රීකරණය සහ නිසි කසළ කළමනාකරණය පිළිබඳව අඛණ්ඩව අප හා අපගේ ප්‍රජාව දැනුවත් කිරීම.

# ඇල්මැති පාර්ශවයන්

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ කටයුතු පිළිබඳ ව උනන්දුවක් දක්වන විවිධ පාර්ශව ඇල්මැති පාර්ශව ලෙස හැඳින්වේ මෙම පාර්ශව විවිධ අරමුණු ඉටු කරගැනීම සඳහා සංවිධාන කටයුතු පිළිබඳ ව උනන්දු වේ. පොදු මහජනතාව ලෙස සභාව විසින් ලබා දෙන්නා වූ විවිධ වූ අවස්ථාවන් පිළිබඳව දැඩි උනන්දුවෙන් පසු වෙයි.

## ඇල්මැති පාර්ශවයන්ගේ වැදගත්කම

මොවුන් ආයතනයට සෘණාත්මක හා ධනාත්මක බලපෑම් එක් කරනු ලබන බැවින් මොවුන්ගේ අවශ්‍යතාවයන් පිළිබඳ මනා වූ සැලකිල්ලක් ආයතනය වසින් ලබා දිය යුතු වේ.එතුලින් ආයතනයේ පැවැත්ම තහවුරු කර ගත හැක.ආයතනයේ කාර්යයසාධනය මැනබැලීමේ කරුණක් ලෙසද ඇල්මැති පාර්ශවයන් කෙරෙහි දක්වන සැලකිලිමත් බව වැදගත් වේ.




### බදු ගෙවන ජනතාව

දෙහිඕවිට බල ප්‍රදේශයේ වාසය කරන බදු ගෙවන ජනතාව ඔවුන් විසින් ගෙවනු ලබන බදු මුදල් සඳහා ලබා දෙන ප්‍රතිලාභයන් පිළිබඳ ඇල්මෙන් පසුවෙයි.



### තේරී පත්වන මන්ත්‍රීවරු

ජනතා මනාපයෙන් පත්වන මොවුන් විසින් තම බල ප්‍රදේශයේ උන්නතිය වෙනුවෙන් හා සභාවේ ප්‍රතිපාදනයන් කෙසේ භාවිතා කරනු ලබන්නේද යන්න පිළිබඳ ඇල්මෙන් පසුවෙයි.



### සමිති සංවිධාන හා කමිටු

සුභසාධනය පදනම් කරගනිමින් හා ආර්ථික වශයෙන් ශක්තියක් බලාපොරොත්තුවෙන් සමිති සංවිධාන විසින් ඔවුන්ට ලබාදෙන ආර්ථික ප්‍රතිලාභයන් පිළිබඳ ඇල්මෙන් පසුවෙයි.



### සැපයුම්කරුවන්

මොවුන් විසින් සිදු කරනු ලබන සැපයුම් කාර්යයේ විශ්වසනීයත්වය පිළිබඳ සහතිකයක් අපේක්ෂාවෙන් ආයතනය පිළිබඳ ඇල්මෙන් පසුවෙයි.



### සේවකයන්

ආයතනයේ සේවකයන් විසින් මොවුන්ගේ ආර්ථික ශක්තිය වෙනුවෙන් ආයතනයේ ස්ථාවරත්වය සහ සේවක සුභසාධනය පිළිබඳ තොරතුරු දැන ගැනීම සඳහා ඇල්මෙන් [illegible]



### ව්‍යාපාරික ප්‍රජාව

මොවුන් විසින් සිදු කරනු ලබන ව්‍යාපාරික කටයුත්තේ විශ්වසනීයත්වය පිළිබඳ සහතිකයක් අපේක්ෂාවෙන් ආයතනය පිළිබඳ ඇල්මෙන් පසුවෙයි.




### ජනමාධ්‍යය

මොවුන් විසින් රජයේ ආයතන හා ග්‍රාමීය මට්ටමින් මහජනතාවගේ සුබවිහරණය හා සිදු වන වංචා දූෂණ හෙළිදරව් කිරීම වෙනුවෙන් තොරතුරු දැනගැනීමට [illegible]



### අනෙකුත් ආයතන

තරගකාරීත්වය හා ආයතනික ක්‍රියාවලිය අධ්‍යනය තුලින් ආයතනය සංසන්දනය උදෙසා ඇල්මෙන් පසුවෙයි.



# ආයතනික සමාජ වගකීම්

## පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා මාර්ගෝපදේශ

### විධිමත් පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම

පුරවැසියෙකු විසින් ලද සේවාව පිළිබඳව ඔහුගේ අතෘප්තිමත්භාවය දෙහිඔිවිට ප්‍රාදේශීය සභාවේ ඊට අදාළ දෙපාර්තුමේන්තුව වෙත වාර්තා කිරීමෙන් අනතුරුව, ඒ පිළිබඳ තමා අපේක්ෂා කළ ප්‍රතිචාරය හෝ සහනය නොලැබුණි නම් නැතහොත් ඔහුට ලැබුණු සහනය පිළිබඳව ඔහු සෑහීමකට පත් නොවන්නේ නම් ඉන් අනතුරුව එම පුද්ගලයා දෙහිඔිවිට ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත පැමිණිල්ල ඉදිරිපත් කළ යුතු වේ.

පැමිණිල්ල පිළිබඳ ලේකම් විසින් කාර්යාල වැඩ කරන දින 03 ක් ඇතුළත මෙම පැමිණිල්ල ලද බවට දැනුම්දීමක් කරනු ලැබේ. මෙම ලිපිය තුළින් ඒ පිළිබඳව ඊළඟට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ පැහැදිලි කරනු ලබන අතර, එමඟින් අදාළ පැමිණිල්ල විමර්ශනය කිරීමේ වගකීම පවරනු ලැබ ඇති නිළධාරියා පිළිබඳ සම්බන්ධීකරණ විස්තරද ලබාදෙනු ලැබේ. මෙම නිළධාරියා විසින් අදාළ තොරතුරු අධ්‍යනය කිරීමෙන් පසු හැකිතාක් කඩිනමින් අදාළ ගැටලුව විසඳීමට හෝ වරද නිවැරිදි කිරීමට අවශ්‍ය විධිවිධාන යොදනු ලබන අතර කාර්යාල දින 14 ක් තුළදී ගනු ලැබූ ක්‍රියාමාර්ගය හෝ ඒළඹි තීරණය පිළිබඳව පැමිණිලිකරු වෙත දැනගැනීමට සලස්වනු ලැබේ.

ඒසේ කාර්යාල දින 14 ක් ඇතුළත තීරණයක් ලබාදිය නොහැකි නම් ඒම ගැටළුව විසඳීමට තවදුරටත් අපේක්ෂිත කාලය හා ප්‍රමාදයට හේතුන්ද අදාළ පුද්ගලයාට (පැමිණිලිකරුට) දැනුම් දෙනු ඇත. පැමිණිලිකරු වෙත කරනු ලබන අවසන් දැන්වීමහිලා දැනටමත් ගෙන ඇති ක්‍රියාමාර්ග

හා අදාළ පැමිණිල්ල හේතුකොට ගෙන සභාවේ ක්‍රියාමාර්ග හා වැඩ පිළිවෙලවල් වල කරන ලද වෙනස්කිරීම් පිළිබඳවත් තමා වෙත ලබා දුන් අවසන් තීරණයත් පිළිබඳව තව දුරටත් සතුටට පත් නොවන්නේ නම් ඔහුට අභියාචනා කිරීමට ඇති ඉදිරි වැඩපිළිවෙල කුමක්ද යන්න පිළිබඳව ද වැඩිමනක් තොරතුරු ලේකම් විසින් දැනුම් දෙනු ලැබේ.

## පැමිණිලි සඳහා වූ මාර්ගෝපදේශ

- අපගේ සේවාවන්හි වරදක් හෝ අඩුවක් සිදු වූ විට එය නිවැරිදි කරවීමක් අපේක්ෂාවෙන් පැමිණිලි ඉදිරිපත් කිරීමට ඔබට අයිතියක් ඇත.
- පැමිණිල්ලක් අපක්ෂපාතීව හා ප්‍රමුඛත්වයේ ලා පරීක්ෂා කරවනු ලබන බවට දෙහිඕවිට ප්‍රාදේශීය සභාව ඔබව සහතික වේ.
- ඔබගේ පැමිණිලි සම්බන්ධයෙන් රහස්‍යභාවය ආරක්ෂා කිරීම තහවුරු කරනු ලැබේ.
- ඔබගේ පැමිණිලි අප ආයතනයේ කළමනාකරණය හා සේවා සැපයුම ඉහළ මට්ටමකට නැංවීම ලා අප වෙත ලැබෙන ධනාත්මක ප්‍රතිචාරයක් හා සහයෝගී ක්‍රියාකාරකමක් වශයෙන් සළකනු ලැබේ. එම නිසා මෙම සභාව වෙත ඉදිරිපත කරනු ලබන පැමිණිලි අප ආයතනයට එරෙහි වූ එදිරිවාදිකමක් හෝ වෛරයක් පිරිමැසීමක් ලෙස සළකනු නොලැබේ.






## සේවාදායක පැමිණිලි

පැමිණිල්ලක් සඳහා වූ විසඳුම එකඟ වී ඇති කාල රාමුව තුළ ලබා නොදෙන අවස්ථාවේදී (දින 14 ක් තුළ) හෝ දෙන ලද විසඳුම පැමිණිලිකරුගේ තෘප්තිමත් භාවය සඳහා ප්‍රමාණවත් නොවන විටදී ඔහුට පහත අයුරින් තවදුරටත් අභියාචනා ඉදිරිපත් කළ හැකිය.


ලේකම් - 036-2222575

කාර්යාලය - 036-2222575

ෆැක්ස් - 036-2222575

ඊ මේල් - dehiowitaps@yahoo.com

වෙබ් අඩවිය - www.dehiowita.ps.gov.lk

# පළාත් පාලන ආයතන සඳහා බලපාන ලබන අණ පනත්

## පනත් - ප්‍රාදේශීය සභා

- 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත
- 1993 අංක 34 දරණ ප්‍රාදේශීය සභා සංශෝධන පනත
- 1999 අංක 14 දරණ ප්‍රාදේශීය සභා සංශෝධන පනත
- 2012 අංක 21 දරණ ප්‍රාදේශීය සභා
- 2014 අංක 36 දරණ ප්‍රාදේශීය සභා සංශෝධන පනත
- 2017 අංක 22 දරණ ප්‍රාදේශීය සභා සංශෝධන පනත
- 2018 අංක 30 දරණ ප්‍රාදේශීය සභා සංශෝධන පනත

## අනෙකුත් අණ පනත්

- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- 2012 අංක 21 පළාත් පාලන ආයතන විශේෂ විධිවිධාන පනත
- 1978 අංක 41 නාගරික සංවර්ධන අධිකාරී පනත
- ඉඩම් අත්කර ගැනීමේ පනත
- අර්ථ නිරූපන ආඥාපනත (2 වන අධිකාරිය)
- ප්‍රසිද්ධ රඟ දැක්වීමේ හා සැණකෙළි
- ආඥාපනත (176 වන අධිකාරිය)
- පීඩා ආඥාපනත (230 වන අධිකාරිය)
- සුසාන භූමි හා භූමදාන ආඥාපනත (231 වන අධිකාරිය)
- විනෝද බදු ආඥාපනත (257 වන අධිකාරිය)
- පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 වන අධිකාරිය)
- පළාත් පාලන (පරිපාලන ප්‍රදේශ) ආඥාපනත (265 වන අධිකාරිය)
- නිවාස හා නගර සංවර්ධන අඥාපනත (268 වන අධිකාරිය)

## බඳුකරණ හා තක්සේරුකරණ ආඥාපනත

- 1951 අංක 12 දරණ තානායම් පනත
- 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත
- 1956 අංක 9 දරණ ගස් කපා (පාලනය කිරීමේ) හෙළීම පනත
- 1958 අංක 2 දරණ තේ, රබර් හා පොල් වතු (කැබලි කිරීමේ පාලන) පනත
- 1964 අංක 14 දරණ පළාත් පාලන ආයතන නිවාස පනත
- 1978 අංක 2 දරණ අධිකරණ සංවිධාන පනත
- 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත
- 1994 අංක 19 දරණ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත
- 1989 අංක 14 සංවර්ධන සභා (ඉවත් කිරීමේ) පනත
- 1966 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත
- 2005 අංක 13 දරණ ව්‍යසන කළමනාකරණ පනත
- 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත
- 2017 අංක 19 දරණ ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනත
- 1973 අංක 48 දරණ ජාතික ලේඛනාරක්ෂක පනත
- 1975 අංක 1 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත
- 1975 අංක 17 දරණ සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනත
- 1976 අංක 14 දරණ නිවාඩු වරප්‍රසාද (පුද්ගලික සේවකයින්) පනත

# ප්‍රගතිය හා අනාගත අපේක්ෂාවන්



# ආයතනික කාර්යයසාධනය

1  පරිපාලන හා කාර්ය මණ්ඩල සේවා වැඩසටහන

2  සෞඛ්‍ය සේවා වැඩසටහන

3  භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි වැඩසටහන

4  පොදු උපයෝගිතා සේවා වැඩසටහන

5  සුභසාධක සේවා වැඩසටහන

## පොදු පරිපාලන හා කාර්ය මණ්ඩල සේවා වැඩසටහන යටතේ සිදු කරනු ලබන කාර්යයන් හා අරමුණු

1.දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සේවය කරන සියළු නිලධාරින්ගේ හා සේවකයින්ගේ වගකීම් භාරයත්, ක්‍රියාශීලීත්වයත් මෙන්ම ජනතාවට විශ්වාසනීය කාර්යක්ෂමව හා ඵලදායි සේවයක් සැපයීමත් එහි ස්ථාවර භාවය ආරක්ෂා කිරීම හා පරික්ෂාකාරී ක්‍රියා පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.

2.විධිමත් විමර්ශණශීලී ගිණුම් ක්‍රමයක් පවත්වා ගැනීමට ගිණුම් කටයුතු වල පොදු ක්‍රමවත් භාවය තහවුරු කිරීම.

3.සභාවේ ආදායම් අංශය හා වියදම් අංශයන් කෙරෙහි ප්‍රමාණවත් විමර්ශණශීලි අඛණ්ඩ අවධානය යොමු කිරීම හා ඒ සම්බන්ධව නිරවද්‍ය කාර්යක්ෂම ගිණුම් පටිපාටියක් පවත්වාගෙන යාම. එසේම දෛනික ගණුදෙනු වල, මුදල් පරිපාලන කටයුතු වල අඛණ්ඩව වගකීමක් හා ක්‍රියාත්මක බවක් ඇති කිරීම.

4.දෛනික අවශ්‍යතාවයන් හා දෙපාර්තුමේන්තු පටිපාටි සපුරාලන පරිදි සියළුම මාසික ගිණුම් හා අවසාන ගිණුම් සැකසීම හා අදාල බලධාරීන් වෙත යොමු කිරීම.

5.අභ්‍යන්තර අංශ, බාහිර අංශ, රාජ්‍ය / රාජ්‍ය නොවන ආයතන සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගෙන යාම.

6.පාලනය සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව හා පළාත් කොමසාරිස් කාර්යාලය, පළාත් සභා අමාත්‍යාංශ හා අනෙකුත් අදාල ආයතන වලින් නිකුත් කරන උපදෙස් හා නියමයන් ක්‍රියාත්මක කිරීම.

7.ප්‍රාදේශීය සභා පනත, අතුරු ව්‍යවස්ථා හා වෙනත් නීති රෙගුලාසි ක්‍රියාත්මක කිරීමෙන් ප්‍රාදේශීය සභාවට අය විය යුතු වරිපනම් බදු, අක්කර බදු ඇතුළු මිශ්‍ර ආදායම් කලට වේලාවට එකතු කිරීම.

## පොදු පරිපාලන වැඩසටහන යටතේ ප්‍රධාන සේවාවන් සඳහා යටතේ ප්‍රධාන සේවාවන් සඳහා වියදම්

### ප්‍රධාන සේවාවන් | ප්‍රධාන සේවාවන් සඳහා වියදම්

**වැටුප් හා වේතන**





රු.29,735,994.00

**ගමන් වියදම්**





රු.745,532.40

**සැපයුම් හා උපකරණ**





රු.5,063,935.73

**ප්‍රවාහන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව**





රු.3,701,105.43

**ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා**





රු.3,846,545.86

## ප්‍රධාන සේවාවන්

## ප්‍රධාන සේවාවන් සඳහා වියදම්

**ආධාර මුදල්,දායක මුදල් හා සහනාධාර**






රු.119,075.00

**විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ**





රු.162,496.00

## පුනරාවර්තන වියදමින් පොදු පරිපාලන වැඩසටහන සඳහා වියදම



## සෞඛ්‍ය සේවා වැඩසටහන යටතේ සිදු කරන ප්‍රධාන අරමුණු හා කාර්යයන්

### 1.බල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය නගා සිටුවීම, නගරය පිරිසිදු හා දැකුම්කළු නගරයක් බවට පත් කිරීම.

- වසම් මට්ටමින් ආයතනයේ නිලධාරීන්ගේ මූලිකත්වයෙන් සහ රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් පහත ක්‍රියාත්මක කර ඇත.







ශ්‍රමදාන වැඩසටහන්
15

ඩෙංගු වැඩසටහන් සහ ධූමායන කටයුතු
28

නොදිරන බඳුන් බෙදාදීමේ වැඩසටහන් 05












අත්පත්‍රිකා සහ බැනර් මගින් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්
03

කසල බැහැර කිරීමේ සහ පුවරු සවි කිරීම
20

දෛනිකව නගරය පිරිසිදු කිරීමේ වැඩසටහන (කසළ එකතු කිරීම)

### 2.දිනපතා කසළ එකතු කිරීම හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම.

කසල කළමනාකරණ වැඩසසටහන යටතේ දෛනිකව කසල එකතු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.



### 3.පරිසර හිතකාමී හා සෞඛ්‍ය ආරක්ෂකාරී ලෙස කසළ බැහැරලීම හා ප්‍රතිචක්‍රීකරණය කිරීම.





### 4.1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ පැවරී ඇති බලතල යටතේ පැවරෙන කාර්යයන් ඉටු කිරීම.



**පරිසර දිනයට සමගාමීව පැල සිටුවීමේ වැඩසටහන් 05**



### 5.සෞඛ්‍ය ආරක්ෂිත ආහාර ජනතාවට ලැබෙන බවට සහතික වීම උදෙසා ආහාර වර්ග වල යෝග්‍යතාවය පරීක්ෂා කිරීම.

### 6.රෝග නිවාරණය හා ප්‍රතිකාර සඳහා අවශ්‍ය සේවා පහසුකම් සැපයීම සහ ආරම්භ කිරීම.

- මාගම්මන ආයුර්වේදය හරහා දෛනිකව සේවා සැපයීම සහ ජංගම සායන පැවැත්වීම.





- මාගම්මන ආයුර්වේදය මගින් බෙහෙත් ද්‍රව්‍ය නිෂ්පාදනය සහ ප්‍රතිකාර සඳහා අවශ්‍ය සේවා පහසුකම් සැපයීම.






## 7.රෝග විමර්ෂණ කටයුතු හා සෞඛ්‍ය සංවර්ධන කටයුතු කිරීම හා විෂබීජහරණය.

- බෝ නොවන රෝග වැඩසටහන් සඳහා ජංගම සායන පැවැත්වීම.





## 8.වැසිකිළි පවිත්‍ර කිරීමේ සේවාවක් පවත්වා ගෙන යාම.

- ආයතනය සතුව පවතින පොදු වැසිකිළි පිරිසිදු කිරීමේ කාලසටහනකට අනුව ක්‍රියාත්මක වේ.

## 9.සුසාන භූමි නඩත්තු හා පිරිසිදුව තබා ගැනීම.



# ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය





# ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් ඒකක 5170 තුළින් දළ වශයෙන් ටොන් 8 ක කසළ ප්‍රමාණයක් ජනනය වන අතර ඉන් ඒකක තුන්දහසකට වැඩි ඒකක ප්‍රමාණයක ප්‍රාදේශීය සභා බල සීමාවට අයත් වසම් 10 ක් ආවරණය වන පරිදි දෛනික කාල සටහනකට අනුව දිරන හා නොදිරන වශයෙන් වෙන් කරන ලද කසල රැස් කිරීමේ කටයුතු සිදු කරනු ලබයි. එමෙන්ම තල්දුව නගරයේ බදාදා හා සෙනසුරාදා යන දිනයන්හි පවත්වනු ලබන සති පොළෙහි රැස් වන කසල රැසි කිරීම සඳහා වෙනමම ට්‍රැක්ටර් රථයක් යොදවා ඇත. මෙසේ එකතු කරන්නාවූ සියලුම දිරන නොදිරන කසල කළමනාකරණය කිරීම සඳහා දිගලවත්ත කසල කළමනාකරණ මධ්‍යස්ථානය වෙත රැගෙන යනු ලබයි. දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් කසල රැස් කිරීම සිදු කරනු ලබන්නේ මෙම සභාවටම ආවේණික වූ ක්‍රමවේදයකට අනුවයි.



එනම් මෙම සභාව විසින් දිරන නොදිරන වශයෙන් වර්ගීකරණය නොකරන ලද කසල කිසිදු විටක ට්‍රැක්ටර් රථ වෙත භාර නොගනී. දිරන, නොදිරන ලෙස වර්ග කිරීමට හැකි වන අයුරින් සකසන ලද ටේලර් රථ මේ සඳහා භාවිතා කරනු ලබයි.




රැස් කරනු ලබන සියලුම කසල දිගලවත්ත කසල කළමනාකරණ මධ්‍යස්ථානය වෙත රැගෙන යනු ලබයි. එහිදී දිරන කසල කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොමු කරන අතර, නොදිරන කසල තවදුරටත් වර්ගීකරණය කර (පොලිතින්, ප්ලාස්ටික්, චැළු, වීදුරු, චඩජ, පොල්කටු) වෙන් වෙන් වශයෙන් ගබඩා කරනු ලබයි. එම නොදිරන ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය වල ගබඩා ධාරිතාවය අඩු කිරීම සඳහා බේල් යන්ත්‍රය උපයෝගී කරගෙන බේල් කුට්ටි ලෙස සකසනු ලබයි. මෙම ක්‍රියාවලිය තුළින් අවසන් බැහැරලීමට යොමු කිරීමට නියමිත නොදිරන කසල බේල් කුට්ටි ලෙස සකසා ඉන්සී ආයතනයේ පිරි සැකසුම් ක්‍රියාවලිය සඳහා යැවීමට ගබඩා කරනු ලබයි.

# ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

දිරන හා නොදිරන වශයෙන් කසළ එකතු කිරීම





දිරන කසළ මඟින් කොම්පෝස්ට් නිපදවීමේ ක්‍රියාවලියට යොමු කිරීම

නොදිරන කසළ බේල් කුට්ටි ලෙස සැකසීම





බේල් කුට්ටි ලෙස සැකසූ අවසන් බැහැරලීමට ඉතිරි කසළ ඉන්සි ආයතනයට ලබා දීම.

දිරන කසළ මඟින් සැකසූ කාබනික පොහොර අලෙවි කිරීම



# 2023 වර්ෂයේ දිරන හා නොදිරන කසළ එකතු කිරීම.

| කොට්ඨාශය | පරිශ්‍ර ගණන | කොම්පෝස්ට් පොහොර නිපදවීම සඳහා භාවිතා කළ දිරන කසළ (ටොන්) | ප්‍රතිචක්‍රීකරනය කල හැකි නොදිරන කසළ (ටොන්) | එකතුව (ටොන්) |
|---|---|---|---|---|
| 1 | 1458 | 0.25 | 0.60 | 0.85 |
| 2 | 756 | 0.20 | 0.45 | 0.65 |
| 3 | 723 | 0.20 | 0.45 | 0.65 |
| - | 2050 | 0.35 | 1.00 | 1.35 |
| එකතුව | 4987 | 1.00 | 2.5 | 3.5 |

## 2023 වර්ෂයේ දිරන හා නොදිරන කසළ කළමනාකරණය කිරීමේ ප්‍රගතිය









## ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය මඟින් සැපයෙන සේවාවන්

- බල ප්‍රදේශයේ ප්‍රධාන නගර ආශ්‍රිතව උපරිම ධාරිතාවයෙන් යුක්තව දෛනික කසළ එකතු කිරීම.
- තල්දූව හා දෙහිඕවිට නගරවල වීථි දෛනිකව පිරිසිදු කරීම.
- පාරිසරික පොලීසිය සමඟ නගරය පුරා අක්‍රමවත්ව කසළ බැහැර කරනු ලබන පුද්ගලයින් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීම.

උදා - ගෙවතු වගාවන් සඳහා ඔවුන් යොමු කිරීම හා දෛනිකව බැහැර වන දිරන කසළ වලින් පොහොර නිපදවා එම පොහොර ගෙවතු වගාවන් සඳහා යෙදවීමට ජනතාව දිරිගැන්වීම.

- පාසල් හා ගෘහ මට්ටමේ කාබනික පොහොර භාවිත ආදර්ශ ගෙවතු හා ජීව කොටු ඇති කිරීම.
- කසළ වෙන් කර ලබා නොදෙන පිරිස් සඳහා කසළ බද්දක් පැනවීම.
- කසළ විශාල ප්‍රමාණයක් ලබාදෙන ව්‍යාපාර ආයතන වෙත හා ඉවතලන ගොඩනැගිලි ද්‍රව්‍ය ලබාදෙන ආයතන වෙත බදු පැනවීම.
- දිරන අපද්‍රව්‍ය තුළින් තම ඉඩමේදීම පොහොර නිශ්පාදනයට යොමු කරවීම සහ ඒ සඳහා ප්‍රමාණවත් ඉඩම් නොමැති අයට කොම්පෝස්ට් බඳුන් ලබා දීම.
- කසළ ට්‍රැක්ටර් මඟින් දෛනිකව එකතු කිරීමේදී ජනතාව දැනුවත් කිරීම සඳහා සීනු නාද ක්‍රමයක් පවත්වාගෙන යාම.
- කසළ දෛනිකව එකතු කරනු ලබන ප්‍රදේශවලට අමතරව අනෙකුත් ප්‍රදේශද අවරණය වන පරිදි නොදිරන බඳුන් එකතු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.




- නාගරික ජනතාව හා වෙළඳ ආයතනයන්ගේ දෛනිකව ඉවතලන කසළ අඩු කර ගැනීමට අවශ්‍ය උපදෙස් ඔවුන්ට ලබාදීම හා එමඟින් ඔවුන්ගේ සහභාගීත්වය කසළ කළමනාකරණ කටයුතු සඳහා ලබා ගැනීම.
- දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ කසළ කලමනාකරණ ව්‍යපෘතිය සාරථකව සිදු කර ගෙනයාම සඳහා ප්‍රදේශයේ මහජන අවශ්‍යතා අදහස් පැමිණිළි මත පදනම්ව කසළ කලමනාකරණ සැලැස්ම සකස් කරීම.
- දිරන අපද්‍රව්‍ය භාවිතයෙන් කාබනික පොහොර නිෂ්පාදනය හා අලෙවිය.
- නොදිරන කසළ පුත්තලම ඉන්සි ආයතන මඟින් නොමිලේ ප්‍රවාහනය කරවාගෙන සෞඛ්‍ය ආරක්ෂිතව දහනය කිරීම සිදු කරනු ලබයි. එබැවින් අවසන් බැහැරලීමට ඉතිරිවන මෙම සභාව මඟින් එකතු කරන ලද නොදිරන කසළ බේල් කුට්ටි ලෙස සකස් කරන ලද එම නොදිරන අපද්‍රව්‍ය පුත්තලම ඉන්සි ආයතනයට ලබා දීම.

## 2023 වර්ෂයේදී ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද ව්‍යාපෘති

- දීගලවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානය ආශ්‍රිතව රුක් රෝපණ වැඩසටහන් 05 ක් ක්‍රියාත්මක කිරීම.
- කාබනික පොහොර භාවිතයෙන් කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ වගා කටයුතු සිදු කිරීම.
- කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ සත්ව පාලනය සිදු කිරීම. (ගවයන්, කුකුළන්)
- හලර් යන්ත්‍රය හා බේල් යන්ත්‍රය අළුත්වැඩියා කර කසළ කළමනාකරණ කටයුතු සඳහා යොදා ගැනීම.
- පාසල් දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 03 ක් ක්‍රියාත්මක කිරීම.
- ප්‍රදේශයේ ජනතාව හා ව්‍යාපාරික ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් 04 ක් ක්‍රියාත්මක කිරීම.
- නගර ආශ්‍රිතව ශ්‍රමදාන හා දැනුවත් කිරීමේ වැඩසටහන් 24 ක් බල ප්‍රදේශය ආවරණය වන පරිදි සිදු කිරීම.
- ඝන අපද්‍රව්‍ය වයාපෘතියේ සේවය කරනු ලබන සියළුම නිලධාරීන්ගේ සේවය ඇගයීමේ වැඩසටහන් 02 ක් ක්‍රියාත්මක කිරීම.

- මෙම සභාව මඟින් සිදු කරනු ලබන විධිමත් කසළ කළමනාකරණය සම්බන්ධයෙන් දීගලවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැමිණෙන පළාත් පාලන ආයතන වෙත පුහුණුවීම් ලබා දීම. (යටියන්තොට ප්‍රාදේශීය සභාව, දැරණියගල ප්‍රාදේශීය සභාව හා ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව, මාවනැල්ල, වරකාපොල හා රඹුක්කන, සභාවල විෂය නිලධාරීන් පුහුණුව)



# ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ ඉදිරි සැළසුම්

- ප්‍රතිචක්‍රිකරණය කල හැකි අපිරිසිදු පොලිතින්, පිරිසිදු කර අලවි කරීමේ වැඩසටහන්ක් ආරම්භ කිරීම.එනම් ටැංකි පද්ධතියක් ඉදිකර අපිරිසිදු පොළිතින් සෝදා පිරිසිදු කර අලවි කිරීම.

- ප්‍රතිචක්‍රිකරණය කල හැකි අපද්‍රව්‍ය මිලදී ගැනීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම.මේ තුලින් ඩෙංගු රෝගය මර්ධනයට හා කසළ අවිධිමත් ලෙස බැහැර කිරීම පාලනය.

- වියෝජනයට භාවිතා කළ නොහැකි හා ප්‍රතිචක්‍රීයකරණය කළ නොහැකි කොම්පොස්ට්කරණයෙන් අවසන් ප්‍රතිඵල වන අවශේෂ අපද්‍රව්‍ය සනීපාරක්ෂක කසළ සනීපාරක්ෂක කසළ රැඳවුමක තැන්පත් කිරීම සුදුසු බැවින් ඒ සඳහා දේවාල කන්ද වතුයායෙන් සුදුසු භූමියක් සොයා ගෙන කොම්පොස්ට් පොහොර නිපදවීමට හා අවසන් බැහැරලීම වෙනුවෙන් සනීපාරක්ෂක බිම් පිරවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට මෙම සභාව බලාපොරොත්තු වේ.

- ගලි අපද්‍රව්‍ය කිරීමට සුදුසු ස්ථානයක් සකස් කර ගැනීම.
- කාබනික පොහොර ප්‍රමිතිගත ලෙස නිපදවා ගැනීම හා ඒ සඳහා තත්ව සහතිකයක් ලබා ගැනීම.

- දැනුවත් කිරීම් තුළින් පාසල් දරුවන් හා ජනතාව කසළ කළමනාකරණයට සම්බන්ධ කර ගැනීම තුළින් දෛනිකව එකතු කරනු ලබන අපද්‍රව්‍ය අවම කර ගැනීම.

- දැනට ලංකාවේ බෙහෝමයක් පළාත් පාලන ආයතන මුහුණ දෙන ප්‍රධානම ගැටළුව බවට පත් වී ඇති අවසන් බැහැරලිම සඳහා ස්ථර විසඳුමක් සොයා ගැනීම හා කසළ කලමනාකරණ වැඩසටහන් අතරින් ලංකාවේ පලමු තැනට පත් වීම.



- විද්‍යුත් අපද්‍රව්‍ය (ඈ - ඊඑ) එකතු කර එම අපද්‍රව්‍ය බැහැර කිරීමට සුදුසු ක්‍රමවේදයක් සැකසීම..
- බල ප්‍රදේශයේ කසළ එකතු නොකරන ප්‍රදේශවල කසල රැස් කිරීම ආරම්භ කිරීම
- වාණිජ වටිනාකමක් නොමැති නොදිරන ද්‍රව්‍ය සඳහා තිරසාර විසඳුමක් ලබා දීම.

- පෞද්ගලික අංශයේ සහාය ලබා ගෙන කසළ කලමණාකරණය විදිමත් කිරීම.

- ප්‍රාදේශීය සභාව මගින් වෙන් කරවා ගත් කසළ මිලදී ගැනීමට හා කොම්පොස්ට් පොහොර අලෙවිය සඳහා මධ්‍යස්ථානයක් ඉදිකිරීම. ඒ සඳහා ස්ථානය තෝරා ගැනිමේදි නිතර මහජනයාට ඇස ගැටෙන හා ඉතා පහසුවෙන් ලගා විය හැකි ස්ථානයක් තෝරා ගැනීම.

- දීගලවත්ත කසළ කළමනාකරණ මධ්‍යයස්ථානයෙන් තවදුරටත් ප්‍රතිචක්‍රීකරණය කල නොහැකි ද්‍රව්‍යය දහනය කිරීමට අවශ්‍යය දාහකාගාරයක් ඉදිකිරීම.

- නොදිරන කසළ අවසන් බැහැර කිරීම වෙනුවෙන් සනීපාරක්ෂක බිම් පිරවුමක් ආරම්භ කිරීම.

- 2030 වන විට දෙහිඕවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය කසල වලින් තොර පුරවරයක් බවට පත් කිරීම.



## භෞතික සම්පත් සේවා වැඩසටහනේ ප්‍රධාන අරමුණු හා කාර්යයන්

1.නගර අලංකරණය, සංවර්ධන ව්‍යාපෘති සඳහා සුදුසු පරිදි සැලසුම් කිරීම හා ඒ අනුව ක්‍රියා කිරීම.



නගර අලංකරණ කටයුතු සඳහා පැල සිටුවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.



2.ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සභාව සතු සියළු මංමාවත් පුළුල් කිරීම හා සංවර්ධනය කිරීම, කාණු ඇති කිරීම හා නඩත්තු කිරීම.





3.ප්‍රාදේශීය සභාවට අයත් වීථි පාලම් සැලසුම් කිරීම හා ඉදිකිරීම පුළුල් කිරීම, නඩත්තු කටයුතු කිරීම.







4.ප්‍රාදේශීය සභාව සතු සියළුම ඉඩම් ගොඩනැගිලි වැඩි දියුණු කිරීම හා නඩත්තු කිරීම.

5.1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත, නිවාස හා නගර සංවර්ධන ආඥා පනත (286 අධිකාරිය), 1982 අංක 04 සහ 1984 අංක 44 දරණ පනත්වලින් සංශෝධිත 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනත හා ඒ යටතේ සාදන ලද සැලසුම් අනුමත කිරීමේ කාර්යය සඳහා අදාල නව සැලසුම් හා නියෝග/රෙගුලාසි, 2006 අංක 35 දරණ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා පනත, ඉඩම් අත්පත් කර ගැනීමේ පනත, 1989 අංක 12 දරණ පළාත් සභා ආනුෂාංගික පනතේ 2 (1) වගන්තියෙන් කියවෙන 193 වන අධිකාරය වූ මහා මාර්ග පනත යටතේ බලය පැවරෙන කාර්යයන් ඉටු කිරීම මෙම වැඩසටහනට ඇතුලත් වේ.

## පුනරාවර්තන වියදමින් භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි වැඩසටහන සඳහා වියදම



# දීගලවත්ත ප්‍රිමික්ස් අංගනය



වෙනත් යම් අධිකාරියකට නීතියෙන් පවරන ලද බලතල හා වගකීම්වලට යටත්ව, ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ඇතුළත ප්‍රධාන මංමාවත් නොවන සියළු මංමාවත් නොවන සියළු මංමාවත් හා මාර්ග දෙහිඕවිට ප්‍රාදේශීය සභාව සතු මාර්ග වන බැවින් එම මාර්ග මෙම ප්‍රාදේශීය සභාවේම මාර්ග අංශයේ කම්කරු මහතුන් යොදාගෙන කාර්මික නිලධාරී අධීක්ෂණය යටතේ දීගලවත්ත ප්‍රිමික්ස් අංගනය මඟින් සකස් කරන ලද ප්‍රිමික්ස් යොදාගෙන මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම හා අබලන් මාර්ග අළුත්වැඩියා කිරීම.

- දීගලවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානයට යන මාර්ගයේ අබලන් ස්ථාන සැකසීම.
- දෙහිඕවිට පොදු ක්‍රීඩා පිටියට පිවිසෙන මාර්ගය සංවර්ධනය.
- මානියංගම පින්නපොල මාර්ගයේ දුෂ්කර ස්ථාන සැකසීම.
- මානියංගම ගලබලනකන්ද මාර්ගයේ දුෂ්කර ස්ථාන සැකසීම.



# නඩත්තු අංශය

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට අයත් සියළුම ගොඩනැගිලි, වාහන හා යන්ත්‍ර සූත්‍රවල මතුවන අළුත්වැඩියා කටයුතු ප්‍රාදේශීය සභාවේම සේවකයින් යොදාගනිමින් විධිමත්ව සිදු කිරීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

- කසළ කළමනාකරණ කටයුතු වෙනුවෙන් භාවිතා කරන ලද අබලන් ට්‍රැක්ටර් ටේලරය සකස් කිරීම.
- ලේඛනාගාරයේ රාක්ක සකස් කිරීම.
- කාර්යාලයේ ඵලදායිතා ඒකකය සැකසීම.
- ගබඩාවේ රාක්ක සැකසීම.
- පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යංශයේ භාවිතයෙන් ඉවත්කර තිබූ ගිලන් රථයක්
- අළුත්වැඩියා කර ආපදා රථයක් ලෙස භාවිතයට ගැනීම.







- කසළ කළමනාකරණ කටයුතු වෙනුවෙන් කසල කරත්ත 04 ක් සකස් කිරීම.



## පොදු උපයෝගිතා සේවා වැඩසටහනේ ප්‍රධාන අරමුණු හා කාර්යයන්

**1.නගර වැසියන්ගේ ප්‍රයෝජනය සඳහා පොදු වෙළඳඅසැල් ඉදි කිරීම නඩත්තුව හා පවත්වාගෙන යාම, පොදු වෙළඳ සැලෙහි සෞඛ්‍ය ආරක්ෂාව, පවිත්‍ර කිරීම හා කසල ඉවත් කිරීම.**

- තල්දූව සතිපොල ඉදි කිරීම සහ නඩත්තු කටයුතු පවත්වාගෙන යාම.





**2.වීථි ආලෝක කිරීම හා ඒවා විධිමත් ලෙස නඩත්තු කිරීම.**





### 3.බල ප්‍රදේශය තුළ සහ ඉන් පිටත මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා ආදාහනාගාර සහ සුසාන භූමි පවත්වාගෙන යාම.





### 4.ප්‍රදේශයේ ජනතාවගේ ක්‍රීඩා කෞශල්‍යය වැඩි දියුණුකිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.






# සුභසාධන සේවා වැඩසටහනේ ප්‍රධාන අරමුණු හා කාර්යයන්



1.බල ප්‍රදේශයේ දුෂ්කර ප්‍රදේශ වල පුස්තකාල ඉදිකර පවත්වාගෙන යාම තුළින් මහජනයාගේ හා දරුවන්ගේ අධ්‍යාපන හා දැනුම දියුණු කිරීමට ඉවහල් වීම.



2.විද්‍යුත් පුස්තකාලය හරහා නවීන තාක්ෂණ පහසුකම් සමග දරුවන්ට නවතම තොරතුරු හා දැනුම වර්ධනයට දායකවීම.

3.පාසල් සිසුන්ගේ අධ්‍යාපන සංවර්ධනයට දායකවීම.



4.පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම හා ඒවාට අවශ්‍ය මූල්‍ය හා වෙනත් පහසුකම් සැපයීම තුළින් මුල් ළමාවිය සංවර්ධනයට දායක වීම.



5.යහපත් පුරවැසියන් ඇති කිරීමේ අර්ථකාරී සේවාවන් සැපයීම.

6.මහජන සුබ සිද්ධිය හා සුබ විහරණය ඇති කිරීමේ අරමුණින් දරිද්‍රතාවය පිටු දැකීමේ වැඩසටහන්, කාන්තා අභිවෘද්ධි වැඩසටහන්, සහ ආපදා කළමනාකරණ වැඩසටහන් ආදීය පැවැත්වීම.






# සම්බුදු තෙමඟුල, පොසොන් කලාපය



# සම්බුදු තෙමඟුල,පොසොන් කලාපය සහ ඇසළ පොහොය නිමිත්තෙන් සැරසුනු දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

වෙසක්පොහෝ දිනසැමරුම වෙනුවෙන් පෙර පාසල් දරුවන්ගේ පුංචි දෑත් වලින් හැඩවුනු දෙහිඕවිට පනාවල පෙර පාසල සහ ඇසල පොහොය නිමිත්තෙන් සංවිධානය කරන ලද සිඟිති ළමා පෙරහැර.







## පොසොන් කලාපය



ශ්‍රී සදහම් පොසොන් කලාපයට සමගාමීව, දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සේවක සුභ සාධක සංගමය මඟින් නිර්මාණය කරන ලද "පොසොන් පහන් කූඩුව" 2023.06.04,05,06 දිනයන්හි දී මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත විය.



පනාවල ශක්‍යමුනි දහම් පාසලේ දරුවන්ගේ භක්ති ගීත ගායනය 2023.06.04 දින දෙහිඕවිට නගරයේදී සිදු කරන ලදී.

# යහපාලනය

දෙහිඕවිට ප්‍රාදේශීය සභාව නිරතුරුව නව ක්‍රියාකාරකම් මගින් යහපාලන මූලධර්මයන්ට අනුව වඩාත් විනිවිදභාවයකින් යුතුව පවත්වාගෙන යනු ලබන අතර වංචා හා දූෂණ අවම කරගනිමින් කාර්යක්ෂමව හා ඵලදායි සේවාවන් තම සේවා දායකයින්ට ලබා දීමටත් ජීවත්වීමට සුදුසු පරිසරයක් ගොඩනැගීමටත් හැකි වී ඇත.

- ❖ පවතින නීතිරීති හා රෙගුලාසි වලට අනුකූල වීම.
- ❖ ප්‍රජාව සමඟ සම්බන්ධ වීම.
- ❖ සැලසුම් කිරීම් සහ වාර්තා කිරීම.
- ❖ මූල්‍ය කළමනාකරණය.
- ❖ අවධානම් කළමනාකරණය.
- ❖ විධිමත් කළමනාකරණය.
- ❖ විධිමත් ප්‍රසම්පාදන ක්‍රම පාලනය.
- ❖ අභ්‍යන්තර පාලන ක්‍රම අනුගමනය කිරීම.



## සංවිධාන සටහන



සංවිධාන සටහන - දෙහිඕවිට ප්‍රාදේශීය සභාව
මහා සභාව
සභාපති
මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව
නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව
කාර්මික හා සේවා කාරක සභාව
පරිසර හා පොදු පහසුකම් කාරක සභාව
ලේකම්
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී
ආයුර්වේද වෛද්‍ය නිලධාරී
ප්‍රධාන කළමනාකරණ සහකාර
සංවර්ධන අංශය
ගිණුම් අංශය
ආදායම් අංශය
ආයතන අංශය
මහජන සෞඛ්‍ය පරීක්ෂක
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සහකාර
කාර්මික නිලධාරී
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සහකාර
ආදායම් පරීක්ෂක
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සහකාර
සංවර්ධන නිලධාරී
පුස්තකාලාධිපති
කළමනාකරණ සහකාර
වැඩ ක්ෂේත්‍ර පරිපාලක
රියදුරු
ආදාහනාගාර භාරකරු
විදුලි කාර්මික
බැකෝ යන්ත්‍ර ක්‍රියාකරු
මුරකරු
රියදුරු
කාර්යාල කාර්ය සහයක
පුස්තකාල සහායිකා
පෙර පාසල් පාලිකා
ඖෂධ සංයෝජක
සෞඛ්‍ය කම්කරු
වැඩ ක්ෂේත්‍ර කම්කරු
ආදාහනාගාර සහායක

## සංවිධාන පිරිසැකැස්ම



දෙහිඕවිට ප්‍රාදේශීය සභාව - කාර්යාල පිරිසැකැස්ම
தெஹியோவிற்ற பிரதேச சபை - அலுவலக தள அமைப்பு
Dehiowita Pradeshiya Sabha - Office Layout
කෑම කාමරය
ගබඩාව
විවේකාගාරය
කළමනාකරණ කමිටු රැස්වීම් ශාලාව
පියගැටපෙළ
සංවර්ධන අංශය
UP
DN
වැසිකිළි (ගැහැණු)
වැසිකිළි (ආබාධිත)
වැසිකිළි (පිරිමි)
මහජන ආසනය
ලේකම්
මන්ත්‍රී විවේකාගාරය
උප සභාපති
මුදල් අයකැමි
පිළිගැනීමේ නිලධාරී
පෙරටු කාර්යාලය
T.V.
ආදායම් අංශය
ගිණුම් අංශය
සභාපති
සභා ගර්භය
විපක්ෂ නායක
ලේඛනාගාරය

## සුවිශේෂී ව්‍යාපෘති

පළාත් සභා සංවර්ධන වැඩසටහන් යටතේ පළාත් සභාව විසින් 2023 වර්ෂයට අදාළව වෙන් කරන ලද ප්‍රතිපාදන යටතේ සිදු කරන ලද සුවිශේෂී ව්‍යාපෘති පහත පරිදි දැක්විය හැක.

දෙහිඕවිට බෞද්ධ ප්‍රාථමික විද්‍යාලයේ විකල්ප ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීම.

මුළු වියදම රු.760,000.00




දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ශ්‍රවනාගාරයේ ගබඩාව ආශ්‍රිත අලුත්වැඩියාව හා පිටත බිත්තිවල තීන්ත ආලේප කිරීම.

මුළු වියදම රු.1,980,000.00




දීගලවත්ත ගම හරහා ජල ව්‍යාපෘතිය අදියර -2 කිරීම.

මුළු වියදම රු.1,980,000.00




දිගලවත්ත කසල කලමනාකරණ මධ්‍යස්ථානයේ බේලර් යන්ත්‍රය හා හලර් යන්ත්‍රය අළුත්වැඩියා

මුළු වියදම රු.1,080,000.00



දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් සංවර්ධන වැඩසටහන් යටතේ 2023 වර්ෂයට අදාළව වෙන් කරන ලද ප්‍රතිපාදන යටතේ සිදු කරන ලද සභා කර්මාන්ත පහත පරිදි දැක්විය හැක.

මාදොල හෙල බොජුන්හල ඉදිකිරීම.

රු. 1,165,237



තල්දූව මහජන පුස්තකාල ගොඩනැගිල්ලේ දිරාගිය වැහිපීල්ල ගලවා ඉවත් කර අලුතින් සකස් කිරීම.

රු. 110,000

නව සභා ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් වහලයෙන් ප්‍රධාන ශබ්ඩාවට වන ජල කාන්දුව සැකසීම හා

රු. 830,000

තල්දූව සීතා විද්‍යාල මාර්ගයේ සීතාවක රේල් පාලම අසල අනතුරුදායක ස්ථානයේ ආරක්ෂිත වැට ඉදි කිරීම.

රු. 200,000

දෙහිඕවිට ප්‍රාදේශීය සභා හෙල බොජුන්හල(ඊරියගොල්ල)අලෙවි පියසේ ගලිවල පුළුල් කිරීම.

රු. 119,132

උඟරු පැලවිල සිට නාගහවත්ත පොල් අත්තවෙල දක්වා යන කම්බි පාලමේ අබලන්ව ඇති කොටස අලුත්වැඩියා කිරීම.

රු. 77,500





දීගලවත්ත ප්‍රධාන ගොඩනැගිලි දෙක අතර දිරාගිය ප්‍රධාන වැහිපීල්ල නැවත සවි කිරීම.

රු. 222,099

දීගලවත්ත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයේ පැරණි ගොඩනැගිල්ලේ වැහිපීලි යෙදීම.

රු. 340,043

දෙහිඕවිට ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ ඉහල මහල, රැස්වීම් ශාලාවේ දිරාපත්ව ඇති වහල වැහිපීලි ඉවත් කර නව වැහිපීලි යෙදීම.

රු. 112,777

ගලහිටිවෙල පොදු ළිඳ අළුත්වැඩියා කිරීම. (මොබිටෙල් පුද්ගලික සමාගම මගින් ලද ප්‍රතිපාදන)

රු.264,911

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සෙප්ට්‍රික් ටැංකියේ අබලන් වී ඇති පෙරීමේ පද්ධතිය නැවත සකස් කිරීම.

රු.152,416



පනාවල පෙර පාසලේ මුළුතැන්ලෙය සහ වහලය අලුත්වැඩියා කිරීම.

රු. 257,818

දෙහිඕවිට ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ ඉහල මහල වහල වැහිපීලි යෙදීම-2 වන අදියර.

රු.98,170



ඊරියගොල්ල සුසාන භූමියේ ගොඩනැගිල්ල ඉදිරිපිට වහලයට අලුතින් වහලයක් සකස් කිරීම.

රු.498,000

පනාවල මහජන පුස්තකාලයේ පහත මාලය ප්‍රතිසංස්කරණය කිරීම.

රු.495,16

දෙහිඕවිට ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල පහත මාලය වැසි ආවරණ යෙදීම.

රු.499,092

ඊරියගොල්ල ආදාහනාගාරයේ විදුලි ජනක කාමරය හා ආදාහනාගාර ගොඩනැගිලි දෙක අතර වඩිම්බුව හා වැහිපිහිලි යෙදීම.

රු.404,63

ගලබලන කන්ද මාර්ගයේ පාසල අසල අතුරු මාර්ගයේ ගල් කඩා ඉවත් කිරීම.

රු.209,57

පනාවල මහජන පුස්තකාලයේ ඉහල මහල ප්‍රතිසංස්කරණය කිරීම.

රු.428,31



මාගම්මන ආයුර්වේද ගොඩනැගිල්ල සඳහා සිවිලිම යෙදීම.

රු.248,39

දෙහිඕවිට ප්‍රාදේශීය සභා ශ්‍රවනාගාරයේ ඇතුලත නැවත සකස් කිරීම.

රු.355,00

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ඉහල මහල වහලය අලුත්වැඩියා කිරීම.

රු.480,99

# ශදුඅත විශ්ලේෂණය – SWOT ANALYSIS

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ රාජකාරි කටයුතු පවත්වාගෙන යාමේදී ඇතිවන ගැටළු අභියෝග හමුවේ ක්‍රියාත්මක වීමට ආයතනය සතු මානව, භෞතික හා සාමාජීය සම්පත් මනාව කළමනාකරණය තුළින් කටයුතු පහසු හා සාර්ථක ලෙස සිදු කිරීම අපේක්ෂා කෙරේ.



## ශක්තීන්
## Strengths

1. ආයතනය සතුව විවිධ දැනුම,ආකල්ප කුසලතා සපිරි කාර්යය මණ්ඩලයක් සිටීම.

2. ශක්තිමත් ආයතන කළමනාකාරීත්වයක් පැවතීම.

3. තරුණ නිලධාරි හා සේවක මණ්ඩලයක් සිටීම.

4. තාක්ෂණික දැනුම සහිත නිලධාරි පිරිසක් සිටීම.

5. ප්‍රමාණවත් තාක්ෂනික උපකරණ පැවතිම.

6. ආකර්ශනීය වැඩ පරිසරයක් ආයතනය තුල පැවතීම.

7. දේශපාලනික සහයෝගය කාර්යාලීය පරිසරය වෙත හිමි වීම.

8. නගර මධ්‍යයේ පැවතීම නිසා සියළු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන හා සංවිධාන වල සහයෝගීත්වය නිරතුරුව හිමි වීම.



## දුර්වලතා
## Weaknesses

1. වාර්ෂික ස්ථාන මාරු හමුවේ දක්ෂ හා තරුණ නිලධාරීන් අහිමි වීම.

2. වාර්ෂික ස්ථාන මාරු ලැබ පැමිණෙන නවක නිලධාරීන් හට අදාල ක්ෂේත්‍ර පිළිබඳ පුහුණු ලබාදීමට සිදුවීම මත කාලය හා ප්‍රතිපාදන වැය වීම.

3. විවිධ නිලධාරින්ගේ ඇති ආකල්පමය වෙනස්කම් හමුවේ විවිධ ගැටළු මතුවීම නිසා කාර්යසාධනය අඩු වීම.

4. දේශපාලන අධිකාරිත්වයේ බලපෑම් ඇති වීම.

5. අනුයුක්ත කාර්යය මණ්ඩලය පවතින වලට ගලපා ගැනීමට ප්‍රමාණවත් නොවීම.

## O

### අවස්ථා
### Opportunities

1. වෙනත් පළාත් පාලන ආයතනවල සහයෝගය හිමි වීම.

2. රාජ්‍ය නොවන ආයතන හා සංවිධානවල සහයෝගය හිමි වීම.

3. ආයතනය දෙහිඕවිට නගර මධ්‍යයේ ස්ථාපිත කර තිබීම.

4. සභා බල ප්‍රදේශයම ආවරණය වන පරිදි පුස්තකාල 05 නිදහස් ආයුර්වේදයක්, ආදාහනාගාරයක් හා සුසාන භූමි , පෙර පාසලක් ආයතනය සතුව පැවතීම .

5. ස්වයං උත්පාදන අංශ ස්ථාපිත කර තිබීම හා නව අංශ උත්පාදනය කිරීමේ හැකියාව පැවතීම.

6. පළාත් පාලන ආයතනයක් වන බැවින් විවිධ ව්‍යාපෘති සකස් කර පවත්වාගෙන යාමේ හැකියාව.

## T

### තර්ජන
### Threats

1. විවිධ සංවිධාන, ආයතන හා පුද්ගලයින්ගේ බලපෑම්.

2. දේශපාලන අධිකාරියේ බලපෑම්.

3. ආයතනය හා කළමනාකාරිත්වය වෙත රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශවලින් ඇතිවන බලපෑම්.

4. ආදායම් රැස් කිරීමේ ක්ෂේත්‍ර කටයුතු නිලධාරීන්ට විවිධ අපහසුතා වලට මුහුණ දීමට සිදු වීම.

5. පළාත් පාලන අණපනත් යාවත්කාලීන නොවීම.

# PEST විශ්ලේෂණය

## P — Political

1.)සබරගමු පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ ක්‍රියා කළ යුතු වීම.

2.) රජයේ බඳු ප්‍රතිපත්තිවලට යටත්ව ක්‍රියා කළ යුතු වීම හා නීතිරීවලට යටත්ව වැටුප් හා වේතන ගෙවිය යුතු විම.

3.) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ ආනුෂංගික තීරණ වල,නියෝග චක්‍ර ලේඛ,රෙගුලාසිවල නීතිය මගින් පනවා ඇති සීමාවලට යටත්ව තීරණ ගත යුතු වීම.

4.) වෘත්තිය සමිති හා දේශපාලපාලන අධිකාරිත්වය සමඟ සුහදව කටයුතු කළ යුතු වීම.

5.) විගණකාධිපති පරික්ෂාවට ලක්වීම.

## E — Educational

1.)පවතින රජයේ ප්‍රතිපත්තිවලට අනුව ක්‍රියාකළ යුතු වීම.

2.) මිල උද්ධමනය නිසා වියදම් ඉහළ යාම.

3.) මධ්‍යම රජයේ හා පළාත් සභාවේ පාලන බලය පළාත් පාලන ආයතන බලය සමඟ ගැටීම් ඇති වීම.

4.) විවිධ අංශවල නඩත්තු වියදම් ඉහළ අගයක් ගැනීම.

5.) වැටුප් හා වේතන සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදු වීම.

6.) පවතින ආර්ථීක රටාව හමුවේ බදු ගෙවීම් ප්‍රමාද වීම හා නොගෙවීම මත බදු අයවීමේ ප්‍රගතිය රදා පැවතීම.

## S — Social

1.)රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල බලපෑම්වලට ලක්ව කටයුතු කල යුතු වීම.

2.) බල ප්‍ර දේශය තුළ විවිධ ජාතින් හා ආගමිකයන් ජීවත් විම නිසා භාෂාව පරිපාලනය කිරීමේදී ඔවුන්ගේ බලපෑමට ලක්වීම.

3.) විවිධ වාර්ගික ජන කණ්ඩායම් ජීවත්වීම නිසා ඔවුන්ගේ විශ්වාසයන් වටිනාකම් ආකල්ප හා ජීවන රටාවන්ගේ සෘජු බලපෑම් කාර්යයන් ඉටු කිරීමේදී ඇති වීම.

4.) ජනතාව පෞද්ගලික අංශවලින් ලබාදෙන සේවාවන් සහාව මඟින්ද බලාපොරොත්තු වීම.

5.) සාමාජයේ සිටින ඉහළ අධ්‍යාපනය ලත් ජනතාවට කෙටි හා ක්ෂණික සේවාවන් ලබාදීමට අවශ්‍ය වීම.

## T — Technological

1.)පවතින තාක්ෂණික ක්‍රමවේදයන්ට අනුකූලව ඉක්මන් සේවාවන් ලබා දිමට අවශය වීම.

2.) තොරතුරු තාක්ෂනය යොදා ගනිමින් පරිපාලන කටයුතු සිදු කිරීමට අවශ්‍ය වීම.

3.) සියළු අංශ පද්ධතිකරණයට ලක් කර කටයුතු සිදු කිරීමට සිදු වීම.

4.) මහජනතාවට කඩිනම් සේවාවක් ලබාදීමට අන්තර්ජාලය හා සම්බන්ධ වෙමින් සේවා සැපයීමට සිදු වීම.

# සුවිශේෂි මං සලකුණු

**2023**

- දෙහිඹිවිට ප්‍රාදේශීය සභාව විසින් ළමා ආරක්ෂණය පදනම් කරගනිමින් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදි කිරීම.
- 
- ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතු වන නොදිරන කසල බැහැර කරලීම සඳහා INSEE ආයතනය සමඟ එක්ව තිරසර විසඳුමක් ලබා දීම.

**2022**

- මාදොළ හෙළ බොජුන්හල ආරම්භ කිරීම.
- දෙහිඹිවිට මහජන පුස්තකාලය යටතේ පරිගණක පාඨමාලාවක් ආරම්භ කිරීම.
- ප්‍රිමික්ස් අංගනය ආරම්භ කිරීම.

**2021**

- ඊරියගොල්ල හෙළ බොජුන්හල ආරම්භ කිරීම
- ශ්‍රම අභිමත් සේවක අභිප්‍රේරණ වැඩසටහන පැවැත්වීම

**2020**

- කොරෝනා සමයේ පරිත්‍යාගයක් ලෙස ලද ආපදා රථය නවීකරණය කර මහජනතාව වෙනුවෙන් යෙදවීම

**2019**

- දෙහිඹිවිට විද්‍යුත් පුස්තකාලයක් ආරම්භ කිරීම.

**2018**

- නව සභාපති ඇතුලු මන්ත්‍රී මණ්ඩලය පත්වීම.
- තල්දූව මහජන පුස්තකාලය ආරම්භ කිරීම.

**2017**

- නොදිරන කසල එකතු කිරීම සඳහා දිගලවත්ත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ලක් ඉදි කිරීම.

# ප්‍රාදේශීය සභාව පසුගිය වසර කිහිපය තුල අත්පත් කර ජයග්‍රහණ



පළාත් පාලන විශිෂ්ටයන්ගේ ස්වර්ණමය අභිෂේකය "රන් අස්වනු 2022 " සම්මාන උළෙලේ සබරගමුව පළාතේ නැගී එන හොඳම පළාත් පාලන ආයතනය ලෙස තේරී පත්වීම.



පළාත් පාලන විශිෂ්ටයන්ගේ ස්වර්ණමය අභිෂේකය "රන් අස්වනු 2022 " සම්මාන උළෙලේ සබරගමුව පළාතේ හොඳම ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන-පළමු ස්ථානය හිමි කරගන්නා ලදී.



පළාත් පාලන විශිෂ්ටයන්ගේ ස්වර්ණමය අභිෂේකය "රන් අස්වනු 2022 " සම්මාන උළෙලේ සබරගමුව පළාතේ හොඳම ආදාහනාගාරය - පළමු ස්ථානය හිමි කරගන්නා ලදී.



පළාත් පාලන විශිෂ්ටයන්ගේ ස්වර්ණමය අභිෂේකය "රන් අස්වනු 2022 " සම්මාන උළෙලේ සබරගමුව පළාතේ හොඳම ලේඛනාගාරය - දෙවන ස්ථානය හිමි කරගන්නා ලදී.




ප්‍රශස්ථ වාර්ෂික / කාර්ය සාධන වාර්තා හා ගිණුම් සම්මාන තරඟාවලිය රාජ්‍ය අංශය - 2022 – කුසලතා සහතිකය

**( ප්‍රාදේශීය සභා ඛාණ්ඩය)**

- ❖ පළාත් පාලන ආයතන අතර කාර්යසාධන තරඟය - නැගී එන ප්‍රාදේශීය සභාව - 2016
- ❖ පළාත් පාලන ආයතන අතර කාර්යසාධන තරඟය - නැගී එන ප්‍රාදේශීය සභාව - 2017
- ❖ පළාත් පාලන ආයතන අතර කාර්යසාධන තරඟය (ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන) - දෙවන ස්ථානය (සබරගමු පළාත) - 2017
- ❖ පළාත් පාලන ආයතන අතර කාර්යසාධන තරඟය ( ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන) - ප්‍රථම ස්ථානය (කෑගල්ල දිස්ත්‍රික්කය) - 2017
- ❖ පළාත් පාලන ආයතන අතර කාර්යසාධන තරඟය ( ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන) - තෙවන ස්ථානය (කෑගල්ල දිස්ත්‍රික්කය) - 2018
- ❖ පළාත් පාලන ආයතන අතර කාර්යසාධන තරඟය ( ලේඛනාගාරය) - තෙවන ස්ථානය (කෑගල්ල දිස්ත්‍රික්කය) - 2018
- ❖ ප්‍රශස්ථ වාර්ෂික /කාර්ය සාධන වාර්තා හා ගිණුම් සම්මාන තරඟාවලිය රාජ්‍ය අංශය - 2019
- ❖ ප්‍රශස්ථ වාර්ෂික / කාර්ය සාධන වාර්තා හා ගිණුම් සම්මාන තරඟාවලිය රාජ්‍ය අංශය - 2020 - තෙවන ස්ථානය( ප්‍රාදේශීය සභා ඛාණ්ඩය)
- ❖ ජාතික ඵලදායිතා තරඟය - රාජ්‍ය අංශය තෙවන ස්ථානය (පළාත් පාලන ආයතන) - 2020



# මූල්‍යමය ක්‍රියාකාරිත්වය



## මූල්‍ය සාරාංශය

| | |
|---|---|
| රු.මි .108.72<br>පුනරාවර්තන ආදායම | රු.මි.68.11<br>ජංගම වත්කම් |
| රු.මි.93<br>පුනරාවර්තන වියදම | රු.මි.20.54<br>ජංගම වගකීම් |
| රු.මි.47.57<br>කාරක ප්‍රාග්ධනය | රු.මි.1,421<br>සමුච්චිත අරමුදල |

## ආදායම්

2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ මුළු ආදායම 10.52% කින් වර්ධනය වී ඇත .

2023 වර්ෂයේ මුළු ආදායම




2022 වර්ෂයේ මුළු ආදායම



# වියදම්

## 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ මුළු වියදම 11.66% කින් වර්ධනය වී ඇත.

**2023 වර්ෂයේ මුළු වියදම**




**2022 වර්ෂයේ මුළු වියදම**



## ආදායම් විශ්ලේෂණය

## 10 වරිපනම් බදු

වරිපනම් බදු, අක්කර බදු,කර්මාන්ත බදු,ව්‍යාපාර බදු,ඉඩම් විකිණීම මත බදු සහ විනෝද බදු ඇස්තමේන්තුව වරිපනම් බදු යටතේ ප්‍රධාන වශයෙන් දක්වා ඇත.

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 146 (1) උප වගන්තිය ප්‍රකාර මෙම බල ප්‍රදේශයේ වරිපනම් බදු අය කරනු ලබයි. 2023 වර්ෂයේදී, 2012 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද දේපල තක්සේරුව මත පදනම්ව වරිපනම් බදු අය කරනු ලබන අතර, ඒ සඳහා මෙම සභාව විසින් දේපළ වල වාර්ෂික වටිනාකම් මත නාගරික දේපළ සඳහා 7%ක් සහ දියුණු ගම් ප්‍රදේශ සඳහා 6% 4% 3% 2%ආදී ප්‍රතිශත මත වරිපනම් බදු ආදායම් ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව හඳුනාගෙන ඇති දේපළ සංඛ්‍යාව 5,076 ක් වෙනුවෙන් 2023 වර්ෂයේ අපේක්ෂිත වරිපනම් බදු වටිනාකම රු.3,038,000.00 ක් වේ.

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 134 (3) උප වගන්තිය ප්‍රකාර මෙම බල ප්‍රදේශයේ අක්කර 2.5 කට වැඩි ( හෙක්ටයාර් 01 ) ඉඩම් මත අක්කර බදු අය කරනු ලබයි. ඒ අනුව හඳුනාගෙන ඇති ඒකක 1570 ක් වෙනුවෙන් 2023 වර්ෂයේ අපේක්ෂිත අක්කර බදු වටිනාකම රු.150,000.00 ක් වේ

| වර්ෂය | ඇස්තමේන්තුව | සත්‍ය ලැබීම් |
|---|---|---|
| 2021 | 7,280,000.00 | 4,958,224.59 |
| 2022 | 4,573,000.00 | 4,783,327.10 |
| 2023 | 4,318,000.00 | 4,370,618.50 |




1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 150(1) වන උප වගන්තියෙන් ප්‍රාදේශිය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය ඇතුලත කරනු ලබන කර්මාන්ත වෙනුවෙන් එක් එක් කර්මාන්ත පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූපව 2023 වර්ෂයේ අපේක්ෂිත ආදායම් ලෙස කර්මාන්ත බද්දක් ගණනය කර ඇත. ඒ අනුව අපේක්ෂිත ආදායම 120,000.00 කි.

## 2023 වර්ෂයේ සත්‍ය ලැබීම

| ආදායම් විෂය | ඇස්තමේන්තුව | සත්‍ය ලැබීම් |
|---|---|---|
| වරිපනම් බදු | 3,038,000.00 | 3,016,013.47 |
| 1%බැගින් අයකරන බදු | 50,000.00 | - |
| අක්කර බදු | 150,000.00 | 137,615.03 |
| ව්‍යාපාර බදු | 610,000.00 | 858,000.00 |
| කර්මාන්ත බදු | 120,000.00 | 150,000.00 |
| කසල බදු | 100,000.00 | - |
| විනෝද බදු | 100,000.00 | 208,990.00 |




1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 152(1) උප වගන්තියෙන් ප්‍රාදේශිය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසි ව්‍යාපාරයක් දෙහිඔිවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය ඇතුලත 2023 වර්ෂයේදී කර ගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් පදනම් කර ගෙන අය කර ගැනීමට කරන ලද ඇස්තමේත්තුව ද ඇතුළත් කර ඇත.

## 20 කුලී

මෙම ආදායම් විෂය යටතේ ඇස්තමේත්තු කර ඇත්තේ දෙහිඔිවිට නව බහු කාර්ය ගොඩනැගිල්ල , තල්දූව නව වෙළඳ මධ්‍යස්ථානය, අනෙකුත් කඩ කාමර (පනාවල, දෙහිඔිවිට) ආදී සභාව සතු කඩ කාමර කුළියට දීමෙන් ලැබෙන ආදායමත්, ඉඩම්වල එලදාව බදුදීම, යන්ත්‍රෝපකරණ කුළියට දීම හා ශ්‍රවණාගාරය කුළියට දීමෙන් ලැබෙන ආදායමත්ය.

දෙහිඔිවිට නව බහු කාර්ය ගොඩනැගිල්ලට අයත් පොදු වැසිකිලිය ටෙන්ඩර් කිරීමෙන් ලැබෙන ආදායමද,තල්දූව සතිපොල කඩකාමර 04 කුළියට දීමෙන් ලැබෙන ආදායම් මේ යටතේ ඇස්තමේත්තු කර ඇත.

සභාවට අයත් තල්දූව සති පොල වාර්ෂිකව බදු දිම මඟින් ලැබෙන ආදායම් මේ යටතේ අපේක්ෂිත ආදායම් ලෙස ඇස්තමේත්තු කර ඇති පොදු වෙළඳ පොලට අමතරව මස් කඩ හා මාළු කඩ වාර්ෂිකව කුළියට දෙනු ලැබේ.හෙළබොජුන් හල කුලියට දීමෙන් අපේක්ෂිත ආදායමට මේ සඳහා ඇතුලත් වේ.

| වර්ෂය | ඇස්තමේන්තුව | සත්‍ය ලැබීම් |
|---|---|---|
| 2021 | 12,847,710.00 | 11,435,605.29 |
| 2022 | 13,410,400.00 | 12,733,799.95 |
| 2023 | 14,950,910.00 | 14,868,895.96 |




## 2023 වර්ෂය සත්‍ය ලැබීම

| ආදායම් විෂය | ඇස්තමේන්තුව | සත්‍ය ලැබීම් |
|---|---|---|
| වැසිකිළි ටෙන්ඩර් කිරීම | 104,000.00 | 169,500.00 |
| වෙළඳ ස්ථාන බදු දීම | 121,800.00 | - |
| නව බහුකාර්ය ගොඩනැගිල්ල කුලියට දීම | | |
| තල්දූව මිනි මාකට් | 1,167,000.00 | |
| ඉඩම් වල එලදාව බදු දීම | 765,000.00 | |
| යන්ත්‍රෝපකරණ කුලියට දීම | 9,500.00 | 44,312,844.50 |
| ශ්‍රවනාගාරය කුලියට දීම | 2,100,000.00 | |
| තල්දූව සතිපොළ කඩකාමර කුලී | 700,000.00 | |
| තල්දූව සතිපොළ ආදායම් | 48,000.00 | |
| මස්කඩ හා මාළු පිල් බදු දීම | | 10,267,551.46 |
| හෙළ බොජුන් හල බදු දීම | 1,894,000.00 | |



## 30 බලපත්‍ර ගාස්තු

වාහන බලපත්‍ර (බයිසිකල්)ප්‍රචාරක දැන්වීම් පුවරු වෙළඳ බලපත්‍ර, පාරිසරික බලපත්‍ර ගාස්තු මේ යටතේ දක්වා ඇත.1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ147(1) උප වගන්තිය ප්‍රකාරව වාහන පිළිබඳ බද්දක් අය කළ හැකි බවට ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව වාර්ෂිකව පාපැදි සඳහා අය කළ යුතු මුදල රු.100.00 ක් වන අතර පසු ගිය වර්ෂ කිහිපයක මෙම විෂය යටතේ එකඟ වූ ආදායම් හා ලැබිය හැකි මුදල සැලකිල්ලට ගෙන 2023 වර්ෂය වෙනුවෙන් රු.200.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත .1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 149 වන වගන්තිය ප්‍රකාර දැන්වීම් පුවරු, ප්‍රචාරක දැන්වීම්, බිත්ති දැන්විම් කටවුට්, පොස්ටර් දැන්වීම් සඳහා බලපත්‍ර ගාස්තු මඟින් 2023 වර්ෂයට රු.150,000.00 ක ආදායමක් ලැබේ යැයි ඇස්තමේන්තු කර ඇත.

දෙහිඕවිට ප්‍රාදේශිය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ 2024 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 147 වන වගන්තිය සමඟ කියවිය යුතු 149 වගන්තිය ප්‍රකාර එක් එක් වෙළඳාම වෙනුවෙන් 2023 වර්ෂයට අපේක්ෂිත බලපත්‍ර ගාස්තුව ලෙස රු.750,000.00 ක් ඇස්තමේන්තු කර ඇත.

පාරිසරික පනත ක්‍රියාත්මක වීම යටතේ එක් පරිසර බලපත්‍රයක් වෙනුවෙන් රු.117,000.00ක මුදලක් අය කරනු ලබයි.

| ආදායම් විෂය | ඇස්තමේන්තුව | සත්‍ය ලැබීම් |
|---|---|---|
| 2021 | 445,200.00 | 385,262.50 |
| 2022 | 505,200.00 | 435,548.50 |
| 2023 | 1,017,200.00 | 1,184,110.50 |




## 2023 වර්ෂය සත්‍ය ලැබීම

| ආදායම් විෂය | ඇස්තමේන්තුව | සත්‍ය ලැබීම් |
|---|---|---|
| වාහන බලපත්‍ර | 200.00 | |
| ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු | 150,000.00 | 146,860.50 |
| වෙළඳ බලපත්‍ර ගාස්තු | 750,000.00 | |
| පාරිසරික බලපත්‍ර ගාස්තු | 117,000.00 | 1,037,250.00 |



## 40 සේවා සඳහා ගාස්තු

පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා වැඩසටහන යටතේ ලියාපදිංචි කිරීමේ සහතික හා පරීක්ෂණ ගාස්තු සහ විශේෂ ගාස්තු ලෙස 2023 වර්ෂයේදී 30,000.00 සහ 200,000.00 ලෙස ඇස්තමේන්තු කර ඇත.

සෞඛ්‍ය සේවා වැඩසටහන යටතේ පාරිසරික පන; කි‍්‍රයා!මක වීම යටතේ ලියාපදිංචි කිරීමේ සහතික හා පරීක්ෂණ ගාස්තු ලෙස 2023 වර්ෂයේදී 308,000.00 ක් ඇස්තමේන්තු තර ඇත.

අයකර ගත හැකි ගාස්තු තාවකාලික සෝගාතකාගාර විසින් අය කරන ගාස්තු කර්මාන්ත අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා ගාස්තු කසල ඉවත් කිරීමේ ගාස්තුද මේ යටතේ ඇස්තමේන්තු කර ඇත.2023 වර්ෂයේදී 150,000.00 සහ 10,000.00 ඇස්තමේන්තු කර ඇත.

භෞ;තික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි වැඩසටහන යටතේ ගොඩනැගිලි බලපත්‍ර පරීක්ෂණ ගාස්තු,වීථි රේඛා ගාස්තු,වාහන නැවතුම් ස්ථාන,භූමිය කුලියට දීම ආදිය,වැටුප් රහිත නිවාඩු සහ මාර්ග එළිපෙහෙළි කිරීම ආදිය ඇස්තමේන්තු කර ඇත.

පොදු උපයෝගිතා සේවා වැඩසටහන යටතේ දෙහිඕවිට ප්‍රාදේශිය සභාව විසින් ඉදිකරන ඊරියගොල්ල ආදාහනා.ාරය සඳහා ගාස්තු සහ වැටුප් රහිත නිවාඩු මේ යටතේ දක්වා ඇත.

මීට අමතරව සුභ සාධන සේවා පහසුකම් වැඩසටහන යටතේ සංචාරක වෙළඳාම් අතුරු ව්‍යවස්ථා ගාස්තු සහ පුස්තකාල සාමාජික වීමේ ගාස්තු ඇස්තමේන්තු කර ඇත.

| වර්ෂය | ඇස්තමේන්තුව | සත්‍ය ලැබීම් |
|---|---|---|
| 2021 | 3,229,000.00 | 4,577,718.33 |
| 2022 | 3,851,800.00 | 4,704,345.92 |
| 2023 | 5,855,600.00 | 5,659,479.59 |



## 2023 වර්ෂය සත්‍ය ලැබීම

| ආදායම් විෂය | ඇස්තමේන්තුව | සත්‍ය ලැබීම් |
|---|---|---|
| ලියාපදිංචි කිරීමේ සහතික හා පරීක්ෂණ ගාස්තු | 30,000.00 | |
| විශේෂ ගාස්තු | 200,000.00 | 191,011.06 |
| ලියාපදිංචි කිරීමේ සහතික හා පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු | 308,000.00 | |
| සුසාන භූමි ගාස්තු,තාවකාලික සෝගාතකාගාර ගාස්තු | 150,000.00 | |
| කසළ ඉවත් කිරීම සඳහා ගාස්තු | 10,000.00 | 380,798.31 |
| ගොඩනැගිලි බලපත්‍ර පරීක්ෂණ ගාස්තු | 400,000.00 | |
| වීථි රේඛා/ජල සහතික ගාස්තු | 1,500,000.00 | |
| භූමිය කුලියට දීම | 385,000.00 | |
| වැටුප් රහිත නිවාඩු | 50,000.00 | |
| මාර්ග එලිපෙහෙලි කිරීම | 268,800.00 | 1,930,116.61 |
| ආදාහනාගාර ගාස්තු | 2,500,000.00 | |
| වැටුප් රහිත නිවාඩු | 5,000.00 | 2,995,998.61 |
| සංචාරක වෙළඳම් අතුරු ව්‍යවස්ථා ගාස්තු | 1,000.00 | |
| පුස්තකාල සාමාජික වීමේ ගාස්තු | 47,800.00 | 161,555.00 |



## 50 වරෙන්තු ගාස්තු හා දඩ

මේ යටතේ වරෙන්තු ගාස්තු සහ ප්‍රාදේශිය සභා පනත මෙන්ම වෙනත් අණ පනත් ක්‍රියාත්මක කිරීමේදී නීතිය ක්‍රියාත්මක වීම තුළින් උසාවිය විසින් අය කර ගන්නා වූ දඩ මුදල් වලින් ප්‍රාදේශිය සභාව වෙත ලැබේ යැයි අපේක්ෂිත ආදායම් උසාවි දඩ ආදායම් යටතේ ඇස්තමේන්තු කර ඇත.

මාකට් කඩ කුලී දඩ මුදල් සහ කර්මාන්ත ප්‍රමාද සඳහා දඩ ඇස්තමේන්තු කර ඇත.

තවද මස්මාළු කඩ, සතිපොළ දඩ සහ තල්දූව සති පොළ කඩ කාමර දඩ මුදල් සහ නැතිවූ පොත් සඳහා අය කරන ගාස්තු මේ සඳහා ඇස්තමේන්තු කර ඇත.

| වර්ෂය | ඇස්තමේන්තුව | සත්‍ය ලැබීම් |
|---|---|---|
| **2021** | **5,272,000.00** | **5,628,699.98** |
| **2022** | **5,269,000.00** | **8,800,050.48** |
| **2023** | **6,428,000.00** | **6,851,679.21** |




## 2023 වර්ෂය සත්‍ය ලැබීම

| ආදායම් විෂය | ඇස්තමේන්තුව | සත්‍ය ලැබීම් |
|---|---|---|
| වරෙන්තු ගාස්තු | 50,000.00 | |
| උසාවි දඩ | 6,000,000.00 | 6,207,165.10 |
| වරෙන්තු ගාස්තු | 1,000.00 | 1,200.00 |
| මාකට් කඩ කුලී දඩ මුදල් | 50,000.00 | |
| කර්මාන්ත ප්‍රමාද සඳහා දඩ | 250,000.00 | 575,888.00 |
| මස්මාළු කඩ, සතිපොළ දඩ | 50,000.00 | |
| තල්දූව සති පොළ කඩ කාමර දඩ මුදල් | 2,000.00 | 2,388.58 |
| නැතිවූ පොත් සඳහා අය කරන ගාස්තු | 5,000.00 | |
| පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තු | 20,000.00 | 65,037.53 |



## 60 වෙනත් ආදායම්

මේ යටතේ ආයෝජන පොලී,මුද්‍රිත පෝරම වර්ග,මුද්දර ගාස්තු,සේවක ණය පොළී,අධිභාර ගාස්තු පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා වැඩසටහන යටතේ ඇස්තමේන්තු කර ඇත.

සෞඛ්‍ය සේවා වැඩසටහන යටතේ පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු,කොම්පෝස්ට් පොහොර විකුණුම් සහ අබලි විකුණුම් ඇස්තමේන්තු කර ඇත.

| වර්ෂය | ඇස්තමේන්තුව | සත්‍ය ලැබීම් |
|---|---|---|
| 2021 | 21,989,000.00 | 17,347,647.66 |
| 2022 | 22,239,000.00 | 23,919,588.03 |
| 2023 | 24,720,000.00 | 30,236,368.72 |

මීට අමතරව ගොඩනැගිලි අයදුම්පත්,වීථි රේඛා පෝරම ගාස්තු,අනතුරුදායක ගස් පෝරම ආදිය ඇස්තමේන්තු කර ඇත.

තවද මස් මාළු කඩ ටෙන්ඩර් පෝරම ගාස්තු මෙන්ම පුවත් පත් විකුණුම් ඇස්තමේන්තු කර ඇත.




## 2023 වර්ෂය සත්‍ය ලැබීම

| ආදායම් විෂය | ඇස්තමේන්තුව | සත්‍ය ලැබීම් |
|---|---|---|
| ආයෝජන පොලී | 975,000.00 | |
| පෝරම විකුණුම් | 40,000.00 | |
| මුද්දර ගාස්තු | 22,000,000.00 | |
| සේවක ණය පොලී | 325,000.00 | |
| අධිභාර | 20,000.00 | 29,714,254,.72 |
| පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු | 10,000.00 | |
| කොම්පෝස්ට් පොහොර විකුණුම් | 750,000.00 | |
| අබලි විකුණුම් | 60,000.00 | 298,360.00 |
| වීථි රේඛා | 300,000.00 | 209,004.00 |
| මස් මාළු කඩ ටෙන්ඩර් පෝරම | 225,000.00 | 14,750.00 |
| පුවත්පත් විකුණුම් | 15,000.00 | |




## 70 ආදායම් ආධාර

කාර්ය මණ්ඩලයේ වැටුප් ප්‍රතිපූර්ණය,සභාපති ඇතුළු මන්ත්‍රී දීමනා ප්‍රතිපූර්ණය,ද්‍රව්‍ය ආධාර (ආයුර්වේද බෙහෙත් තොග) මේ යටතේ ඇස්තමේන්තු කර ඇත.

| වර්ෂය | ඇස්තමේන්තුව | සත්‍ය ලැබීම් |
|---|---|---|
| **2021** | 48,880,880.00 | 40,071,338.46 |
| **2022** | 51,154,249.00 | 46,732,371.53 |
| **2023** | 56,861,084.00 | 45,554,235.63 |



## 2023 වර්ෂය සත්‍ය ලැබීම

| ආදායම් විෂය | ඇස්තමේන්තුව | සත්‍ය ලැබීම් |
|---|---|---|
| කාර්ය මණ්ඩලයේ වැටුප් ප්‍රතිපූර්ණය-01 | 26,600,520.00 | |
| සභාපති ඇතුළු මන්ත්‍රී දීමනා ප්‍රතිපූර්ණය-01 | 6,300,000.00 | 26,537,496.47 |
| සාමූහික ආධාර | 100,000.00 | |
| කාර්ය මණ්ඩලයේ වැටුප් ප්‍රතිපූර්ණය-02 | 6,312,000.00 | |
| ද්‍රව්‍ය ආධාර (ආයුර්වේද බෙහෙත් තොග-02 | 250,000.00 | 4,849,169.55 |
| කාර්ය මණ්ඩලයේ වැටුප් ප්‍රතිපූර්ණය-03 | 11,430,684.00 | 8,563,310.08 |
| කාර්ය මණ්ඩලයේ වැටුප් ප්‍රතිපූර්ණය-05 | 1,533,120.00 | 2,027,339.53 |
| කාර්ය මණ්ඩලයේ වැටුප් ප්‍රතිපූර්ණය-06 | 4,334,760.00 | 3,576,920.00 |



## ආදායම් සාරාංශය - 2023 (අය විෂය අනුව)




| අය ශීර්ෂය | ආදායම් විස්තරය | මුදල | ප්‍රතිශතය ٪ |
|---|---|---|---|
| 10 | වරිපනම් හා බදු | 4,318,000.00 | 1.22 |
| 20 | කුලී | 14,950,910.00 | 4.21 |
| 30 | බලපත්‍ර ගාස්තු | 1,017,200.00 | 0.29 |
| 40 | සේවා සඳහා ගාස්තු | 5,855,600.00 | 1.65 |
| 50 | වරෙන්තු ගාස්තු හා දඩ මුදල් | 6,428,000.00 | 1.81 |
| 60 | වෙනත් ආදායම් | 24,720,000.00 | 6.96 |
| 70 | ආදායම් ආධාර | 56,861,084.00 | 16.01 |
| 80 | ප්‍රාග්ධන ලැබීම් | 240,947,018.00 | 67.85 |
| | එකතුව | 355,097,812.00 | 100.00 |

## ආදායම් සාරාංශය - 2023 (වැඩසටහන් අනුව)




| අංකය | වැඩසටහන් විස්තරය | මුදල | ප්‍රතිශතය ٪ |
|---|---|---|---|
| 1 | පොදු පරිපාලනය | 66,028,720.00 | 18.69 ٪ |
| 2 | සෞඛ්‍ය සේවා | 9,712,000.00 | 2.74 ٪ |
| 3 | භෞතික සැලසුම් හා මංමාවත් | 260,209,802.00 | 73.28 ٪ |
| 5 | පොදු උපයෝගී සේවා | 14,298,730.00 | 4.03 ٪ |
| 6 | සුභසාධක සේවා | 4,523,560.00 | 1.27 ٪ |
| | එකතුව | 355,097,812.00 | 100.00 ٪ |

# වියදම් විශ්ලේෂණය

## 01. වැටුප් හා වේතන




| වර්ෂය | ඇස්තමේන්තුව | සත්‍ය ගෙවීම් |
|---|---|---|
| **2021** | 63,672,852.00 | 52,309,146.42 |
| **2022** | 65,209,792.00 | 58,262,623.61 |
| **2023** | 73,414,287.00 | 57,631,923.79 |

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ස්ථිර සහ ගිවිසුම් පදනම මත දෛනික වැටුප්,අතිකාල,නිවාඩු දින වැටුප්,ජීවන අංක දීමනා,සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම් සඳහා දීමනා,පුහුණු වැඩසටහන් සඳහා වියදම්,ලේඛන ලිවීමේ ගාස්තු, සමීක්ෂණ මණ්ඩල දීමනා සහ කාර්ය සාධන තරගය සඳහා

වන වියදම් මේ යටතේ ඇස්තමේන්තු කර ඇත.2023 වසරේ ඇස්තමේන්තු වැටුප් හා වේතනය සහ සත්‍ය වියදම අතර වෙනස පුරප්පාඩු මත ඇස්තමේන්තු කර ඇති වියදම සහ අනෙකුත් පුහුණු පාඨමාලා සඳහා ඇස්තමේන්තු වියදම සහ සත්‍ය වියදම අතර වෙනස වේ.

## 2. ගමන් වියදම්




| වර්ෂය | ඇස්තමේන්තුව | සත්‍ය ගෙවීම් |
|---|---|---|
| **2021** | 947,000.00 | 361,749.00 |
| **2022** | 932,000.00 | 815,420.61 |
| **2023** | 542,000.00 | 1,046,276.40 |

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩල ගමන් වියදම්,කාර්ය මණ්ඩල නොවන ගමන් වියදම්,ස්ථාන මාරු සහ විදේශ පුහුණු සඳහා ගමන් වියදම්,ආයුර්වේද වෛද්‍ය නිලධාරී ගමන් වියදම්,මහජන සෞඛ්‍ය පරීක්ෂක ගමන් වියදම්,පරිසර කමිටු සාමාජික ගමන් වියදම්,කාර්මික නිලධාරී පරිවර්තිත ගමන් වියදම්,ගොඩනැගිලි කමිටු සාමාජික ගමන් වියදම් ආදිය සඳහා ඇස්තමේන්තු කර ඇත.

2021 සහ 2022 වර්ෂ වලට සාපේක්ෂව පුහුණු පාඨමාලා සඳහා සහභාගි වීම මත කාර්ය මණ්ඩල ගමන් වියදම් සැලකිලිමත් ප්‍රමාණයකින් වැඩි වී ඇත.

## 03. සැපයුම් හා උපකරණ




| වර්ෂය | ඇස්තමේන්තුව | සත්‍ය ගෙවීම් |
|---|---|---|
| **2021** | 10,603,000.00 | 9,642,136.53 |
| **2022** | 10,489,000.00 | 15,444,006.90 |
| **2023** | 15,284,238.00 | 14,401,024.87 |

ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ,ඉන්ධන හා ලිහිසි තෙල්,මන්ත්‍රී මණ්ඩල ඉන්ධන දීමනාව, යන්ත්‍ර සූත්‍ර සා විදුලි භාණ්ඩ,සංග්‍රහ වියදම්,නිල ඇඳුම් සැපයීම,වෙනත් ගබඩා භාණ්ඩ,ආයුර්වේද බෙහෙත් තොග,කසළ බඳුන්,සෞඛ්‍ය ආශ්‍රිත උපකරණ,පුස්තකාල සහ පෙර පාසල් උපකරණ සඳහා වන වියදම් මේ යටතේ ඇස්තමේන්තු කර ඇත.මෙහිදී ප්‍රධාන වශයෙන් ඇස්තමේන්තු සහ සත්‍ය වියදම අතර වෙනසට හේතුව ලෙස ලිපිද්‍රව්‍ය සහ ඉන්ධන සඳහා වෙළඳපල මිල ඉහළ යාම දැක්විය හැක.

## 04. ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව




| වර්ෂය | ඇස්තමේන්තුව | සත්‍ය ගෙවීම් |
|---|---|---|
| **2021** | 8,758,000.00 | 7,374,767.24 |
| **2022** | 8,358,000.00 | 9,535,945.13 |
| **2023** | 10,183,000.00 | 10,690,286.68 |

වාහන යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අළුත්වැඩියාව,ගොඩනැගිලි පහසුකම් හා වෙනත් ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව,වැසිකිලි,ආයුර්වේද ගොඩනැගිල්ල,සණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය අලුත්වැඩියාව,කාණු අලුත්වැඩියාව,මංමාවත් පදික වේදිකා නඩත්තුව සහ පවරා ගැනීම,වීථි ආලෝකය හා නඩත්තු ,ළමා උද්‍යාන නඩත්තු ආදිය සඳහා ඇස්තමේන්තු කර ඇත.

2022 සහ 2023 වර්ෂයන්හිදී සියළු වාහන යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අළුත්වැඩියා කටයුතු සඳහා වියදම් අධික වීමත් වීථි පහන් සඳහා වෙළඳපල මිල ගනන් ඉහල යාම හේතුවෙන් සත්‍ය වියදම ඇස්තමේන්තු වියදමට සාපේක්ෂව ඉහල අගයක් ගන්නා ලදී.

## 05. ප්‍රවාහන සමබන්ධතා ආවශ්‍යක හා වෙනත්

| වර්ෂය | ඇස්තමේන්තුව | සත්‍ය ගෙවීම් |
|---|---|---|
| 2021 | 8,548,401.00 | 6,332,323.11 |
| 2022 | 8,663,400.00 | 7,596,666.34 |
| 2023 | 7,218,090.00 | 7,553,946.94 |




ප්‍රවාහන වියදම්,කාර්යාල සහ මන්ත්‍රී දුරකතන වියදම්,සියළුම උප ආයතන වල විදුලි බිල්පත්,ජල බිල්පත්,පානීය ජල බෝතල් බිල්පත්,මුද්‍රණ වියදම්,මෘදුකාංග නඩත්තු කිරීමේ වියදම්,විගණන ගාස්තු,මුදල්,ආදාහනාගාර,විදුලි කාර්මික,වාහන රක්ෂණ ආදායම් බලපත්‍ර,විශ්‍රාම වැටුප් බිල්පත්,උසාවි කාර්ය මණ්ඩල දීමනා, තැපැල් ගාස්තු,මිනින්දෝරු ගාස්තු,නීතිඥ ගාස්තු,ත්‍රෛභාෂා කටයුතු,තිරසර සංවර්ධන අරමුණු වලට අදාල සෞඛ්‍ය කටයුතු සඳහා වියදම් සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සඳහා වියදම් මේ යටතේඇස්තමේන්තු කර ඇත.

මෙහිදී 2023 වර්ෂයේ කාර්යාල දුරකතන වියදම්, විදුලි බිල්පත්,ජල බිල්පත්, මුද්‍රණ වියදම්,රක්ෂණ ගාස්තු,නීතිඥ ගාස්තු ආදිය ඇස්තමේන්තු කල වියදමට සාපේක්ෂව සත්‍ය වියදම වැඩි වීමක් සිදු විය.

## 06. පොළී ගෙවීම්,ලාභාංශ හා ප්‍රසාද මුදල්

| වර්ෂය | ඇස්තමේන්තුව | සත්‍ය ගෙවීම් |
|---|---|---|
| 2021 | 1,364,066.00 | 1,064,071.94 |
| 2022 | 759,357.00 | 784,356.96 |
| 2023 | 660,344.00 | 661,068.57 |




මෙහිදී දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට අයත් තල්දුව වෙළඳ සංකීර්ණය සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලට පොළී ගෙවීම සහ තල්දූව සතිපොළ භූමියේ බදු ගෙවීම මේ යටතේ ඇස්තමේන්තු කර ඇත.

## 07. ආධාර මුදල්,දායක මුදල් හා සහනාධාර

| වර්ෂය | ඇස්තමේන්තුව | සත්‍යගෙවීම් |
|---|---|---|
| **2021** | 333,000.00 | 141,075.18 |
| **2022** | 308,000.00 | 303,657.05 |
| **2023** | 313,000.00 | 369,038.72 |




මේ යටතේ ආධාර/පරිත්‍යාග,දුම්රිය බලපත්‍ර,අලාභ හා ලියා අත්හැරීම්,තිරසර සංවර්ධන අරමුණු අංක 03 යටතේ නිරෝගී බව හා යහපැවැත්ම වෙනුවෙන් සහනාධාර-වැසිකිලි ආධාර ආදිය සඳහා

ඇස්තමේන්තු ගත වියදම වේ.

2021 සහ 2022 වර්ෂවල ආධාර/පරිත්‍යාග අවම වශයෙන් සිදු වූ අතර ,දුම්රිය බලපත්‍ර සඳහාද වැඩි වියදමක් වැය නොවූ අතර 2023 වර්ෂයේ දුම්රිය බලපත්‍ර සඳහා ඇස්තමේන්තු ගත වියදමට වඩා සත්‍ය වියදම වැඩි විය.

## 08. විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හා පාරිතෝෂිත

| වර්ෂය | ඇස්තමේන්තුව | සත්‍යගෙවීම් |
|---|---|---|
| **2021** | 950,058.00 | 780,380.99 |
| **2022** | 915,138.00 | 726,482.98 |
| **2023** | 954,500.00 | 645,441.00 |




මේ යටතේ විශ්‍රාම වැටුප්,සේවක අර්ථ සාධක මුදල්/සේ.නි.භා.අරමුදල් ඇස්තමේන්තු ගත වියදම සහ සත්‍ය වියදම දැක්වේ.

## වියදම් සාරාංශය - 2023 ( වැය විෂය අනුව)




| වැය ශීර්ෂය | වියදම් විස්තරය | මුදල | ප්‍රතිශතය % |
|---|---|---|---|
| 01 | වැටුප් හා දීමනා | 73,414,287 | 67.62 |
| 02 | ගමන් වියදම් | 542,000 | 00.50 |
| 03 | සැපයුම් හා උපකරණ | 15,284,230 | 14.08 |
| 04 | ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 10,183,000 | 9.38 |
| 05 | ප්‍රවාහන සම්බන්ධතා ආවශ්‍යක හා වෙනත් සේවා | 7,218,090 | 6.65 |
| 06 | පොළී ගෙවීම, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 660,344 | 0.61 |
| 07 | ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 313,000 | 0.29 |
| 08 | විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 954,500 | 0.88 |
| | එකතුව | 108,569,458 | 100 |

## වියදම් සාරාංශය - 2023 ( වැඩසටහන් අනුව)




| වැඩසටහන් අංකය | වැඩසටහන් විස්තරය | මුදල | ප්‍රතිශතය % |
|---|---|---|---|
| 1 | පොදු පරිපාලනය | 50,371,155.00 | **46.40** |
| 2 | සෞඛ්‍ය සේවා | 23,966,378.00 | **22.07** |
| 3 | භෞතික සැලසුම් හා මංමාවත් | 19,099,976 | **17.59** |
| 5 | පොදු උපයෝගී සේවා | 7,438,020.00 | **6.85** |
| 6 | සුභසාධක සේවා | 7,693,930.00 | **7.09** |
| | එකතුව | **108,569,458.00** | 100 |

## ප්‍රාග්ධන වියදම් සාරාංශය-2023




| වැඩසටහන් අංකය | වැඩසටහන් විස්තරය | මුදල |
|---|---|---|
| 1 | පොදු පරිපාලනය | 500,000.00 |
| 2 | සෞඛ්‍ය සේවා | 2,290,000.00 |
| 3 | භෞතික සැලසුම් හා මංමාවත් | 119,637,567.00 |
| 5 | පොදු උපයෝගී සේවා | 122,700,000.00 |
| 6 | සුභසාධක සේවා | 1,400,000.00 |
| | **එකතුව** | **264,527,567.00** |

## වත්කම් වගකීම් හා හිමිකම් විශ්ලේෂණය

### 2023.12.31 දිනට පවතින ජංගම නොවන වත්කම් රු.මි.1"375



ඉඩම් හා ගොඩනැගිලි
රු.මි.1"295



යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ
රු.මි.19



මොටර් රථ හා කරත්ත
රු.මි.34



ලී බඩු හා සවිකිරීම්
රු.මි.13



පුස්තකාල පොත්
රු.මි.8



කාර්යාල උපකරණ
රු.මි.6

### 2023.12.31 දිනට පවතින ජංගම වත්කම් රු.මි.68



අතැති තොග
රු.මි.2



සේවක ණය
රු.මි.10



ආදායම් ණයගැතියෝ
රු.මි.14



ආයෝජන
රු.මි.10



මුදල්
රු.මි.32

### 2023.12.31 දිනට පවතින ජංගම වගකීම් රු.මි.21




ණය ප්‍රාග්ධනය
රු.මි.1




ණයහිමියෝ
රු.මි.11



කලින් ලැබීම්
රු.මි.3



ආපසු ගෙවිය යුතු තැන්පතු
රු.මි.5

### 2023.12.31 දිනට පවතින ජංගම නොවන වගකීම් රු.මි.1,423



සමුච්චිත අරමුදල
හා සංචිත
රු මි 1 420




ණය ප්‍රාග්ධනය
රු මි 2

## හිමිකම් විශ්ලේෂණය

හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශයේ පරිදි 2023.12.31 දිනට සමුච්චිත අරමුදලේ ශේෂය රු.මි.45 වන අතර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම රු.මි.976 වේ.

## මූල්‍ය කර්යසාධනය ඇගයීම

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ 2020 , 2021 ,2022 හා 2023 යන වර්ෂවල ආදායම් සාරාංශ කිරීමක් පහත පරිදි සංඛ්‍යාත්මකව දැක්විය හැක.මෙම වර්ෂ වල මූල්‍ය කාර්ය සාධනය විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කිරීම සඳහා ඒ ඒ වර්ෂ වල ආදායම් හා වියදම් විශ්ලේෂණාත්මකව ඇගයීම සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ වත්කම් හා වගකීම් පිලිබඳ ඇගයීම සඳහා මූල්‍ය තත්ව ප්‍රකාශය අධ්‍යයනය කල යුතු වේ.

| ආදායම් ශීර්ෂය | 2020 | | 2021 | | 2022 | | 2023 | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ග | සත්‍ය | ඇස්තමේන්තු ග | සත්‍ය | ඇස්තමේන්තු ග | සත්‍ය | ඇස්තමේන්තු ග | සත්‍ය |
| වරිපනම් බදු | 3,817,000 | 3,834,060 | 7,280,000 | 4,958,225 | 4,573,000 | 4,783,327 | 4,318,000 | 4,370,618 |
| කුළී | 12,249,000 | 10,429,475 | 12,847,710 | 11,435,605 | 13,410,400 | 12,733,800 | 14,950,910 | 14,868,896 |
| බලපත්‍ර ගාස්තු | 1,097,2000 | 1,255,765 | 445,200 | 385,262 | 505,200 | 435,548 | 1,017,200 | 1,184,110 |
| සේවා සඳහා ගාස්තු | 3,572,000 | 2,668,992 | 3,229,000 | 4,577,718 | 3,851,800 | 4,704,346 | 5,855,600 | 5,659,480 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 9,272,000 | 3,952,987 | 5,272,000 | 5,628,700 | 5,269,000 | 8,800,050 | 6,428,000 | 6,851,679 |
| වෙනත් ආදායම් | 16,489,000 | 16,899,775 | 21,989,000 | 17,347,648 | 22,289,000 | 23,919,588 | 24,720,000 | 30,236,369 |
| ආදායම් ආධාර | 48,812,000 | 38,577,880 | 48,880,880 | 40,071,338 | 51,154,249 | 46,732,372 | 56,861,084 | 45,554,236 |
| ප්‍රාග්ධන ලැබීම් | 128,622,000 | 94,15,451 | 78,235,262 | 45,929,462 | 122,897,018 | 2,879,330 | 240,947,018 | 7,310,177 |

මෙහි දක්වා ඇත්තේ 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ පුනරාවර්තන ආදායම් හා වියදම් ඒ ඒ ආදායම් සහ වැය ශීර්ෂ වෙත බෙදී ගොස් ඇති ආකාරයයි.

2021 වර්ෂයට අනුරූපව අනෙකුත් වර්ෂයන්හි දී වරිපනම් හා බදු ඇස්තමේන්තු ප්‍රතිශතය ඉක්මවා සත්‍ය ආදායම් ප්‍රමාණය රැස් කර ඇත.2023 වර්ෂය තුලදී කුලී ආදායම් ලෙස 14,868,896 මුදල් ප්‍රමාණයක් රැස් කර ඇත.අනෙකුත් වර්ෂ වලට සාපේක්ෂව එය ඉහළ ප්‍රමාණයකි.බලපත්‍ර ගාස්තු ලෙස ඇස්තමේන්තු ගත ආදායම් ප්‍රමාණය ඉක්මවා 2020 වර්ෂ හා 2023 වර්ෂයන්හිදී මුදල් රැස් කර ඇත.වරෙන්තු හා දඩ මුදල් ලෙස 2020 වර්ෂය තුලදී අවම මුදල් ප්‍රමාණයක් ඒ ශීර්ෂය යටතේ ලැබී ඇත.ප්‍රාග්ධන ආදායම් ලෙස 2020 වර්ෂය තුලදී මුදල් ලැබීම් ඉහළ ප්‍රමාණයකි.

| වියදම් ශීර්ෂය | 2020 | | 2021 | | 2022 | | 2023 | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුව | සත්‍ය | ඇස්තමේන්තුව | සත්‍ය | ඇස්තමේන්තුව | සත්‍ය | ඇස්තමේන්තුව | සත්‍ය |
| වැටුප් හා දීමනා | 60,802,210 | 50,677,672 | 63,672,852 | 52,309,146 | 65,209,792 | 58,262,624 | 73,414,287 | 57,631,924 |
| ගමන් වියදම් | 867,000 | 449,101 | 947,000 | 361,749 | 932,000 | 815,421 | 542,000 | 1,046,276 |
| සැපයුම් හා උපකරණ | 9,970,000 | 9,558,282 | 10,603,000 | 9,642,137 | 10,489,000 | 15,444,007 | 15,284,238 | 14,401,025 |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු | 7,564,000 | 7,466,625 | 8,758,000 | 7,374,767 | 8,358,000 | 9,535,945 | 10,183,000 | 10,690,287 |
| ප්‍රවාහන සම්බන්ධතා ආවශ්‍යක හා වෙනත් සේවා | 7,066,400 | 6,278,549 | 8,548,401 | 6,332,323 | 8,663,400 | 7,596,666 | 7,218,090 | 7,553,947 |
| පොළී ගෙවීම්,ලාභාංශ හා ප්‍රසාද මුදල් | 1,469,000 | 967,116 | 1,364,066 | 1,064,072 | 759,357 | 784,357 | 660,344 | 661,069 |
| ආධාර මුදල්,දායක මුදල් හා සහනාධාර | 333,000 | 136,180 | 333,000 | 141,075 | 308,000 | 303,657 | 313,000 | 369,039 |
| විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 755,118 | 745,019 | 950,058 | 780,381 | 915,138 | 726,483 | 954,500 | 645,441 |
| ප්‍රාග් වියදම් | 135,098,550 | 104,818,802 | 83,001,570 | 48,945,374 | 128,314,279 | 4,038,397 | 246,527,567 | 15,878,782 |

වැටුප් හා දීමනා ලෙස දරා ඇති වියදම් ඇස්තමේන්තු ගත සීමාව ඉක්මවා වැය කර නොමැත.ගමන් වියදම් ලෙස 2023 වර්ෂයේදී ඇස්තමේන්තු ගත සීමාව ඉක්මවා වැය දරා ඇත.2022 වර්ෂය තුලදී සැපයුම් හා උපකරණ වෙනුවෙන් දරා ඇති මුදල වැය ප්‍රතිපාදයන් ඉක්මවා දරා ඇත.2022 හා 2023 වර්ෂයන්හිදී ප්‍රාග්ධන වත්කම් හා අළුත්වැඩියා කටයුතු සඳහා වැය ප්‍රතිපාදයන් ඉක්මවා දරා ඇත.ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා හා වෙනත් සේවා වෙනුවෙන් 2020 වර්ෂයේ අවම වැය මුදලක් දරා ඇත. ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් 2020 වර්ෂයේදී ඉහළ වැය බරක් දරා ඇති අතර එය ඊට පසු වසරයන්හිදී ක්‍රමයෙන් පහළ බැස ඇත.

මූල්‍ය තත්ව ප්‍රකාශයට අදාළව ජංගම නොවන වත්තම් සහ ජංගම වත්කම් විශ්ලේෂණය 2020 සිට 2023 වර්ෂය දක්වා පහත පරිදි විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කල හැක.




මූල්‍ය තත්ව ප්‍රකාශයට අදාළව ජංගම නොවන වගකීම් සහ ජංගම වගකීම් විශ්ලේෂණය 2020 සිට 2023 වර්ෂය දක්වා පහත පරිදි විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කල හැක.




## ජංගම අනුපාතය

ජංගම වත්කම් අනුපාතය මගින් පැහැදිලි වනුයේ ජංගම වගකීම් පියවීම සඳහා ජංගම වත්කම් වල ප්‍රමාණාත්මකභාවය මෙමගින් මනිනු ලැබේ. මෙම අනුපාතය සමාන්‍යයෙන් 2:1 අගයක් ගන්නා අතර දෙහිඕවිට ප්‍රදේශීය සභාවේ 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය තෙක් මෙම අනුපාතය පිලිවෙලින් 5:1, 8:1, 4:1, 1:1 අගයක් ගෙන ඇත.









## ක්ෂණික අනුපාතය

ජංගම වත්කම් වල තොගය ඉවත් කර ලැබෙන ක්ෂණික වත්කම් මගින් ජංගම වගකීම් පියවීම සඳහා ප්‍රමාණාත්මකභාවය මෙමගින් මනිනු ලැබේ. මෙම අනුපාතය සමාන්‍යයෙන 1:1 අගයක් ගන්නා අතර දෙහිඕවිට ප්‍රදේශීය සභාවේ 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය තෙක් මෙම අනුපාතය පිලිවෙලින් 5:1, 7:1, 4:0 ,3:1 අගයක් ගෙන ඇත.

## ආදායම් අය කිරීමේ ප්‍රගතිය

සමස්තයක් ලෙස 2023 වර්ෂයේ ආදායම් ප්‍රගතිය සැළකිය යුතු මට්ටමකට ඉහළ ගොස් ඇත. 2022 වර්ෂයේ රැස් කරන ලද ආදායම් ප්‍රතිශතය ඉක්මවා 2023 වරෂයේ ආදායම් රැස් කර ඇත. බලපත්‍ර හා කර්මාන්ත බදු හා ව්‍යාපාර බදු ආදායම් අය කිරීමේ ප්‍රගතිය ඇස්තමේන්තු ගත ආදායම ඉක්මවා ගොස් ඇත. ජංගම සේවා පැවැත්වීම,දේපළ හිමියන් වෙත ගොස් දැනුවත් කිරීම හිඟ අය කර ගැනීම් සඳහා ලිපි යොමු කිරීම නව දියුණු ගම් ප්‍රදේශයන් හඳුනා ගැනීම දේපල තහනම් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආදිය මඟින් ආදායම් රැස් කිරීම සඳහා ක්‍රියාත්මක වි ඇත. 2022 හා 2023 වර්ෂවල ආදායම් අය කිරීමේ ප්‍රගතිය පහත පරිදි වේ



# ප්‍රධාන කාර්යය සාධන දර්ශක



# 2022 - 2026 ක්‍රියාකාරී සැලැස්ම ප්‍රගතිය

| අනු අංකය | SDG අභිමතාර්ථය | SDG ඉලක්කය | කාර්යභාරය | වැඩසටහන/ ක්‍රියාකාරකම | අපේක්ෂිත නිමවුම,ප්‍රතිඵලය හා බලපෑම | කාර්ය සාධන දර්ශකය (KPI) | පාදක දත්ත | අපේක්ෂිත ඉලක්කය | අපේක්ෂිත ඉලක්කය ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | 2023 | 2023 |
| 1 | සෑම තැනකම ඇති සෑම ආකාරයකම දිළිඳුකම දුරලීම. | 7 ඉලක්ක 14 දර්ශක | නෛතික ප්‍රතිපාදන අනුව ක්‍රියාත්මක වීම | "සවියට දිරියක්" ස්වයං රැකියා අත්වැල ක්‍රියාත්මක කිරීම.<br>හෙළ බොජුන් අලෙවි පියස් ඉදි කිරීමේ ව්‍යාපෘතිය<br>ඇඟළුම් කර්මාන්ත ව්‍යාපෘතිය<br>පහන්තිර නිෂ්පාදන ව්‍යාපෘතිය | 2024 වන විට දරිද්‍රතාවය 20% අවම මට්ටමකට<br>2026 වන විට ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ආර්ථිකය 70% දක්වා වර්ධනය කිරීම. | 2023 .05. මස වන විට සෑම වසමකම සිටින දිළිඳු පවුල් හඳුනා ගැනීම.<br>2023.10.මස වන විට ඔවුන්ගේ තොරතුරු 100% ක් ලේඛනගත කිරීම.<br>2023. 12. වන මස වන විට සෑම පවුලක් සඳහාම ඔවුන්ට කළ හැකි ස්වයං රැකියාවක් හඳුන්වාදීම. ඒ සඳහා අවශ්‍ය පුහුණුව ලබාදීම.<br>ප්‍රගතිය විමසීම<br>කාබනික පොහොර භාවිතය 100% ක් ඉහල නැංවීම.<br>ආහාර සුරක්ෂිතතාවය හා 100% ක් සාගින්න දුරලීම. | ආර්ථික මට්ටම ජීවන මට්ටම ඔවුන් සමාජගත වන ආකාරය සහ සමාජයේ පිළිගැනීම.<br>අධ්‍යාපනික මට්ටම වෘත්තීය හැකියාව | වසම් 12 ක ක්‍රියාත්මක කිරීම. | 40% |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2 | සාගින්න දුරලා ආහාර සුරක්ෂිතභාවය ඇති කිරීම, පෝෂණය වැඩිදියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මාන්තයක් ප්‍රවර්ධනය කිරීම | 8 ඉලක්ක 13 දර්ශක | දිළිඳු ප්‍රජාව පිළිබඳ සත්‍ය තොරතුරු ලබා ගැනීම.<br>ඉඩම් හිමි සහ කුඩා ඉඩ කඩක් ඇති පිරිස හඳුනා ගැනීම | ගෙවතු වගාව පිළිබඳ දැනුවත් කිරීම සහ ඔවුන් හට කළ හැකි ප්‍රමාණය හඳුනා ගැනීම. ස්වයං රැකියා අත්වැල | 2024 වන විට දරිද්‍රතාවය 20% අවම මට්ටමකට ගෙන ඒම 2026 වන විට ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ආර්ථිකය 70% දක්වා වර්ධනය කිරීම. සියළුම දිළඳු ජනතාව ඇති හැකි පිරිසක් බවට පත් කිරීම. | | 2026 වන විට ග්‍රාමීය කෘෂි ආර්ථිකය සඳහා කාබනික පොහොර භාවිතය 100% ක් වර්ධනය කිරීම. ග්‍රාමීය ජනතාව කෘෂි ආර්ථික රටාවට නැඹුරු කිරීම. | වසම් 12 ක ක්‍රියාත්මක කිරීම. | 30% |
| 3 | සෑම වයසකදී ම සෞඛ්‍ය සම්පන්න හා හොඳ ජීවිතයක් ප්‍රර්ධනය කිරීම | (13 ඉ,ක්ක 27 දර්ශක) | බෝ නොවන රෝග අඩු කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | බෝ නොවන රෝග පාලනය පිළිබඳ දැන්වත් කිරීමේ වැඩසටහන් පැවැත්විම. දුමායනය සහ විෂබීජහරණ වැඩසටහන් පැවැත්වීම | මාතෘ හා ළමා මරණ අඩු කිරීම. බෝ නොවන රෝග අඩු කිරීම බෝ නොවන රෝග පාලනය කර ගැනීම සඳහා දැනුවත් කිරීම. | ඩෙංගු/වසංගත රෝග මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. මාතෘ හා ළමා දැනුවත් කිරීම. කාර්යාලීය හා ප්‍රජාව සදහා සායන පැවැත්වීම. | ඩෙංගු/ වසංගත රෝග ව්‍යාප්තිය අවම කිරීම. සිදුවිය හැකි මරණ අවම කිරීම. බෝ නොවන රෝග අඩු කිරීම | වසම් 12 ක ක්‍රියාත්මක කිරීම. | 80% |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 4 | කාටත් පිවිසිය හැකි සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් හා ජීවිත කාලය පුරා ම අධ්‍යාපනය ලබා ගැනීමට සැමට තිබෙන අයිතිය ප්‍රවර්ධනය කිරීම | 10 ඉලක්ක 11 දර්ශක | සංයුක්ත හා සමානාත්මතා වෙන් යුතු ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කරමින් සැමට ජීවිත කාලය පුරා ඉගෙනුම් අවස්ථා උදාකරදීම | පෙර පාසැල්වල ඌණතා අවම කිරීම දිවාසුරකුම් මධ්‍යස්ථාන ඇති කිරීම | පහසුකම් සැපයීම. ප්‍රතිපාදන වෙන්කර ගැනීම | අංග සම්පූර්ණ පෙර පාසල් පද්ධතියක් ඇති කිරීම 2025 වන විට දිවා සුරැකුම් මධ්‍යස්ථාන පහසුකම් ඇති කිරීම | දරුවන් වැඩි ප්‍රමාණයකට අධ්‍යාපන අවස්ථා උදා කිරීම. | වසම් 12 ක ක්‍රියාත්මක කිරීම. | 20% |
| | | | | | | | වැඩි ප්‍රමාණයකට පහසුකම් සැළසීම. | වසම් 12 ක ක්‍රියාත්මක කිරීම. | 70% |
| (14.1) | ප්‍රදේශය තුළ අවිධිමත් ලෙස කසළ බැහැර කිරීම හේතුවෙන් පරිසරයට හානි වී නොතිබීම. | අනුකූල වේ | | |
| (14.2) | ප්‍රදේශයේ කර්මාන්තශාලා වලින් පිටවන අහිතකර අපද්‍රව්‍ය වලින් පරිසරයට සිදුවන හානිය පාලනය | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන තිබීම. | | | |
| **15.** | **අතුරු ව්‍යවස්ථා** | | | |
| (15.1) | මහ නගර සභා, ප්‍රාදේශීය සභා ආඥා පනතේ 272 වගන්තිය/ නගර සභා ආඥා පනතේ 157 වගන්තිය/ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා සම්පාදනය කළ යුතු කාර්යයන් සඳහා අතුරු ව්‍යවස්ථා සම්පාදනය කොට තිබීම. | අනුකූල වේ | | |
| (15.2) | ඉහත සඳහන් අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් සභාව විසින් සිදු කළ යුතු ක්‍රියාකාරකම් වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ සඳහන් කොට තිබීම. | අනුකූල වේ | | |
| (15.3) | එම ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම සඳහා වාර්ෂික අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කොට තිබීම. | අනුකූල වේ | | |
| 16. | **මහජනයා වෙත තොරතුරු ලබා දීම.** | | | |
| (16.1) | තොරතුරු දැනගැනීමේ පනත අනුව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ නිසි ලේඛනයක් පවත්වාගෙන ගොස් තිබීම. | අනුකූල වේ | | |
| (16.2) | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමට පහසුකම් සළසා තිබීම. | අනුකූල වේ | | |
| (16.3) | තොරතුරු දැනගැනීමේ පනතේ 08වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හා වසරකට වරක් වාර්තා ඉදිරිපත් කොට තිබීම. | අනුකූල වේ | | |
| 17. | **ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම** | | | |
| (17.1) | සභාවට ලැබෙන සියලු ම ගොඩනැගිලි සැලසුම් වාර්තා කිරීමට ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| (17.2) | අයදුම්පත් වල ගැටලු සම්බන්ධයෙන් දින 05ක් ඇතුළත අදාළ පුද්ගලයන්ට දැනුම් දී තිබීම. | අනුකූල වේ | | |
| (17.3) | අයදුම්පත ලැබීමෙන් සතියක් ඇතුළත පවත්වනු ලබන සැලසුම් කමිටුවේ ප්‍රථම රැස්වීමට අයදුම්පත් ඉදිරිපත් කොට තිබීම. | අනුකූල වේ | | |
| (17.4) | පුරවැසි ප්‍රඥප්තියෙහි සඳහන් නියමිත දිනට (සති 8ක් තුළ) ගොඩනැගිලි සැලසුම් වලින් 80% කට වඩා අනුමත කොට තිබීම. | අනුකූල වේ | | |
| 18. | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| (18.1) | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කොට තිබීම. | අනුකූල වේ | | |
| (18.2) | එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19. | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| (19.1) | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| (19.2) | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | | |
| (19.3) | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ | | |
| (19.4) | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ | | |
| 20. | **විද්‍යුත් - පළාත් පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම.** | | | |
| (20.1) | 2018.07.19 දිනැති පළාත් පාලන චක්‍ර ලේඛ අංක 2018/ e- Local Government - 01 අනුව අන්තර්ජාලය හරහා අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට පුරවැසියන්ට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | | |
| (20.2) | අන්තර්ජාලය හරහා ගෙවීම් සිදු කිරීමට පුරවැසියන්ට පහසුකම් සලසා තිබීම. | | මෘදුකාංගය ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇත. | මෘදුකාංගය ලබා ගැනීම සඳහා කටයුතු කිරීම හා අන්තර්ජාලය හරහා ගෙවීම් සිදු කිරීමට පුරවැසියන්ට පහසුකම් සලසා දීම. |

| | | | | |
|---|---|---|---|---|
| (20.3) | පාරිභෝගිකයින්ට හිතකර සේවාවක් සැපයීම සඳහා පෙරටු කාර්යාල (Front Offices) හා පාරිභෝගික සේවා මධ්‍යස්ථාන හඳුන්වා දී තිබීම.<br>පාරිභෝගිකයින්ට හිතකර සේවාවක් සැපයීම සඳහා පෙරටු කාර්යාල කාර්යාල (Front Offices) හා පාරිභෝගික සේවා මධ්‍යස්ථාන හඳුන්වා දී තිබීම. | අනුකූල වේ | | |

# මානව සම්පත් පැතිකඩ



# මානව සම්පත් පැතිකඩ

මානව සම්පත් යන්න බොහෝ සංවිධාන තුළ සම්ප්‍රදායික පරිපාලන සේවක සහ කාර්ය එල කළමනාකාරීත්ව ආශ්‍රිත විවිධ සංවිධාන තුළ විස්තර වෙන සංයුතියකි. සේවක සබඳතා සහ සම්පත් සැලසුම්කරණයද ඊට අඩංගු වේ. කාර්මික සහ සංවිධානාත්මක මනෝවිද්‍යාවේදී සංවර්ධනය කරන ලද සංකල්ප මත එය රඳා පවතී. සන්ධර්භය අනුව මානව සම්පත් යන්නට අවම වශයෙන් අදාල තේරුම් ගැනීම් දෙකකි. මුල් භාවිතය දේශපාලන ආර්ථික සහ ආර්ථික විද්‍යාවෙන් පැවතේ. එහිදී එය සම්ප්‍රදායානුකූලව ශ්‍රමය ලෙස හැඳින්වේ. එය නිෂ්පාදන සාධක හතරෙන් එකක්ද විය.

එම සංවිධානයේ බඳවාගැනීම්, අස්කිරීම්, පුහුණුව සහ වෙනත් සේවා කටයුතු පිළිබඳව ක්‍රියා කරන කොටසට අයත්වේ. මෙම ලිපියට නිර්වචන දෙකම අඩංගු වේ. මානව සම්පත් යන්නෙහි ඉලක්කය වන්නේ සංවිධානයේ මානව ප්‍රාග්ධනයෙන් උපරිම ලාභයක් ලබාගැනීමටත් මූල්‍යමය අවධානය අවම කිරීමත්ය. මෙම කාර්යභාරයන් බලපාන ආකාරයට නිත්‍යානුකූලව සාධාරණව සහ සමාන ආකාරයට සිදුකිරීම මානව සම්පත් කළමනාකරුවන්ගේ වගකීම වේ. මානව සම්පත් කළමනාකරණය පහත දැක්වෙන අත්‍යාවශ්‍ය ශ්‍රිතයන් ඉටු කරයි

- ❖ බඳවා ගැනීම් ක්‍රියාවලි.
- ❖ තෝරාගැනීම.
- ❖ පුහුණුව සහ සංවර්ධනය.
- ❖ කාර්ය එල ආගයීම
- ❖ උසස්වීම්.
- ❖ සමතිරික්තය.
- ❖ කාර්මික සහ සේවක සබඳතා.
- ❖ පෞද්ගලික දත්තවල සියලූම වාර්තා තබාගැනීම.
- ❖ වන්දි, විශ්‍රාම වැටුප්, වෙනත් ප්‍රතිලාභ ගෙවීම් අංශයත් සමග එක්ව කිරීම.
- ❖ අභ්‍යන්තර සේවාදායකයින්ට වැඩ පිළිබඳ ගැටළුවලට රහසිගත උපදෙස් ලබාදීම.
- ❖ වෘත්තීය සංවර්ධනය.

## මානව සම්පත් පැතිකඩ



## මානව සම්පත් කළමනාකරණ අංශයේ අරමුණු

- සේවාලාභි ප්‍රඥප්තියට අනුගත වීම තුලින් ආයතනික ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට වගවීම.
- අභ්‍යන්තර හා බාහිර සේවාලාභීන් හට කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් සැපයීමට වගවීම.
- පුහුණුව තුලින් සියළුම නිළධාරීන් දැනුවත් භාවයෙන් සන්නද්ධ කිරීම.
- සැම විටම නිවැරදි හා සත්‍ය තොරතුරු සපයන බවට සහතික වීම.
- සැම විටම සේවාලාභීන් හට තෘප්තිමත් සේවාවක් සැපයීම සහතික වීම.
- ක්‍රියාවේ සුරක්ෂිතතාවය ආරක්ෂා කිරීම හා සියළු මිනිස් බල අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීම.
- වාහන නඩත්තුව නිසි පරිදි සිදු කිරීම.
- ස්ථාවර වත්කම් නඩත්තුව හා පරිපාලනය

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 99ක් වන අතර ඉන් දැනට සේවයේ යෙදෙන කාර්ය මණ්ඩලය තුළ ද්විතියික තනතුරු 09ක් පුරප්පාඩු වන අතර ප්‍රාථමික සේවක තනතුරු 03ක් පුරප්පාඩු ලෙස පවතී.

**ද්විතියික තනතුරු**

| | |
|---|---|
| සංවර්ධන නිලධාරී | 03 |
| කාර්මික නිලධාරී | 01 |
| පුස්තකාලයාධිපති | 02 |
| ආදායම් පරීක්ෂක | 02 |
| තාක්ෂණික සහකාර | 01 |

**ප්‍රාථමික තනතුරු**

| | |
|---|---|
| වැඩ/ ක්ෂේත්‍ර පරිපාලක | 01 |
| රියදුරු | 01 |
| මුරකරු | 01 |

## සභාවේ කාර්යය සාධනයට මානව සම්පතෙහි අතිරික්තය / හිඟය බලපෑම

බල ප්‍රදේශයේ ජනතාවට කාර්යක්ෂම සේවයක් සැපයීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මානව සම්පත සෘජුව බලපාන අතර මානව සම්පතෙහි හිඟයක් ඇති විට එය කාර්ය සාධනය පහළ වැටීමට ප්‍රධාන හේතුව වේ. ද්විතියික අංශයේ තනතුරු පුරප්පාඩු 09ක් මේ වන විට පවතින අතර පවත්නා කාර්ය මණ්ඩලය ඉහළ කළමනාකාරිත්වය විසින් නිසි පරිදි රාජකාරී සඳහා යෙදවීම මත කාර්යාලයේ හා මෙම සභාවට අයත් ආයුර්වේද, පුස්තකාල, පෙර පාසල, ආදාහනාගාරය, කසල කළමනාකරණ මධ්‍යස්ථානය ආදී උප කාර්යාලයන්ගේද කටයුතු විධිමත්ව හා ක්‍රමවත්ව පවත්වාගෙන යාමට එය හේතු වී ඇත. එමෙන්ම බල ප්‍රදේශයේ ජනතාව උදෙසා සපයනු ලබන සේවාවන් නිසි පරිදි පවත්වා ගෙන යාමට ප්‍රාථමික අංශයේ සේවක මහත්ම/ මහත්මීන්ගේ අවශ්‍යතාවය දැඩිව බලපානු ලබයි. ඒ අනුව පවත්නා කාර්ය මණ්ඩලය තුළ ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු ප්‍රමාණවත් නොවීම හේතුවෙන් පෙර වසරවල සිදු කළ අයුරින්ම මෙම වසරේද සේවා අවශ්‍යතාවය මත සේවා ගිවිසුම් මත සේවක මහත්ම/ මහත්මීන් 24 දෙනෙකු සේවය සඳහා බඳවා ගෙන ඇති අතර ඔවුන්ගේ ගිවිසුම්ගත සේවා කාලය මෙම වසරේද දීර්ඝ කර පවත්වාගෙන යාමට කටයුතු කළ බැවින් ආයතනයේ කාර්යයසාධනය හා ලබා දෙන සේවාවේ ගුණාත්මතභාවයට හානියක් සිදු නොවී පවත්වාගෙන යාමට හැකියාව ලැබී ඇත. මෙකී මානව සම්පත් හිඟය/ අතිරික්තය සමස්ථයක් ලෙස රාජකාරී ඉටු කිරීමේදී ආවරණය කර ගැනීමට හැකි වීම හේතුවෙන් ගැටලුකාරී තත්වයන් උද්ගතවීම මත කාර්යය සාධනයට වන බලපෑමේ ප්‍රවණතාවය අඩු මට්ටමක පවත්වා ගෙන යාමට හැකිවී ඇත



## සේවා ස්ථරය හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව ස්ථිර කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| ප්‍රාථමික | 38 | 09 |
| ද්විතීක | 05 | 36 |
| තෘතීක | 0 | 0 |
| ජ්‍යෙෂ්ඨ | 0 | 01 |

## වයස් කාණ්ඩය අනුව සේවක සංයුතිය



# කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධන

ධාරිතා ගොඩනැගීම යන යෙදුම කණ්ඩායම්වලට කුසලතා සහ හැකියාවන් වර්ධනය කිරීමට සහ ශක්තිමත් කිරීමට හැකි ක්‍රියාවලියකි. මෙය අනෙක් අතට, කණ්ඩායමට ඔවුන්ගේ අරමුණු සාක්ෂාත් කර ගැනීමටත්, සේවා ස්ථානයේ අභියෝග කළමනාකරණය කිරීමටත්, යහපාලනය ස්ථාපිත කිරීමටත්, ආයතනික වර්ධනයට වඩාත් ඵලදායී ලෙස දායක වී ඇත



| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | පැවැත් වූ දිනය | කාල සීමාව | වැඩසටහනේ කාල සීමාව සමස්ථ ආයෝජනය | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) |
|---|---|---|---|---|---|---|
| 01. | ආයතන සංග්‍රහය හා ගිණුම්ක්‍රම පිළිබඳ පුහුණුව | 32 | 2023.02.24 | එක්දින | 4950.00 | දේශීය |
| 02. | පළාත් පාලන නීතිය | 44 | 2023.04.21 | එක්දින | 5595.00 | දේශීය |
| 03. | රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසහන | 22 | 2023.09.12 | පැය 02 | - | දේශීය |
| 04. | මත්ද්‍රව්‍ය නිවාරණය කිරීමේ පුහුණු වැඩසටහන | 73 | 2023.10.05 | එක්දින | 11780.00 | දේශීය |
| 05. | අයවැය සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 50 | 2023.10.25 | එක්දින | 3000.00 | දේශීය |
| 06. | කාර්යාල ක්‍රම හා ලිපිගොනුකරණය | 33 | 2023.11.07 | පැය 02 | - | දේශීය |
| 07. | කාර්යාල ක්‍රම හා ලිපිගොනුකරණය | 45 | 2023.12.13 | එක්දින | 4540.00 | දේශීය |
| 08. | ශ්‍රම අභිමන් සේවක ඇගයීම් හා අභිප්‍රේරණ වැඩසටහන | 117 | 2023.12.29 | එක්දින | 54530.00 | දේශීය |

# මූල්‍ය වාර්තා



විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. : එජීපීඑල්පී/කේජී/ඒ/ඩීපීඑස්/එෆ්ඒ/05/2023/35 ඔබේ අංකය / உமது இல. / Your No. : දිනය / திகதி / Date : 2023 මැයි 31 දින

ලේකම්,

දෙහිඕවිට ප්‍රාදේශීය සභාව.

**දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස් වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශකරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හාඅනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) පනතේ 6(1)(ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) පනතේ 6(1)(ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

1.6 අනුකූල නොවීම

1.6.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 (3) | වර්ෂ 02 ඉක්මවූ රු.1,731,530 ක තැන්පතු 91 ක් නිරවුල් කර නොතිබුණු අතර ආදායමට ගත යුතු රු.248,500 ක් වූ තැන්පතු 05 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. |
| (ආ) | පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 02/2010 දරන චක්‍රලේඛයේ 4(xiii) ඡේදය | වසර 05කට වරක් තක්සේරු කළ යුතු වරිපනම් දේපළ, වසර 15කින් සිදුකර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහය 117.1 | එකතු කරන ලද මුදල් දිනපතා බැංකුගත කළ යුතු වුවත්, ඊරියගොල්ල හෙළ බොජුන් හලේ ආදායම ප්‍රමාද කර සතියකට වරක් බැංකුගත කර තිබුණි |
| (ඈ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 01 දිනැති 03/2020 චක්‍රලේඛයේ | |
| (i) | 14 ඡේදය | මස් මාළු වෙළඳසැල් සඳහා වාර්ෂික අවම ලංසු මුදල වසර 03 කට වරක් තක්සේරු කර නොතිබුණි |
| (ii) | 4 හා 5 ඡේදය | දෙහිඕවිට නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 05 ක් සඳහා කුලී පිළිබඳ කොන්දේසි සහිතව ගිවිසුම්ගත වී නොතිබුණි. එම කඩ කාමරවලින් ඇප තැන්පත්, හිඟ කුලී හා දඩ ලෙස රු.1,947,364 ක් අයකර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,726,381 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,639,872 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත්කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,118,000 | 4,370,619 | 4,942,471 | 3,499,921 | 4,573,000 | 4,783,327 | 4,906,095 | 3,969,913 |
| කුලී | 14,218,660 | 14,868,896 | 14,984,474 | 5,581,456 | 13,410,400 | 12,733,800 | 11,956,293 | 5,893,625 |
| බලපත්‍ර ගාස්තු | 1,017,200 | 1,184,111 | 1,146,111 | - | 505,200 | 435,548 | 463,548 | - |
| වෙනත් ආදායම් | 9,003,600 | 11,379,281 | 10,807,170 | 861,193 | 6,403,800 | 9,003,177 | 8,014,503 | 1,039,357 |
| | 28,357,460 | 31,802,907 | 31,880,226 | 9,942,570 | 24,892,400 | 26,955,852 | 25,340,439 | 10,902,895 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ ආදායම රු.10,902,895ක් වූ අතර, වර්ෂයේ බිල්කිරීම් රු.31,802,907ක් විය. ඒ අනුව, රැස්කළ යුතු සමස්ත ආදායම රු.42,705,802ක් වුවද, රැස් කරන ලද ආදායම රු.31,880,226ක් වීමෙන් තවදුරටත් රැස්කර ගතයුතු සමස්ත ආදායම ප්‍රතිශතයක් ලෙස සියයට 25.35ක මට්ටමක පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රැස්කළ ආදායම සමඟ සැසැඳීමේදී ව්‍යාපාර බදු හා මස් මාළු කඩ කුලී යන ආදායම් විෂයයන්ගේ රැස්කළ ආදායම, ඇස්තමේන්තුගත ආදායමට වඩා පිළිවෙලින් සියයට 41කින් හා 07 කින් වැඩි වී තිබුණු අතර වරිපනම් බදු හා අක්කර බදු ආදායම් විෂයයන්ගේ රැස්කළ ආදායම, ඇස්තමේන්තුගත ආදායමට වඩා පිළිවෙලින් සියයට 5.5 කින් හා 31 කින් අඩු වී තිබුණි.

2.2.3 වරිපනම් හා බදු

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු හිඟ වරිපනම් බදු ශේෂය රු.1,848,514 ක් වූ අතර, එම ශේෂය තුළ වසර 01 ට අඩු රු.585,956 ක ශේෂ ද, වසර 01 ට වැඩි රු.1,262,558 ක ශේෂ ද විය. එම හිඟ ශේෂ අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ අක්කර බදු ශේෂය රු.1,650,445 ක් වූ අතර, වසර 05ක කාලයක් ඉක්මවා ඇති අයවිය යුතු ශේෂය රු. 1,218,601 ක් විය.

2.2.4 කුලී

සමාලෝචිත වර්ෂය අවසානයට කඩකාමර කුලී හා දඩ මුදල් හිඟ ශේෂය රු. 5,648,028 ක් වූ අතර එම ශේෂය තුළ වසර 01 ක් ඉක්මවූ රු.4,844,858 ක ශේෂ විය.

2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රු.803,000 වැයකර ඉදිකළ මාදොල හෙළ බොජුන්හලේ ඉදිකිරීම් නිම වී මාස 06 ක් ගත වී තිබුණ ද, මේ දක්වාම අභාවිතව පවතී.

(ආ) වර්ෂ 02 ත් වර්ෂ 14 ත් අතර කාලයක සිට හිඟව පවතින වරිපනම් බදු රු.313,656 ක් විය.

(ඇ) 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා දේපළ 06 ක් බදු දීමට නොහැකි වීමෙන් රු.5,945,873 ක ඇස්තමේන්තුගත ආදායමක් අහිමි වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු මුද්දර බදු තැන්පත් ගිණුමේ ශේෂය රු.802,200ක් වූ අතර, ඉන් රු.691,752 ක් වර්ෂ 2015 - 2016 අතර කාලයක සිට නිරවුල් කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්ය සාධනය

--------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු, උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව පැනවිය යුතු අතුරු ව්‍යවස්ථා 30කින් අතුරු ව්‍යවස්ථා 22ක් පනවා ගෙන තිබුණි. දැන්වීම් පුවරු ආදායම් අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවාගෙන නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිණුම් අතර මුදල් මාරු කිරීම යනුවෙන් සඳහන්කර රු.158,225 ක හර ශේෂයක් 2018 වසරේ සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ) දීගලවත්ත ජල ව්‍යාපෘතිය වෙනුවෙන් ඉදි කළ ළිඳේ ජලය පානය කිරීමට නුසුදුසු වූයෙන් එම ඉදි කිරීම වෙනුවෙන් 2022 අගෝස්තු මාසයේ ගෙවිය යුතු රු. 687,231 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

අනුමත 60 දෙනෙකුගේ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු 26 ක් විය. සේවා ගිවිසුම් මත තනතුරු 24 ක් ද, 09 දෙනෙකු දරන්නාට පෞද්ගලික වන සේ ද අනුමත කර තිබුණි.

3.4 වාහන පරිපාලනය

---

(අ) සභාව සතු රු.587,284 ක් වූ වයිබ්රේටි රෝල මාස 6 කට අධික කාලයක් සිට අභාවිතව පවතී.

(ආ) 2015 වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලද රු.2,594,995 ක් වූ කම්පැක්ටර් ටේලරය ලද දින සිටම වසර 07 කට අධික කාලයක් අභාවිතව රථ ගාලක් තුළ දිරාපත් වෙමින් පවතී.

(ඇ) වටිනාකම රු.3,000,000 ක් වූ ගිලන් රථය 2017 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ 2.1 ඡේදය පරිදි පවරා ගෙන නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

අයවැය පාලනය

---

පහත සඳහන් කරුණු හේතුවෙන් වාර්ෂික අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 77 කට අදාළව එකතුව රු. 116,653,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 51 කට අදාළව එකතුව රු. 140,660,028 ක්වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 99.96 දක්වා පරාසයක ඉතිරිවීම් තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 37 ක මුළු ප්‍රතිපාදනය ඉක්මවා රු.7,279,197 ක් වැයකර තිබුණි.

ටී.පී.එම්. කුමානායක

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.

## මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය
## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| 2023 අයවැය | | | සටහන් | 2023/12/31 | 2022/12/31 |
|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන ආදායම් | | | |
| 4,573,000 | 10 | වරිපනම් බදු | | 4,370,618.50 | 4,783,327.10 |
| 13,410,400 | 20 | කුළී | | 14,868,895.96 | 12,733,799.95 |
| 505,200 | 30 | බලපත්‍ර ගාස්තු | | 1,184,110.50 | 435,548.50 |
| 3,851,800 | 40 | සේවා සඳහා ගාස්තු | | 5,659,479.59 | 4,704,345.92 |
| 5,269,000 | 50 | වරෙන්තු ගාස්තු හා දඩ | | 6,851,679.21 | 8,800,050.48 |
| 22,289,000 | 60 | වෙනත් ආදායම් | | 30,236,368.72 | 23,919,588.03 |
| 51,154,249 | 70 | ආදායම් ආධාර | | 45,554,235.63 | 46,732,371.53 |
| | | පුනරාවර්තන ආදායම් එකතුව | | **108,725,388.11** | **102,109,031.51** |
| | | පුනරාවර්තන වියදම් | | | |
| 65,209,792 | 01 | වැටුප් හා දීමනා | | 57,631,923.79 | 58,262,623.61 |
| 932,000 | 02 | ගමන් වියදම් | | 1,046,276.40 | 815,420.61 |
| 10,489,000 | 03 | සැපයුම් හා උපකරණ | | 14,401,024.87 | 15,444,006.90 |
| 8,358,000 | 04 | ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු | | 10,690,286.68 | 9,535,945.13 |
| 8,663,400 | 05 | ප්‍රවාහන සම්බන්ධතා, ආවශ්‍යක හා වෙනත් සේවා | | 7,553,946.94 | 7,596,666.34 |
| 759,357 | 06 | පොළී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | | 661,068.57 | 784,356.96 |
| 308,000 | 07 | ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | | 369,038.72 | 303,657.05 |
| 915,138 | 08 | විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | | 645,441.00 | 726,482.98 |
| | | පුනරාවර්තන වියදම් එකතුව | | **92,999,006.97** | **93,469,159.58** |
| | | පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ / (අඩු) පුනරාවර්තන ආදායම | | **15,726,381.14** | **8,639,871.93** |
| | | ප්‍රාග්ධන ආදායම් | | | |
| 122,897,018 | 80 | මූලධන ආධාර | | 7,310,177.22 | 2,879,330.00 |
| | | | | **7,310,177.22** | **2,879,330.00** |
| | | ප්‍රාග්ධන වියදම් | | | |
| 126,400,000 | 09 | ප්‍රාග්ධන වැය | | 15,321,652.47 | 3,738,396.61 |
| 600,000 | 09 | පුස්තකාල පොත් මිලදී ගැනීම | | 557,129.50 | 300,000.00 |
| 1,314,279 | 10 | ණය ආපසු ගෙවීම | | - | - |
| | | | | **15,878,781.97** | **4,038,396.61** |
| 701 | | අතිරික්තය / (ඌනතාවය) | 01 | **7,157,776.39** | **7,480,805.32** |

සකස් කළේ
(අත්සන)
ආර් එච් එම් එන් පත්මසිරි
කළමනාකරණ සේවා නිලධාරි

පරීක්ෂා කළේ
(අත්සන)
බී එස් එස් කුමාරි
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි

අනුමත කළේ
(අත්සන)
ඩබ් ඩී එස් පී වල්පොළ
ලේකම්

## මූල්‍ය තත්ව ප්‍රකාශය
2023 දෙසැම්බර් 31 දිනට

| | | සටහන් | 2023/12/31 | 2022/12/31 |
|---|---|---|---|---|
| 110 | ජංගම නොවන වත්කම් | 02 | **1,375,635,606.66** | **1,361,805,495.23** |
| | | | | |
| | ජංගම වත්කම් | | | |
| 120 | අතැති තොග | 03 | 2,393,829.54 | 1,994,734.80 |
| 140 | සේවක ණය | | 9,606,652.03 | 7,757,668.00 |
| 150 | අයකරගත හැකි උපයෝගී සේවා | 04 | - | 149,360.00 |
| 160 | ආදායම් ණයගැතියෝ | 05 | 13,854,652.17 | 69,477,351.38 |
| 170 | පෙර ගෙවුම් | 06 | 0.00 | 50,250.00 |
| 180 | ආයෝජන | 07 | 9,864,682.17 | 23,296,778.42 |
| 190 | මුදල් | 08 | 32,394,516.21 | 10,173,666.14 |
| | ජංගම වත්කම් එකතුව | | **68,114,332.12** | **112,899,808.74** |
| | | | | |
| | අඩු කළා: ජංගම වගකීම් | | | |
| 220 | ණය ප්‍රාග්ධනය | | **1,572,420.87** | **1,437,567.15** |
| 230 | ණය හිමියෝ | 09 | 11,053,043.63 | 18,317,538.22 |
| 240 | කලින් ලැබීම් | 10 | 2,759,496.59 | 2,650,308.14 |
| 250 | ආපසු ගෙවිය යුතු තැන්පතු | 11 | 5,156,552.39 | 4,946,306.05 |
| | ජංගම වගකීම් එකතුව | | **20,541,513.48** | **27,351,719.56** |
| | | | | |
| | කාරක ප්‍රාග්ධනය / ඌණ කාරක ප්‍රාග්ධනය | | **47,572,818.64** | **85,548,089.18** |
| | ශුද්ධ වත්කම් | | **1,423,208,425.30** | **1,447,353,584.41** |
| | | | | |
| | **මුදල් යොදවන්නේ :** | | | |
| | - | | | |
| | ජංගම නොවන වගකීම් | | | |
| 210 | සමුච්චිත අරමුදල හා සංචිත | 12 | 1,420,724,989.63 | 1,443,297,727.87 |
| 220 | ණය ප්‍රාග්ධනය | | 2,483,435.67 | 4,055,856.54 |
| | | | **1,423,208,425.30** | **1,447,353,584.41** |

සකස් කළේ

ආර් එච් එම් එන් පත්මසිරි
කළමනාකරණ සේවා නිලධාරි

පරීක්ෂා කළේ

බී එස් එස් කුමාරි
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි

අනුමත කළේ

ඩබ් ඩී එස් පී වල්පොල
ලේකම්

## ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය
## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| විස්තරය | සම්මුච්ච්ත ලාභ / අලාභ | මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය |
|---|---|---|
| 2022/01/01 දිනට ශේෂය | **55,061,453.73** | **55,061,453.73** |
| **වැරදි නිවැරදි කිරීම** | 19,126,292.52 | 19,126,292.52 |
| **නැවත ප්‍රකාශිත ශේෂය** | 74,187,746.25 | 74,187,746.25 |
| **කාලච්ඡේදය සඳහා වූ අතිරික්තය / ඌණතාවය** | 7,480,805.32 | 7,480,805.32 |
| 2022/12/31 දිනට ශේෂය | **81,728,129.88** | **81,668,551.57** |
| **වැරදි නිවැරදි කිරීම** | (43,638,298.20) | (43,638,298.20) |
| **නැවත ප්‍රකාශිත ශේෂය** | 38,089,831.68 | 38,030,253.37 |
| **කාලච්ඡේදය සඳහා වූ අතිරික්තය / ඌණතාවය** | 7,157,776.39 | 7,157,776.39 |
| 2023/12/31 දිනට ශේෂය | **45,247,608.07** | **45,188,029.76** |

සකස් කළේ

ආර් එච් එම් එන් පත්මසිරි
කළමනාකරණ සේවා නිලධාරි

පරීක්ෂා කළේ

බී එස් එස් කුමාරි
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි

අනුමත කළේ

ඩබ් ඩී එස් පී වල්පොල
ලේකම්

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | | 2023/12/31 | 2022/12/31 |
|---|---|---|---|
| | මෙහෙයුම් කටයුතු වලින් ජනිත වු මුදල් ප්‍රවාහයන් | | |
| | අය ශීර්ෂ ලැබීම් | | |
| 10 | වරිපනම් හා බදු | 4,942,471.41 | 4,906,095.06 |
| 20 | කුළී | 14,984,473.59 | 11,956,293.02 |
| 30 | බලපත්‍ර ගාස්තු | 1,146,110.50 | 463,548.50 |
| 40 | සේවා සඳහා ගාස්තු | 5,659,479.59 | 4,704,345.92 |
| 50 | වරෙන්තු ගාස්තු හා දඩ මුදල් | 6,736,091.83 | 9,785,444.07 |
| 60 | වෙනත් ආදායම් | 29,779,844.56 | 75,382,175.66 |
| 70 | ආදායම් ආධාර | 45,454,235.63 | 42,545,347.03 |
| | වෙනත් ලැබීම් | 23,541,801.13 | 30,676,342.98 |
| | මුළු ලැබීම් එකතුව | **132,244,508.24** | **180,419,592.24** |
| | | | |
| | අඩු කළා: | | |
| | අය ශීර්ෂ ගෙවීම් | | |
| 01 | වැටුප් හා දීමනා | (57,527,805.57) | (57,362,183.20) |
| 03 | සැපයුම් හා උපකරණ | (13,986,130.12) | (13,889,173.41) |
| 04 | ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | (10,436,957.18) | (8,905,214.12) |
| 05 | ප්‍රවාහන සම්බන්ධතා, ආවශ්‍යක හා වෙනත් සේවා | (5,958,297.41) | (6,107,551.14) |
| 06 | පොළී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | (661,068.57) | (784,356.96) |
| 07 | ආධාර මුදල්,දායක මුදල් හා සහනාධාර | (141,775.63) | (100,857.21) |
| 08 | විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | (595,864.00) | (669,828.98) |
| | වෙනත් ගෙවීම් | (26,670,576.50) | (31,560,503.24) |
| | මුළු වියදම් එකතුව | **(115,978,474.98)** | **(119,379,668.26)** |
| | මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වු ශුද්ධ මුදල් ප්‍රවාහය | **16,266,033.26** | **3,909,346.17** |
| | | | |
| | ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන් | | |
| | ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීමට/ මිලදී ගැනීමට හෝ ඉදි කිරීමට දැරූ ආයෝජන / ප්‍රාග්ධන පිරිවැය | (10,237,212.05) | (1,567,890.36) |
| | ස්ථාවර තැන්පත් ආයෝජන | (7,000,000.00) | (25,074,269.43) |
| | ස්ථාවර තැන්පත් ආපසු ගැනීම | 21,000,000.00 | 28,022,145.35 |
| | ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වු ශුද්ධ මුදල් ප්‍රවාහය | **3,762,787.95** | **1,379,985.56** |
| | | | |
| | මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන් | | |
| | | | |
| | ප්‍රාග්ධන ආධාර ලැබීම් | 3,629,596.01 | - |
| | දේශීය ණය සංවර්ධන අරමුදල - ණය ආපසු ගෙවීම | (1,437,567.15) | (1,314,278.76) |
| | මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වු ශුද්ධ මුදල් ප්‍රවාහය | **2,192,028.86** | **(1,314,278.76)** |
| | | | |
| | මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩි වීම/ (අඩු වීම) | 22,220,850.07 | 5,898,985.89 |
| | කාලපරිච්ඡේදය ආරම්භයේ වු මුදල් හා මුදල් සමාන දෑ | 10,173,666.14 | 4,274,680.25 |
| | කාලපරිච්ඡේදය අවසානයේ වු මුදල් හා මුදල් සමාන දෑ | **32,394,516.21** | **10,173,666.14** |
| | | | |

| | | | |
|---|---|---|---|
| | බැංකු ශේෂයන් : | **2023/12/31** | **2022/12/31** |
| | ලංකා බැංකුවේ ජංගම ගිණුම - 2235101 | 30,837,856.65 | 8,675,463.67 |
| | ලංකා බැංකුවේ ජංගම ගිණුම - 2235102 | 480,823.57 | 773,382.45 |
| | ලංකා බැංකුවේ ජංගම ගිණුම - 2235105 | 1,032,747.91 | 681,731.94 |
| | ලංකා බැංකුවේ ජංගම ගිණුම - 2235106 | 43,088.08 | 43,088.08 |
| | | **32,394,516.21** | **10,173,666.14** |

සකස් කළේ

ආර් එච් එම් එන් පත්මසිරි
කළමනාකරණ සේවා නිලධාරි

පරීක්ෂා කළේ

බී එස් එස් කුමාරි
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි

අනුමත කළේ

ඩබ් ඩී එස් පී වල්පොල
ලේකම්

## ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන්

### 1.වාර්තා කරනු ලබන ඒකකය

### 1.1.පළාත් පාලන ආයතනයේ තොරතුරු

රුවන්වැල්ල හා යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් වෙන් වී රුවන්වැල්ල මැතිවරණ කොට්ඨාශයෙන් ග්‍රාම සේවා වසම් 16 ක් හා දැරණියගල මැතිවරණ කොට්ඨාශයෙන් ග්‍රාම සේවා වසම් 23 ක් එකතු වී සබරගමුව පළාතට අයත් දිස්ත්‍රික්ක දෙකකින් කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අනෙකුත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ අතර විශාලත්වයෙන් හතර වන ස්ථානය ගන්නා අතර එහි මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 18,608.09 කි.මෙම බල ප්‍රදේශයේ ජනගහනය 94,529ක් වන අතර ගම්මාන 146 කින් යුක්ත වේ.

දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පරිපාලන මායිම් ලෙස උතුරින් රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට හා යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට ද ,දකුණින් රත්නපුර දිස්ත්‍රික්කයට ද,බටහිරින් බස්නාහිර පළාත් මායිම හා සබරගමුව පළාත් මායිමට ද ,නැගෙනහිරින් දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට ද මායිම් වේ.

### 1.2.ප්‍රධාන ක්‍රියාකාරකම්

දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් ප්‍රජා සේවාවන් රැසක් ඉටු කරනු ලබයි.එනම් සෞඛ්‍ය හා සනිපාරක්ෂක සේවා ,භෞතික සැලසුම්,පොදු උපයෝගිතා සේවා , කැළි කසළ කළමනාකරණය හා සුභ සාධන සේවා යනාදි සේවාවන් සපයනු ලැබේ.මෙම ප්‍රධාන ක්‍රියාකාරකම් වල ස්වභාවයෙන් කිසිදු වෙනසක් මෙම මූල්‍ය වර්ෂය තුලදී සිදු වී නොමැත.

### 2.පිළියෙල කිරීමේ පදනම

### 2.1.අනුකූල වීමේ ප්‍රකාශය

මූල්‍ය තත්ව ප්‍රකාශනය,මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය ,ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කොට ඇත්තේ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලවයි.

### 2.2.වාර්තා කරනු ලබන ඒකකය

නියමිත ආකෘති පත්‍රයන්ට අනුකූලව ගිණුම්කරණ ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ වගකීම ආයතනික කළමනාකරණය සතුවේ.

මූල්‍ය ප්‍රකාශන තුල පහත සඳහන් සංරචක අඩංගු වේ.

- සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය කාර්යයසාධනය පිළිබඳ තොරතුරු
- වර්ෂය අවසාන දිනට ආයතනයේ මූල්‍ය තත්වය පිළිබඳ තොරතුරු
- ආයතනයේ මුදල් හා මුදල් සමාන දෑ භාවිතය මත සංචලනය පිළිබඳ තොරතුරු

- සමාලෝචිත වර්ෂයේ ආයතනයේ සකන්ධ වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශය
- මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනත් සවිස්තරාත්මක තොරතුරු වල සාරාංශ සටහන්

## 2.3.මැනීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ ඓතිහාසික පදනම මතය.සංක්‍රාන්තියට පසු අත්පත්කර ගන්නා ලද සියලුම වත්කම් හා වගකීම් ඒවායේ පිරිවැය මත හඳුනා ගෙන ඇත.

## 2.4.ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්

මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කර ඇති අයිතමයන් මිනුම් කර ඇත්තේ ආයතනය මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන ආර්ථික පරිසරය තුල භාවිතා කරනු ලබන මූල්‍ය ඒකකයෙනි.එනම් ගිණුම් ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ හා ඉදිරිපත් කර ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.සාමාලෝචිත මූල්‍ය වර්ෂය තුලදී භාවිතා කර ඇති මෙම මුදල් ඒකකයේ වෙනසක් සිදු වී නොමැත.

## 2.5.අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්ම නොකඩවා පවත්වාගෙන යාමට සභාවේ හැකියාව පිළිබඳව කළමණාකාරිත්වය තක්සේරුවක් සිදු කර ඇති අතර එහි ක්‍රියාකාරකම දැකිය හැකි අනාගත කාලයක් සඳහා නොකඩවා පවත්වාගෙන යාමට සභාවට සම්පත් ඇති බවට සෑහිමකට පත්ව ඇත.

## 2.6.සංගතතාවය

සභාව විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව යොදාගෙන ඇති අතර, ඒවා පෙර වර්ෂයේ දී භාවිතා කරන ලද ගිණුම් ප්‍රතිපත්ති හා අනුරූප වේ. වඩාත් යෝග්‍ය ඉදිරිපත් කිරීම අරඹයා වර්ෂයේ ඉරිදිපත් කිරීම සමග අනුරූපවීමට අවශ්‍ය අවස්ථාවලදී සන්සන්දනාත්මක තොරතුරු නැවත වර්ගකර දක්වා ඇත.

## 2.7.ආදායම් වියදම් හිලව් කිරීම

සියලුම ආදායම් වියදම් වෙන් වෙන් වශයෙන් ගිණුම් තබා ඇති අතර කිසිදු ආදායමකට එරෙහිව වියදමක් හිලව් කිරීමක් සිදු කර නොමැත.

## 2.8.සියලු වත්කම් සහ වගකීම් හිලව් කිරීම

සියලුම වත්කම් හා වගකීම් වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කර ඇත.කිසිදු වගකීමකට එරෙහිව වත්කමක් හිලව් කර නොමැත.

## 2.9.වැටයීම

මූල්‍ය ප්‍රකාශන තුළ සඳහන් වටිනාකම් ආසන්න අගයට වැටයීම් නොමැත.එම වටිනාකම් රුපියල් ශත අගයන්ගෙන් ඉදිරිපත් කර ඇත.

## 3.ගිණුම් පිළිබඳ වැදගත් තීන්දු හා ඇස්තමේන්තු

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී, ගිණුම් ප්‍රතිපත්ති යොදා ගැනීමේ දී බලපාන හා වාර්තාගත වත්කම්,වගකීම්,ආදායම් හා වියදම් වලට බලපාන තීරණ ගැනීමට,ඇස්තමේන්තු

කිරීමට හා උපදෙස් වලට එළඹීමට සහාවට සිදුවේ. සත්‍ය ප්‍රතිඵල මෙකී ඇස්තමේන්තු වලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු හා යාවත්කාලීන උපකල්පන කාලීන පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ගිණුම් ඇස්තමේන්තුවල සංශෝධිත ඇස්තමේන්තු ද සංශෝධනය කෙරෙන කාලපරිච්ඡේදය තුළ අදාළ සංශෝධන අතීත කාල පරිච්ඡේදයට බලපාන්නේ නම් අතීත කාලපරිච්ඡේද වලට අදාළව ගිණුම්ගත කරනු ලැබේ.

## 3.1.දේපල පිරියත හා උපකරණ

දේපළ පිරියත හා උපකරණ යනු එක් වර්ෂයකට වඩා පරිහරණය කරන බවට අපේක්ෂිත සේවාකරණය හා පරිපාලන අවශ්‍යතා සඳහා දරණ ස්පර්ශ කල හැකි අයිතමයන්ය.
වත්කම් ලෙස හඳුනාගත් පිරිවැය හා උපකරණ අයිතිමයන් පිරිවැයට වාර්තා කර ඇත. වත්කම අත්පත් කරගැනීමට සෘජුවම දරණ ලද වියදම් පිරිවැයෙහි අන්තර්ගත වේ.

## 3.2.තොගය

තොග, පිරිවැය, හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට සටහන් කර ඇත. සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදි විකුණුම්, ඇස්තමේන්තු

ගත විකුණුම් මිලෙන් සම්පූර්ණ කිරිමේ ඇස්තමේන්තු ගත පිරිවැය සහ විකිණිම, හුවමාරු කිරිම හෝ බෙදා හැරිම සිදු කිරිමට අවශ්‍ය ඇස්තමේන්තු ගත පිරිවැයෙන් අඩු කරන ලද මුදල ශුද්ධ උපලබ්ධි අගය වේ.

එමෙන්ම මිලදී ගැනිමට අදාල සියළු පිරිවැය, පරිවර්ථන පිරිවැය සහ තොග ස්ථානයට හා තත්වයට ගෙන ඒමට දරන ලද අනෙකුත් පිරිවැය, තොගයේ පිරිවැය වේ. තොගයේ පිරිවැය ප්‍රථම ලැබිම් ප්‍රථම නිකුත් කිරිම් ක්‍රමය (FIFO) පදනම්ව ගණනය කරනු ලැබේ.

## 3.3.ලැබිය යුතු ශේෂයන්

ණයගැති හා ලැබිය යුතු ශේෂයන් ඒවා උපලබ්ධි වන අගයට තක්සේරු කරනු ලැබේ.

## 3.4.මුදල් හා මුදල් සමාන විෂයයන්

මුදල් හා මුදල් හා සමාන විෂයයන් යන්නට අතැති මුදල් ශේෂය, බැංකුවල ඇති ශේෂය ඇතුළත් වේ. ඒවා සුදුසු පරිදි මුහුණත වටිනාකම් අගය හෝ දළ අගය මත ගිණුම්ගත කරනු ලැබේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංකඃ 02 හි සඳහන් සෘජු පදනම මත පිළියෙළ කරනු ලැබේ

## 3.5.ජංගම වත්කම්

මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි / ශේෂ පත්‍රයෙහි ජංගම වගකීම් ලෙස වර්ගකර ඇති අතර, වාර්තාකරණ දිනයෙන් පසු මාස 12 ක් ඇතුළත දී නිරවුල් කිරීමට නියමිත වගකීම් වේ. මෙම වගකීම් අදාළ නිරවුල් සිදුකරන අවස්ථාවේ උපලබ්ධි වුවා සේ සලකනු ලබන මුදල් අගයට සටහන් කරනු ලැබේ.

### 3.6.උපචිතයන් සහ වෙනත් ණයහිමියෝ

අතීත සිදුවීමක් ප්‍රතිඵලයක් ලෙස සභාවට වර්තමානයේ බැදීමක් (නෛතික හෝ සම්ප්‍රයුක්ත) ඇති විට හා එම බැදීම පියවීම පිණිස ආර්ථික ප්‍රතිලාභයක් වූ සම්පත් පිටතටගලා යා හැකි අවස්ථාවක ඒ වෙනුවෙන් ප්‍රතිපාදන සැලසේ.

### 3.7.ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් සියල්ල සලකා බලා අවශ්‍ය විටෙක මූල්‍ය ප්‍රකාශයන්හි සුදුසු ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ. ශේෂ පත්‍ර දිනට පසු ගිණුම්වල ගැලපීම් කළයුතු හෝ හෙළිදරව් කළයුතු කිසිවක් පැනනැඟී නොමැත.

### 3.8.බැදීම් හා අසම්භාව්‍යයන්

වෙනත් වගකීම් වල ප්‍රමාණය නිර්ණය කිරීමේ දී සියළුම හඳුනාගත හැකි අවදානම් සැලකිල්ලට ගනු ලැබේ

**සටහන් අංක - 02**

| ජංගම නොවන වත්කම් | 2023/12/31 | 2022/12/31 |
|---|---:|---:|
| ඉඩම් හා ගොඩනැඟිලි | 1,295,274,450.00 | 1,295,274,450.00 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 19,052,915.88 | 17,528,385.88 |
| මෝටර් රථ හා කරත්ත | 33,734,599.00 | 33,076,299.00 |
| ලී බඩු හා සවි කිරීම් | 13,203,168.12 | 5,259,387.40 |
| පුස්තකාල පොත් | 8,256,363.66 | 7,297,512.55 |
| කාර්යාල උපකරණ | 6,114,110.00 | 3,369,460.40 |
| | **1,375,635,606.66** | **1,361,805,495.23** |

**සටහන් අංක - 03**

| අතැති තොග | 2023/12/31 | 2022/12/31 |
|---|---:|---:|
| පොදු ගබඩාව | 1,529,177.06 | 1,634,675.37 |
| විදුලි ගබඩාව | 576,890.00 | 153,750.00 |
| කර්මාන්ත තොග | 23,200.00 | 21,700.00 |
| ආයුර්වේද තොග | 143,782.48 | 176,497.43 |
| කොම්පොස්ට් පොහොර තොග | 120,780.00 | 8,130.00 |
| | **2,393,829.54** | **1,994,752.80** |

**සටහන් අංක - 04**

| අයකර ගත හැකි උපයෝගී සේවා | 2023/12/31 | 2022/12/31 |
|---|---|---|
| අඟරු චෙක්පත් | - | 149,360.00 |
| | - | 149,360.00 |

**සටහන් අංක - 05**

| ආදායම් ණය ගැතියෝ | 2023/12/31 | 2022/12/31 |
|---|---|---|
| | | |
| හිඟ හිටි වරිපනම් | 1,848,514.00 | 1,880,008.44 |
| හිඟ හිටි වෙනත් ආදායම් (සටහන් 01) | 12,006,138.17 | 67,597,342.94 |
| | **13,854,652.17** | **69,477,351.38** |

**සටහන් අංක - 06**

| පෙර ගෙවුම් | 2023/12/31 | 2022/12/31 |
|---|---|---|
| | | |
| විවිධ අත්තිකාරම් | 0.00 | 50,250.00 |
| | **0.00** | **50,250.00** |

**සටහන් අංක - 07**

| ආයෝජන | 2023/12/31 | 2022/12/31 |
|---|---|---|
| | | |
| සභාවේ මුදල් - ස්ථාවර තැන්පත් | 9,544,703.69 | 25,508,018.91 |
| සේවක ඇප තැන්පත් ආයෝජන | 109,978.48 | 85,773.18 |
| ඇප තැන්පත් - ඉන්ධන පිරවුම්හල | 200,000.00 | 200,000.00 |
| ඇප තැන්පත් - තක්සේරු දෙපාර්තමේන්තුව | 10,000.00 | - |
| | **9,864,682.17** | **25,793,792.09** |

**සටහන් අංක - 08**

| මුදල් | 2023/12/31 | 2022/12/31 |
|---|---|---|
| | | |
| ලංකා බැංකුවේ ජංගම ගිණුම - 2223101 | 30,837,856.65 | 8,675,463.67 |
| ලංකා බැංකුවේ ජංගම ගිණුම - 2223102 | 480,823.57 | 773,382.45 |
| ලංකා බැංකුවේ ජංගම ගිණුම - 2223105 | 1,032,747.91 | 681,731.94 |
| ලංකා බැංකුවේ ජංගම ගිණුම - 2223106 | 43,088.08 | 43,088.08 |
| | **32,394,516.21** | **10,173,666.14** |

## සටහන් අංක - 09

| ණය හිමියෝ | 2023/12/31 | 2022/12/31 |
|---|---|---|
| වියදම් ණය හිමියෝ | 1,549,712.02 | 1,171,641.29 |
| පොදු සැපයුම් ණය හිමියෝ | 770,647.50 | 1,707,367.26 |
| කර්මාන්ත ණය හිමියෝ | 6,717,693.24 | 10,765,840.47 |
| නොගෙවූ වැටුප් හා වේතන | 1,212,790.62 | 1,746,332.41 |
| ගෙවිය යුතු ශේෂ (සටහන් 02) | 802,200.25 | 2,926,356.79 |
| | **11,053,043.63** | **18,317,538.22** |

## සටහන් අංක - 10

| කලින් ලැබීම් | 2023/12/31 | 2022/12/31 |
|---|---|---|
| කලින් ලද ආදායම් | 2,759,496.59 | 2,650,308.14 |
| | **2,759,496.59** | **2,650,308.14** |

## සටහන් අංක - 11

| ආපසු ගෙවිය යුතු තැන්පත් | 2023/12/31 | 2022/12/31 |
|---|---|---|
| සේවක ඇප තැන්පත් | 109,978.48 | 96,778.42 |
| මිශ්‍ර තැන්පත් | 373,366.73 | 782,365.74 |
| ටෙන්ඩර්/ගිවිසුම් ඇප තැන්පත් | 4,673,207.18 | 4,067,161.89 |
| | **5,156,552.39** | **4,946,306.05** |

## සටහන් අංක - 12

| සම්මුචිත අරමුදල හා සංචිත | 2023/12/31 | 2022/12/31 |
|---|---|---|
| සම්මුචිත අරමුදල හා ඌණතා ගිණුම | 45,247,608.07 | 81,728,129.88 |
| ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම | 976,406,855.30 | 963,658,111.46 |
| ප්‍රාග්ධන යෙදුමට ආධාර මඟින් දායක වීමේ ගිණුම | 399,228,751.36 | 398,147,383.77 |
| ගිණුම් අතර මුදල් මාරු කිරීම | (158,225.10) | (235,897.24) |
| | **1,420,724,989.63** | **1,443,297,727.87** |

මුල්‍ය ප්‍රකාශ සඳහා විස්තරාත්මක සටහන්

2023/12/31 දිනෙන් අවසන් වර්ෂයේ

**සටහන් අංක - 01**

| ලැබිය යුතු ශේෂ | 2023/12/31 |
|---|---|
| අක්කර බදු | 1,650,445.23 |
| ආයෝජන පොලී | 548,170.47 |
| කසල බදු | 962.00 |
| මාකට් කඩ කුළී | 2,461,677.16 |
| මාකට් කඩ කුළී දඩ මුදල් | 209,243.25 |
| සති පොළ බදු පාලන ගිණුම | 176,250.00 |
| මස් මාළු කඩ කුළී | 2,843,075.87 |
| මස් මාළු කඩ කුළී දඩ මුදල් | 88,929.49 |
| කඩ කාමර කුළී | 34,953.00 |
| කඩ කාමර කුළී දඩ මුදල් | 3,234.00 |
| සතිපොළ කඩ කාමර කුළී පාලන ගිණුම | 5,500.00 |
| හෙළ බොජුන්හල ආදායම් පාලන ගිණුම | 60,000.00 |
| කර්මාන්ත ණයගැතියෝ | 3,762,721.42 |
| යන්ත්‍රෝපකරණ කුලී පාලන ගිණුම | 149,360.00 |
| ලැබිය යුතු වරෙන්තු ගාස්තු ගිණුම | 11,616.28 |
| | **12,006,138.17** |

**සටහන් අංක - 02**

| ගෙවිය යුතු ශේෂ | 2023/12/31 |
|---|---|
| ගෙවිය යුතු මුද්දර බදු | 802,200.25 |
| | **802,200.25** |

## පුනරාවර්තන ආදායමේ සංයුතිය

| | විස්තරය | පොදු පරිපාලන | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි | වෙනත් උපයෝගී සේවා | සුභ සාධක සේවා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | **පුනරාවර්තන ආදායම්** | | | | | | |
| 10 | වරිපනම් බදු | 3,153,628.50 | 1,008,000.00 | - | - | 208,990.00 | **4,370,618.50** |
| 20 | කුළී | - | 169,500.00 | 4,431,844.50 | 10,267,551.46 | - | **14,868,895.96** |
| 30 | බලපත්‍ර ගාස්තු | 146,860.50 | 1,037,250.00 | - | - | - | **1,184,110.50** |
| 40 | සේවා සඳහා ගාස්තු | 191,011.06 | 380,798.31 | 1,930,116.61 | 2,995,998.61 | 161,555.00 | **5,659,479.59** |
| 50 | වරෙන්තු ගාස්තු හා දඩ | 6,207,165.10 | 1,200.00 | 575,888.00 | 2,388.58 | 65,037.53 | **6,851,679.21** |
| 60 | වෙනත් ආදායම් | 29,714,254.72 | 298,360.00 | 209,004.00 | 14,750.00 | - | **30,236,368.72** |
| 70 | ආදායම් ආධාර | 26,537,496.47 | 4,849,169.55 | 8,563,310.08 | 2,027,339.53 | 3,576,920.00 | **45,554,235.63** |
| | **පුනරාවර්තන ආදායම් එකතුව** | **65,950,416.35** | **7,744,277.86** | **15,710,163.19** | **15,308,028.18** | **4,012,502.53** | **108,725,388.11** |

## පුනරාවර්තන වියදමේ සංයුතිය

| විස්තරය | | පොදු පරිපාලන | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි | වෙනත් උපයෝගී සේවා | සුභ සාධක සේවා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | | | | | | |
| 01 | වැටුප් හා දීමනා | 30,066,733.01 | 10,784,194.78 | 10,186,191.73 | 2,206,145.52 | 4,388,658.75 | **57,631,923.79** |
| 02 | ගමන් වියදම් | 815,832.40 | 5,544.00 | 224,900.00 | - | - | **1,046,276.40** |
| 03 | සැපයුම් හා උපකරණ | 5,166,414.53 | 5,158,705.09 | 1,613,250.50 | 1,979,020.75 | 483,634.00 | **14,401,024.87** |
| 04 | ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු | 3,689,174.93 | 1,752,020.00 | 2,638,461.25 | 2,587,940.50 | 22,690.00 | **10,690,286.68** |
| 05 | ප්‍රවාහන සම්බන්ධතා, ආවශ්‍යක හා වෙනත් සේවා | 4,957,309.84 | 641,258.18 | 23,770.22 | 1,519,259.65 | 412,349.05 | **7,553,946.94** |
| 06 | පොළී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | - | - | 436,068.57 | 225,000.00 | - | **661,068.57** |
| 07 | ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 331,338.09 | 15,000.00 | 12,000.63 | 10,700.00 | - | **369,038.72** |
| 08 | විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 177,201.00 | 357,038.00 | 60,488.00 | - | 50,714.00 | **645,441.00** |
| පුනරාවර්තන වියදම් එකතුව | | **45,204,003.80** | **18,713,760.05** | **15,195,130.90** | **8,528,066.42** | **5,358,045.80** | **92,999,006.97** |

# 2023 වර්ෂයේ ලැබීම් සංයුතිය

| | අය විෂය නාමයන් | පොදු පරිපාලන | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි | වෙනත් උපයෝගී සේවා | සුභ සාධක සේවා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | | **1** | **2** | **3** | **5** | **6** | **7** |
| | | **රු. ශත** | **රු. ශත** | **රු. ශත** | **රු. ශත** | **රු. ශත** | **රු. ශත** |
| 10 | වරිපනම් හා බදු | 3,784,481.41 | 949,000.00 | - | - | 208,990.00 | **4,942,471.41** |
| 20 | කුලී | - | 169,500.00 | 3,304,824.50 | 11,510,149.09 | - | **14,984,473.59** |
| 30 | බලපත්‍ර ගාස්තු | 146,860.50 | 999,250.00 | - | - | - | **1,146,110.50** |
| 40 | සේවා සඳහා ගාස්තු | 191,011.06 | 380,798.31 | 1,930,116.61 | 2,995,998.61 | 161,555.00 | **5,659,479.59** |
| 50 | වරෙන්තු ගාස්තු | 6,121,159.00 | 1,200.00 | 557,923.00 | 2,388.58 | 53,421.25 | **6,736,091.83** |
| 60 | වෙනත් ආදායම් | 29,370,380.56 | 185,710.00 | 209,004.00 | 14,750.00 | - | **29,779,844.56** |
| 70 | වෙනත් ආධාර | 26,537,496.47 | 4,749,169.55 | 8,563,310.08 | 2,027,339.53 | 3,576,920.00 | **45,454,235.63** |
| | **පුනරාවර්තන ආදායම් එකතුව** | **66,151,389.00** | **7,434,627.86** | **14,565,178.19** | **16,550,625.81** | **4,000,886.25** | **108,702,707.11** |
| | **ප්‍රාග්ධන ආධාර** | | | | | | |
| 80 | මූලධන ලැබීම් | 84,212.00 | 15,200.00 | 3,629,596.01 | - | - | **3,729,008.01** |
| | **එකතුව** | **84,212.00** | **15,200.00** | **3,629,596.01** | **-** | **-** | **3,729,008.01** |
| | **(1) පුනරාවර්තන හා ප්‍රාග්ධන ආදායම් වල මුළු එකතුව** | **66,235,601.00** | **7,449,827.86** | **18,194,774.20** | **16,550,625.81** | **4,000,886.25** | **112,431,715.12** |
| | සේවක ණය | - | - | - | - | - | **4,161,399.97** |
| | මිශ්‍ර තැන්පත් | - | - | - | - | - | **1,605,370.70** |
| | අත්තිකාරම් | - | - | - | - | - | **741,731.47** |
| | මුද්දර බදු තැන්පත් | - | - | - | - | - | **287,934.79** |
| | ගිවිසුම් ඇප තැන්පත් | - | - | - | - | - | **3,249,749.99** |
| | ගිණුම් අතර මුදල් මාරු කිරීම | - | - | - | - | - | **2,200,000.00** |
| | ටෙන්ඩර් තැන්පත් | - | - | - | - | - | **195,000.00** |
| | විවිධ ණය ගැතියෝ (වැ.ප්‍ර) | - | - | - | - | - | **3,960,809.50** |
| | ස්ථාවර තැන්පත් නිදහස් කිරීම | - | - | - | - | - | **21,000,000.00** |
| | විවිධ ණය ගැතියෝ (කර්මාන්ත) | - | - | - | - | - | **7,039,392.71** |
| | සමුච්චිත අරමුදල | | | | | | **1,000.00** |
| | **(2) වෙනත් ලැබීම් එකතුව** | - | - | - | - | - | **44,442,389.13** |
| | **(1 +2) මුළු එකතුව (3)** | **66,235,601.00** | **7,449,827.86** | **18,194,774.20** | **16,550,625.81** | **4,000,886.25** | **156,874,104.25** |

# 2023 වර්ෂයේ වියදම් සංයුතිය

| | අය විෂය නාමයන් | පොදු පරිපාලන | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි | වෙනත් උපයෝගී සේවා | සුභ සාධක සේවා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 5 | 6 | 7 |
| | | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 1 | වැටුප් හා දීමනා | 29,735,994.00 | 10,258,938.34 | 10,048,426.94 | 2,206,145.52 | 4,314,724.37 | **56,564,229.17** |
| 2 | ගමන් වියදම් | 745,532.40 | 5,544.00 | 212,500.00 | - | - | **963,576.40** |
| 3 | සැපයුම් හා උපකරණ | 5,063,935.73 | 4,927,237.64 | 1,611,174.50 | 1,961,778.25 | 422,004.00 | **13,986,130.12** |
| 4 | ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 3,701,105.43 | 1,704,920.00 | 2,638,461.25 | 2,369,780.50 | 22,690.00 | **10,436,957.18** |
| 5 | ප්‍රවාහන සම්බන්ධතා හා අවශ්‍යක සේවා | 3,846,545.86 | 743,080.50 | 22,387.00 | 996,410.97 | 349,873.08 | **5,958,297.41** |
| 6 | පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | - | - | 436,068.57 | 225,000.00 | - | **661,068.57** |
| 7 | ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 119,075.00 | 10,000.00 | 12,000.63 | 700.00 | - | **141,775.63** |
| 8 | විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ | 162,496.00 | 326,578.00 | 56,076.00 | - | 50,714.00 | **595,864.00** |
| | පුනරාවර්තන වැය එකතුව | **43,374,684.42** | **17,976,298.48** | **15,037,094.89** | **7,759,815.24** | **5,160,005.45** | **89,307,898.48** |
| | **ප්‍රාග්ධන වියදම්** | | | | | | |
| 9 | ප්‍රාග්ධන වැය | 865,718.50 | 322,222.85 | 7,869,196.63 | 154,950.00 | 1,025,124.07 | **10,237,212.05** |
| 10 | ණය ආපසු ගෙවීම් | - | - | 1,437,567.15 | - | - | **1,437,567.15** |
| | **ප්‍රාග්ධන වැය එකතුව** | **865,718.50** | **322,222.85** | **9,306,763.78** | **154,950.00** | **1,025,124.07** | **11,674,779.20** |
| | **(1) පුනරාවර්තන වැය හා ප්‍රාග්ධන වැය වල මුළු එකතුව** | **44,240,402.92** | **18,298,521.33** | **24,343,858.67** | **7,914,765.24** | **6,185,129.52** | **100,982,677.68** |
| | සේවක ණය | | | | | | **6,010,384.00** |
| | තැන්පත් | | | | | | **5,192,333.27** |
| | විවිධ ණයහිමියෝ | | | | | | **12,292,789.97** |
| | මුද්දර බදු තැන්පත් | | | | | | **281,137.79** |
| | අත්තිකාරම් | | | | | | **693,931.47** |
| | ගිණුම් අතර මුදල් මාරු කිරීම | | | | | | **2,200,000.00** |
| | ස්ථාවර තැන්පත් ආයෝජන | | | | | | **7,000,000.00** |
| | **(2) වෙනත් ගෙවීම් එකතුව** | **-** | **-** | **-** | **-** | **-** | **33,670,576.50** |
| | **(1 +2) මුළු එකතුව (3)** | **44,240,402.92** | **18,298,521.33** | **24,343,858.67** | **7,914,765.24** | **6,185,129.52** | **134,653,254.18** |

## ලැබිය යුතු වරිපනම් ආදායමෙහි සංයුතිය




| කාලය | මුදල (රු.) |
|---|---|
| වර්ෂයට වඩා අඩු | 585,956.00 |
| වර්ෂයට වඩා වැඩි | 1,262,577.00 |

## ලැබිය යුතු කුලී ආදායම් කාල විශ්ලේෂණය




## ලැබිය යුතු අක්කර බදු කාල විශ්ලේෂණය




| | |
|---|---|
| වසර 0-1 | 40,788 |
| වසර 1-2 | 79,939 |
| වසර 2-3 | 94,675 |
| වසර 4-5 | 95,253 |
| වසර 5 ට වැඩි | 12,1187 |

## නිරවුල් කල යුතු ටෙන්ඩර් ඇප හා මිශ්‍ර තැන්පත් සංයුතිය




## ඉඩම් ගොඩනැගිලි වටිනාකමෙහි සංයුතිය



715,636,000.00



283,220,450.00



4,048,000.00



1,295,274,450.00

## ණය හිමි සාරාංශය

| සාරාංශය | | රු. |
|---|---|---|
| 01 | නොගෙවු වැටුප් හා වේතන | 1,212,790.62 |
| 02 | වියදම් ණය හිමියෝ | 1,549,712.02 |
| 03 | පොදු සැපයුම් ණය හිමියෝ | 770,647.50 |
| 04 | කර්මාන්ත ණය හිමියෝ | 6,717,693.24 |
| | එකතුව | **10,250,843.38** |



## සේවක ණය උප ලේඛනය

| | |
|---|---|
| ආපදා ණය | 9,563,152.03 |
| විශේෂ අත්තිකාරම් | 6,000.00 |
| උත්සව අත්තිකාරම් | 37,500.00 |

## කලින් ලැබීමේ ගිණුමේ විශ්ලේෂණය

| අනු අංකය | ගිණුමේ නම | මුදල |
|---|---|---|
| **01** | වරිපනම් බදු ( 1-11 ) | **1,435,039.58** |
| **02** | අක්කර බදු ( 1-12 ) | **86,736.58** |
| **03** | ව්‍යාපාර බදු (2-16 ) | **6,000.00** |
| **04** | කර්මාන්ත බදු ( 2-31 ) | **1,000.00** |
| **06** | මාකට් කඩ කුලී ( 3-22) | **1,228,520.43** |
| **07** | සතිපොළ කඩ කාමර කුලී පාලන ගිණුම (5-22) | **2,200.00** |
| | | **2,759,496.59** |